# අයවැය කථාව
# 2006

´ {ù÷ Ø$í ûæÂ

í ù$½ûõ &{ ´÷Ù {$æ´&Èû$÷ù à´$õ]

<ÌÂ 2005 æ< µ÷&`ÈýÌ ´&8 <`ù ý{&ûõù÷$

අයවැය කථාව - 2006

ගරු කථානායකතුමනි,

01. මෙම ගරු සභාවට 2006 වසර සඳහා වන අයවැය යෝජනාවලියක් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවේ ඒ වන විට සිටි මුදල් අමාත්‍යවරයා විසින් පසුගිය නොවැම්බර් 08 වැනි දා ඉදිරිපත් කරනු ලැබුවා. මගේ රජය විසින් ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති යෝජනා රාශියක් එම අයවැය කථාවේ ඇතුළත් වූවා. මේ අතර මගේ සය අවුරුදු නිල කාලය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන යෝජනා ඇතුලත් මහින්ද චින්තන නම් වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ලැබුණු ජන වරම හේතු කොට ගෙන, මුළුමනින්ම එහි සඳහන් දර්ශනය හා ප්‍රතිපත්තිය මත පදනම් වූ නව අයවැයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මා අවබෝධ කර ගත්තා. ඒ අනුව මෙම අයවැය යෝජනාවලිය මා මෙම ගරු සභාව හමුවේ ඉදිරිපත් කරනවා. මවිසින් මෙම ගරු සභාවට පසුගිය නොවැම්බර් මස 25 වනදා පැහැදිලි කළ පරිදි ඉදිරි සය වසර තුල අප රටේ සංවර්ධන ක්‍රියාදාමයේ පදනම බවට පත්වෙනු ඇත්තේ මගේ ප්‍රතිපත්ති ප්‍රකාශයයි. එනිසා මමත් මගේ රජයත් තනිතනිව මෙන්ම සාමූහිකවද මෙම සංවර්ධන වැඩ සටහන නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින බව අවධාරණය කල යුතුයි.

02. අවුරුදු 37 කට වඩා වැඩි මගේ දේශපාලන ජීවිතයේදී මා සමග ළඟින් ඇසුරු කළ මිතුරන් හා දහස් ගණනක් වන මගේ සහෝදර රටවැසියන් සේම මගේ ජයග්‍රහණයට උරදුන් සහෝදර දේශපාලන පක්ෂවල අදහස් හා යෝජනා මගේ ඉදිරි දැක්මට පදනම් වූ බව "මහින්ද චින්තනය" මැයෙන් වූ මගේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දැක්වුනු අවස්ථාවේ මා රටට ප්‍රකාශ කලා. පසුගිය වසරවල සංවර්ධන උපාය මාර්ග සැළසුම් කළ අය විසින් ඉටු කළ කාර්යභාරය අවතක්සේරු කරන බවක් මෙයින් මම අදහස් කරන්නේ නැහැ. එකී සංවර්ධන උපාය මාර්ගයන්හී ඇතුළත් වූ සාධනීය කරුණු මෙන්ම පුළුල් උපදේශාත්මක ක්‍රියාමාර්ග තුළින් ප්‍රතිපත්ති සැකසීමද මම අගය කරනවා. ගරු කථානායකතුමනි, ඒනිසා රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේදී ඊට අදාල විෂයයන් පිළිබඳව අවබෝධයක් ඇති අයගෙන් උපදෙස් ලබාගැනීම අප අගය කොට සැලකිය යුතුයි. මේ අනුව ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් 2004 දි මේ සඳහාම පිහිටුවන ලද ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික සභාව අතිශයින්ම වැදගත් දායකත්වයක් සපයනු ලැබුවා. එසේම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට සාමාන්‍ය මහජනතාව, පෞද්ගලික අංශයේ විවිධ සංවිධාන, වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ නියෝජිතයන්, අදාල අමාත්‍යවරුන් හා නිලධාරීන්ගෙන් ලැබෙන යෝජනා අයවැය පිළියෙල කිරීමේදී ඉමහත් පිටුවහලක් වී තිබෙනවා. එනිසා පොදු ජනතාවගේ අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම උදෙසා එක්රැස් කරගත් සියළු යෝජනාවන් පිළිබිඹු වන ආකාරයේ මූල්‍ය රාමුවක් තුල අයවැය සකස් කළ යුතු බවට මගේ රජය අවධාරණය කළ බැවින් 2006 වසර වෙනුවෙන් අලුතින් සකස් කළ එම අයවැය ලේඛනය මෙම ගරු සභාවට අදදින මම ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

03. ගරු කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් පසුගිය වසරේ ඉදිරිපත් කරනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තීන් තවදුරටත් ශක්තිමත් කොට ඉන් ඔබ්බට ගෙනයාම මගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ආර්ථික දර්ශනයයි. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සුසංයෝගයෙන් වෙළඳපොළ හිතකාමීව, අපගේ ජාතික ආර්ථිකය නගාසිටුවීම එහි අරමුණ බව මා පවසන්නේ මහත් වූ වගකීමක් ඇතිවයි. මෙම වැඩපිළිවෙල තුළින් රට ඉදිරියට යාම වෙනුවට ආපස්සට යාමක් සිදුවෙතැයි නුවා දක්වමින් ජනතාව බිය වැද්දීමට ආර්ථික විශේෂඥයන් යැයි කියා ගන්නා ඇතැම් අය උත්සාහ දැරූ

බව මා දන්නවා. ඒ වාගේම මර්සින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තීන් ද විශාල අයවැය හිඟයකට හා විශාල උද්ධමනයකට මග පාදන බවද ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලැබුවා. එසේම රට දියුණු කිරීමට ඇති එකම මාර්ගය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති පමණක් බව යැයි ද දේශනා කළා. ගරු කථානායකතුමනි, සිය දේශීය චින්තනයන් තුලින්ම බිහිකරන ලද ප්‍රතිපත්තීන් යොදා ගනිමින් නිරන්තරයෙන් ආර්ථික ප්‍රතිපත්තීන් මුවහත් කර ගනිමින් ආර්ථික සමෘද්ධිය කරා පියනගන බොහෝ රටවල් අප විසින් ආදර්ශයට ගත යුතුයි. ඉන්දියාව, තායිලන්තය, වියට්නාමය වැනි රටවල් දැනටමත් දිළිඳු හිතවාදී ආර්ථික වර්ධනය කෙරේ පෙරට වඩා පුළුල් අයුරින් අවධානය යොමු කර තිබෙනවා. මෙම රටවල් අර්ථවත් සංවර්ධනයක් තුළ ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගෙන තිබීම එම ප්‍රතිපත්තිවල සාර්ථකත්වයට කදිම සාක්ෂියකි. අපේ රට එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ මේ වනවිට සියයට 6 කට ආසන්න ආර්ථික වර්ධනයක් ලඟාකර ගෙන තිබෙනවා. එසේම වර්තමාන වාර්ෂික උද්ධමන වේගය සියයට 9 දක්වා පහත වැටී ඇති බව අළුත්ම සංඛ්‍යාලේඛන මගින් තහවුරු වී තිබීම පිළිබඳව මම බොහෝ සතුටු වෙනවා.

04. අප රටේ දිළිඳුභාවය කාලාන්තරයක් තිස්සේ ඉහළ මට්ටමක පවතින බව ඔබට රහසක් නොවේ. නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වූ පසුගිය කාලය තුළදී ආර්ථික වර්ධනයේ සාමාන්‍ය සියයට 5 ක් වශයෙන් සනිටුහන් කළද එය මූලික වශයෙන් කොළඹ නගරය කේන්ද්‍ර කොට ගත්තක් වුනා. සමහර පළාත්වල මොනයම් සංවර්ධනයක්වත් නැති තරම්. රටේ ළමුන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් බොහෝ උදරාබාධ රෝගයන්ගෙන් පෙළෙනවා. රටේ දිළිඳු ජනගහනයෙන් සියයට 30 ක් වතුකරයේ වන අතර සියයට 25 ක් ග්‍රාමීය අංශයේ සිටිනවා. මුළු ජනගහනයෙන් සියයට 50 ක් පර්පාලන දිස්ත්‍රික්ක දොලහක එනම් මාතලේ, ගාල්ල, මාතර, හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල දිළිඳු භාවය ජාතික මට්ටමටත් වඩා ඉහල අගයක පැවතීම විශ්මයට වගේම කණගාටුවට ද කරුණක්. උතුර සහ නැගෙනහිර දිස්ත්‍රික්කවල මේ තත්ත්වය මීට සමාන අසතුටුදායක තත්ත්වයක හෝ ඊටත් වඩා අන්ත තත්ත්වයක පවතිනවා. ස්වභාවික හෝ මිනිසා විසින් ඇති කරනු ලැබූ විපත් හේතු කොට ගෙන පන් ලක්ෂයක පමණ ජනතාව තාවකාලික නිවාසයන්හි ගත කරනවා. නාගරික සංවර්ධනය පිළිබඳව සලකා බැලීමේදී නගර කිහිපයක හැර වතුකරයේ, උතුරු සහ නැගෙනහිර පළාත්වල සහ අනෙකුත් පලාත්හි දිස්ත්‍රික්ක කිහිපයකත් නාගරික සංවර්ධන කටයුතු පසුගාමී තත්ත්වයක පවතිනවා. එවැනි සමාජ ආර්ථික තත්ත්වයක් තුල කිසිම නායකයෙකුට ඇස් කන් වහා සිටිය නොහැකියි. එම නිසා අසාර්ථක වූ නව ලිබරල්වාදී ප්‍රතිපත්තීන් පවත්වාගෙන යාමට ඉපැරණි වීණාවන් වාදනය කරනවාට වඩා අළුත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම යනුවෙන් පෙරට යාම පිළිබඳව කිසිම වරදක් ඇතැයි මම සිතන්නේ නැහැ. ඉදිරි සය වසර තුල ජනතාවට ආර්ථික අවස්ථාවන් බිහිකර දෙමින් දිළිඳුකම තුරන් කරලීමට හා ආර්ථික පුනරුදයක් ඇති කිරීමට අප ගන්නා උත්සාහය නිවැරදි බව ඔබ සියලුදෙනා නුදුරේදීම අවබෝධ කරගනු ඇති. ගරු කථානායකතුමනි, අති මහත් වියදමක් දරා ගෙන ගිය විශාල මැතිවරණ ව්‍යාපාරයකට පවා එරෙහිව යමින් ජනතාව අපගේ ප්‍රතිපත්තිය පිළිගත්තේ ඒ නිසා බව මට සැකයක් නැහැ. එබැවින් එය අප විසින් දැඩි කැපවීමකින් යථාර්ථයක් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි

05. ගරු කථානායකතුමනි, දිළිඳුකම සහ සාගින්න තුරන් කිරීම, සෑම දරුවකුටම අධ්‍යාපනය ලබාදීම තහවුරු කිරීම, කාන්තාවන් සවිබල ගැන්වීම, ප්‍රාථමික හා ද්විතීයන අධ්‍යාපනයේදී ස්ත්‍රී-පුරුෂ භාවය අනුව සිදුවන විෂමතා ඉවත් කරලීම, ළදරු මරණ අනුපාතය අවම කිරීම, මාතෘ සෞඛ්‍යය ඉහළ නැංවීම, ඒඩ්ස්, මැලේරියා සහ අනෙකුත් රෝගවලට එරෙහිව කටයුතු කිරීම, තිරසාර ලෙස පරිසරය සංරක්ෂණය කිරීම, ආර්ථික වර්ධනය සඳහා ජාත්‍යන්තර එකමුතු භාවයකින් කටයුතු කිරීම වැනි එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇති සහශ්‍ර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට මේ දශකයේ දී එක් එක් ජාතීන් කැපවී සිටීම බලාපොරොත්තු ඉහළ නංවන කරුණක්. මේ නිසා ඉදිරි සය වසර නිල කාලය ඉක්මයාමට පෙර ජාතියක් වශයෙන් අප විසින් එකී අරමුණු දිනාගැනීම තුලින් අපගේ සියළු ප්‍රදේශවල වේගවත් හා සමබර සංවර්ධනයක් ඇති කිරීමට අප කැපවිය යුතුව තිබෙනවා.

06. ගරු කථානායකතුමනි, ජාතික ආර්ථිකය නගාසිටුවීම පිණිස විවිධාකාර වූ අදහස් ප්‍රකාශ වෙමින් පවතිනවා. එහෙයින් උදාවන අළුත් වසරේ මුල් හය මාසය තුළ කෘෂිකර්මාන්තය, පශු සම්පත්, ධීවර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, වැවිලි, කර්මාන්ත, සංචාරක, බැංකු කටයුතු, යටිතල පහසුකම්, ග්‍රාමීය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිපුණතා සංවර්ධනය, දිළිඳුකම තුරන් කිරීම, යහ පාලනය සහ විදේශ ආයෝජන ප්‍රවර්ධනය කරන ජාතික සංවර්ධන උපාය මාර්ගික කාල පරිච්ඡේදයක් වනු ඇති. මේ ජාතික සංවර්ධන උපාය මාර්ගය කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් දැක්වෙනු ඇති. මේ සඳහා මම අපගේ විරුද්ධ පක්ෂයට, වෘත්තීයවේදීන්ට, වෘත්තීය සමිතිවලට, පෞද්ගලික අංශයට, සිවිල් සමාජයට හා ආර්ථික වර්ධන ක්‍රියාවලියට දායක වන අනෙකුත් කොටස්වලට මෙම වැදගත් කර්තව්‍යයට සහභාගී වන මෙන් මා ඉල්ලා සිටින්නේ නිතර නිතර සංවර්ධන උපාය මාර්ග වෙනස් කිරීම එමගින් වලක්වා ගත හැකි බැවිනුයි.

**අළුත් ශ්‍රී ලංකාවක් කරා...**

07. ගරු කථානායකතුමනි, අභියෝගයන්ට මුහුණදෙමින් දේශීය ආර්ථිකය පෝෂණය කිරීමට ජාතියක් වශයෙන් සාමූහිකව කටයුතු කිරීමේ කැපවීම මෙම වර්ෂයේ සියයට හයකට ආසන්න ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට හේතුවී ඇත. අපනයන මෙන්ම විදේශ ප්‍රේෂණයන් ද සියයට 12 කින් ඉහල ගොස් තිබෙනවා. 2005 ඔක්තෝබර් වන විට විදේශ නිල සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 3.8 දක්වා ඉහළ ගොස් තිබුණා. සුනාමි ව්‍යවසනය සහ අධික බණිජ තෙල් වියදමෙහි වූ අහිතකර බලපෑම තුල වුවද සමස්ත රාජ්‍ය ආදායම සියයට 20 කින් වැඩිවීම මගින් අයවැය හිඟය මේ වසරේදී සියයට 8 කට සීමාකර ගත හැකිවේවි. ජනවාරි මාසයේ සියයට 16 ක් වූ උද්ධමනය නොවැම්බර් මාසයේදී සියයට 9 ක් දක්වා අඩුවී තිබෙන බව දැනටමත් ඔබ දන්නවා. ගරු කථානායකතුමනි, එක් එක් රටවල් මූල්‍ය ශක්තිය අනුව ශ්‍රේණිගත කරන ජාත්‍යන්තර ආයතන දෙකක් වන ෆිච් (FITCH) හා ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (Standard ස Poors) ආයතන විසින් පිළිවෙලින් BB සෘණ හා B ධන මට්ටම් ශ්‍රේණිගත කිරීමක් ශ්‍රී ලංකාවට මුල් වරට ලබාදී තිබීම අප දිරිමත් කරන කරුණක්. මේ තත්ත්වය විශ්ව ශ්‍රේණිගත කිරීම් අතර අපට ගෞරවනීය ආරම්භයකි. නුදුරු අනාගතයේදී මෙම ධනාත්මක ප්‍රවණතාවයන් තවදුරටත් ශක්තිමත් කරගත යුතුයි.

08. අපගේ ආර්ථික ප්‍රතිපත්ති රාමුවේ මූලික අභිප්‍රාය වන්නේ සමාජ සාධාරණත්වය ඇති නව ආර්ථිකයක් බිහි කිරීමයි. එනිසා අප රජයේ ඉලක්කය වන්නේ ගතවූ දශක කීපයේ දක්නට ලැබුණු වේගයට වඩා වැඩි වේගයකින් දිළිඳු ජනතාවගේ ආදායම වර්ධනය කිරීමත් විශේෂයෙන් ඈත එපිට ප්‍රදේශයන්හි ආදායම වැඩි කිරීමත්ය. මේ සඳහා මැදි කාලීනව සියයට 8 ක වේගවත් ආර්ථික වර්ධනයක් අත්පත්කර ගැනීම උදෙසා සියයට 30-35 අතර මට්ටමකට ආයෝජන ඉහළ නැංවීමට රජයට කැපවීමට සිදුවනු ඇති. මෙම ආයෝජන මට්ටම තීරණය වනුයේ දේශීය හා විදේශීය ආයෝජන මත හා වෙළඳ පොළ ක්‍රියාවලිය තුළයි. මේ සඳහා යොමුවීමට නම් ජාතික මට්ටමින් සහ ග්‍රාමීය මට්ටමින් නවීන යටිතල පහසුකම් ඇති කිරීමත්, ඵලදායිතාවය වර්ධනය කිරීමත් විදේශීය මෙන්ම දේශීය වශයෙන් ඉල්ලුමක් පවතින රැකියා නිපුණතාවයන් බිහි කිරීමත් අප විසින් වර්ධනය කළ යුතුයි. මෙම ආර්ථික පෙරළිය ඇතිකර ගැනීම සඳහා අප විසින් පෞද්ගලික අංශය, විදේශීය ආයෝජන ප්‍රවාහ, සමූපකාර අංශය, මහජනතාවගේ සහභාගිත්වය සහ රාජ්‍ය නොවන අංශයන්ගේ සහභාගීත්වය ලබාගත යුතුව තිබෙනවා.

09. ගරු කථානායකතුමනි, දිළිඳුකම මුලිනුපුටා දැමීම මූලික අරමුණක් ලෙස අපගේ ප්‍රතිපත්ති රාමුව තුල පිළිගෙන තිබෙනවා. පහළම මට්ටමේ දිළිඳු ජනතාව සවිබල ගන්වමින් ප්‍රජා සහභාගිත්වය තුලින් දුප්පත්කම අවම කිරීමේ මාර්ගය "ගම නැගුම" තුලින් ඉදිරිපත් කර තිබෙනවා. ජන පුබුදුව, ගැමි පුබුදුව සහ ගැමි දිරිය වැඩ සටහන් පුළුල් කිරීම තුලින් සෑම වසරකම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ප්‍රජා සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලක්ෂයක් පමණ යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ජීවනෝපාය වර්ධන කිරීමේ කටයුතු වාර්ෂික ඉලක්ක බවට පත් වෙනු ඇති. මෙම වැඩ සටහන් වලට සහභාගී වීම තුලින් රු. 5000/- දක්වා වඩාත් හොඳ ආදායමක් ලබා ගැනීමට සමෘද්ධිලාභීන්ට හැකිවනවා ඇති. සමෘද්ධි වැඩසටහන සුවිශාල ග්‍රාමීය සංවර්ධන වැඩ සටහනක් බවට පත්කිරීම සඳහා ප්‍රථම වතාවට අයවැයකින් ඊට කෙරෙන වැඩිම ප්‍රතිපාදනය වන රුපියල් මිලියන 3000 ක් 2006 වසර වෙනුවෙන් වෙන් කරනු ලබනවා.

10. මිනිසා විසින් ඇති කරනු ලැබූ හා ස්වභාවික ව්‍යසනයන්ගෙන් හානියට පත් දිස්ත්‍රික්ක ඇතුළුව රටේ අඩු වර්ධනයක් පවතින පළාත්වල සංවර්ධනය සඳහා නිසි ලෙස හා සමබර අයුරින් සම්පත් වෙන් කරදීම තවත් මූලික අරමුණක්. මේ තත්ත්වය තුල දරුවන් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම, වතු වැවිලි ප්‍රජා සංවර්ධනය, ගැටුම් වලින් ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ හා සුනාමියෙන් ආපදාවන්ට ලක්වූ මුහුදු තීරය සහ රටේ අනෙකුත් ප්‍රදේශ තුළ අඩු වර්ධනයක් සහිත දිස්ත්‍රික්ක සඳහා අපගේ විශේෂ සැලකිල්ල යොමුව තිබෙනවා. මේ වනවිටත් ළමා සංවර්ධනය මෙන්ම වතු යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධනය සඳහා කැප වූ අමාත්‍යාංශ පිහිටුවා තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාමීය ආරෝග්‍යශාලාවන්හි ගැබිණි මාතෘ සායන සහ අදාල සේවා කටයුතු මෙන්ම ඔවුන්ට පෝෂ්‍යදායී ආහාර ලබාදීම පිළිබඳ කටයුතු සම්පාදනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු කරන අතර සංවර්ධනයෙන් පසුගාමී පාසැල් සඳහා නොමිලේ ආහාර ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලබනවා. ව්‍යවසනයන්ගෙන් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය සඳහා පවත්වාගෙන ආ සියළු ආයතන වෙනුවට මගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ජාතිය ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය යටතේ යළි ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ අධිකාරිය එම ප්‍රාදේශීය සංවර්ධනය වේගවත්ව සිදුකිරීම සඳහා පිහිටුවා තිබෙනවා. මෑතදී පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන

අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය වශයෙන් මතුවන ගැටළුවලට විසඳුම් ලබා දීමත් සම්පත් ඵලදායි ලෙස යොදා ගැනීමත් මගින් ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන අධිකාරීන් සහ පළාත් සභා සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය කරනු ඇති.

11. ගරු කථානායකතුමනි, නිවාස මූලික මිනිස් අවශ්‍යතාවයක්. නොයෙක් ආකාරයේ වැඩ සටහන් මගින් අප රජය විසින් නිවාස ඉදිකිරීම් වේගවත් කරනු ඇති. නිවාස ඉදිකිරීම් දිරිගැන්වීම සඳහා "ජන සෙවන" වැඩ සටහන යටතේ පිරිසිදු ඔප්පු මගින්ම දුප්පත් ජනතාව අතරේ නිරවුල් ඔප්පු සහිත ඉඩම් කට්ටි ලක්ෂයක් බෙදා දීමට අවශ්‍ය මූලික කටයුතු අපි දැන් සකස් කරගෙන යනවා. රජයේ නිවාස යෝජනා ක්‍රමයන්හි පදිංචිව සිටින්නන්ටම එහි සින්නක්කර අයිතිය පවරා දෙනු ඇති. එසේම කොළඹ සහ ඊට තදාසන්න ප්‍රදේශවල තාවකාලික පැල්පත්වල වාසය කරන්නන්ගේ නිවාස අවශ්‍යතාවය ද අප විසින් විසඳිය යුතු මූලික ගැටළුවක් වෙනවා. ඒ සඳහාම කැපවුන නාගරික නිවාස සංවර්ධන සංස්ථාවක් පිහිටුවනු ලබනවා. සුනාමි ව්‍යවසනයට පත් මුහුදු තීරයේ හා උතුරු සහ නැගෙනහිර පළාත්හි තාවකාලික කඳවුරුවල පදිංචි අය වෙනුවෙන් නිවාස ඉදි කිරීමේ වැඩ සටහන් වේගවත් කරනු ඇති. දෙලක්ෂයක් පමණ වතු නිවාස ඉදිරි තෙවසර තුල ප්‍රතිසංස්කරණය හෝ සංවර්ධනය කරනු ඇති. රාජ්‍ය සේවකයන් හා සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස සැපයීම සඳහා නිවාස යෝජනා ක්‍රම ආරම්භ කෙරෙනු ඇති.

12. රටක වඩාත්ම වටිනා සම්පත වන්නේ මානව සම්පත බව මා මෙන්ම ඔබද පිළිගන්නා සත්‍යයක්. මානව සම්පත් දියුණු කිරීමෙන් පමණක් අර සියළු සම්පත් වලට ශක්තිය දිය හැකි බව මගේ විශ්වාසයයි. අධ්‍යාපනය ඉතා වැදගත් සාධකයක් බවට පත් වන්නේ අන්න ඒ අවශ්‍යතාවයට අනුවයි. මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලි කළ පරිදි අප රජය විශ්වාස කරනුයේ සියළු පුරවැසියන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම තුලින් ආර්ථික සංවර්ධනයට මහපාදා ගත හැකි බවයි. මක්නිසාද යත් ජනතාවට නිසි අධ්‍යාපනයක් ලබානොදී කිසිම රටකට එම රටේ සංවර්ධනය පිළිබඳව දිගුකාලීන දැක්මක් ඇතිකර ගත නොහැකි බැවිනි. එනිසා සියළු ජනතාවට නිදහස් අධ්‍යාපනය ලබාදීමට අපි සෘජුව බැඳී සිටින බව මතක් කළ යුතුයි. අප රටේ අනාගත සංවර්ධනය දැනුම මත පදනම් වූ ආර්ථිකයක් බවට පත්කර ගත යුතුයි. පවත්නා වත්කම්වල වටිනාකම වර්ධනය කර ගැනීමේ අවබෝධය මෙන්ම නව නිෂ්පාදනයන් සේවා සහ තාක්ෂණය යොදා ගැනීම ඊට ඇතුළත් වනු ඇති. නැගී එන සියළු අසියාතික හා මැද පෙරදිග ආර්ථික කේන්ද්‍රස්ථානයන්ට බෙහෙවින් ආසන්නව පිහිටා තිබීමේ හේතුවෙන් අප රට තුලට මෙන් එපිටටද ගුණාත්මක සේවාවන් සපයන රටක් බවට අප පත්විය යුතුයි. වර්තමානයේ එක්ලක්ෂ පනස් දහසක් පමණ වන විදේශ රැකියා සඳහා රටින් පිටවන පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය හෙද සේවය, පරිඝණක විද්‍යාව, නාවික කටයුතු වැනි අංශ හා අනෙකුත් වෘත්තීය නිපුණතා එක් කිරීම තුලින් විවිධාංගකරණයකට භාජනය කළ යුතුයි. මේ පසුබිම තුල අපේ අධ්‍යාපන ක්‍රමය තවදුරටත් ජාත්‍යාන්තර භාෂාවන්ට ඉඩ සැළසීමට මෙන්ම අධ්‍යාපනඥයින්, පර්යේෂකයන්, වෙළඳ ප්‍රජාව අතර සමීපව වැඩ කරන සම්බන්ධතාවන් බිහි කිරීමට යොමු විය යුතුයි. එසේම සියළු නිපුණතාවයන් පිළිබඳව ජාතික වෘත්තීය වර්ගීකරණයක් ඇති කිරීමට අප යෝජනා කරනවා. එමගින් රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට ද ඔවුන්ගේ මානව සම්පත් සංවර්ධනය ක්‍රමානුකූල පදනමකින් සැලසුම් කරගත හැකිවෙනවා. පාසැල්වල ඉංග්‍රීසි අධ්‍යාපනය වඩාත් ප්‍රචලිත කිරීම සඳහා ඉංග්‍රීසි ගුරුවරුන් වැඩි වැඩියෙන් පුහුණු කිරීමටද කටයුතු යොදනවා

13. ගරු කථානායකතුමනි, කෘෂිකර්මාන්තය අප ආර්ථිකයේ කොඳු නාරටියයි. අප විසින් සම්පත් ප්‍රමාණවත් ලෙස එහි සංවර්ධනය පිණිස යොමුකොට නැති බව පැහැදිලියි. අපගේ බහුතරයක් ජනතාවට ප්‍රතිලාභ අත්වන පරිදි මෙම අංශය නැවත ගොඩනැගීම අවශ්‍යව තිබෙනවා. එනිසා සිත් ඇදගන්නා නිෂ්පාදන මිල, බීජ සහ ගොවි උපකරණ සඳහා වෙන් කිරීම්, ණය ලබාදීමට සහ අඩු මිලට පොහොර ලබාදීම, ගබඩා කිරීමට සහ අලෙවිය සඳහා ක්‍රියාමාර්ග මෙන්ම ඉහළ ගුණාත්වයෙන් යුත් සහල් සැකසීම තුලින් මූලික කෘෂි නිෂ්පාදන දියුණු කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රමුඛත්වයක් ලැබෙන පරිදි පසුබිම සකස් කළ යුතු වෙනවා. මේ සම්බන්ධයෙන් රජය මීළඟ මහකන්නයේ වී සඳහා නිෂ්පාදන මිල කිලෝවකට රුපියල් 16.50 - 17.50 දක්වා වැඩි කරනු ඇති. සියළු වර්ගවල පොහොර කිලෝග්‍රෑම් 50 ක මිටියක් රු. 350/- බැගින් වී හා එළවළු ගොවිතැන සඳහා ලබාදීමට මේ වනවිටත් කටයුතු යොදා තිබෙනවා. එක් අතකින් මෙරට කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලැබෙන පරිදිත්, අනෙක් අතින් පාරභෝගිකයන් විසින් ගෙවිය යුතු මිල ඔරොත්තු දිය හැකි මට්ටමක තබා ගැනීම සඳහාත් මිල මට්ටම් පවත්වාගෙන යාහැකි පරිදි තීරුබදු ප්‍රතිපත්තියක් අප අනුගමනය කරනවා.

14. වී සහල් බවට පත් කිරීමේ මට්ටමෙන් ඔබ්බට අපගේ ආහාර නිෂ්පාදන කර්මාන්තය ගෙනයාමට දිරිදිය යුතුයි. ධාන්‍ය සැකසීම සමග අනෙකුත් අදාල තාක්ෂණය සහ පවත්නා දියුණු ඇසුරුම් ක්‍රම මගින් සහල් පිටි වලින් පාරිභෝගිකයන්ට සෞඛ්‍ය සම්පන්න විකල්ප ආහාර සම්පාදනය කිරීමට අපගේ කර්මාන්ත කරුවන් පෙළඹවිය යුතුයි. ඒ සඳහා අප විසින් මෙම අයවැයෙන් ඔවුන්ට ආහාර සැකසුම් කර්මාන්තයට අවශ්‍ය නවීන තාක්ෂණය සඳහා කරන ආයෝජනය වෙනුවෙන් දිරිගැන්වීම් පිරිනමන්නෙමු. ගරු කථානායකතුමනි, ඒ අයුරින්ම කිරි අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිත වීමට සහ ආනයනික කිරිපිටි පාවිච්චිය වෙනුවට දේශීය කිරි පරිභෝජනය දිරිගන්වමින් මැදිකාලීන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපි යොමු විය යුතුයි. ඉදිරි වසරක හෝ දෙකක කාලයක් තුල කිරි සඳහා නිෂ්පාදන මිල රු. 30 දක්වා වැඩි කිරීමට කටයුතු කිරීමටත් දේශීය කිරි නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා උසස් තත්ත්වයේ කිරි ගවයන් ලබාදීම හා අනෙකුත් දිරිගැන්වීම් ලබාදීමටත් අඛණ්ඩව කටයුතු කරනු ඇති.

15. ගරු කථානායකතුමනි, අප රටේ දළ ජාතික නිෂ්පාදනය වැඩි කර ගැනීම සඳහා සාගර සම්පත් හා නාවික කර්මාන්තය ද යොදාගත හැකි වන පරිදි අපේ රට පිහිටා තිබෙනවා. මේ වටපිටාව තුළ මත්ස්‍ය අස්වනු රැස් කරන උපකරණ ඇතුලුව නවීන තාක්ෂණය මගින් බහුදින ට්‍රෝලර් යාත්‍රා සමූහය වැඩි කිරීමට ප්‍රමුඛස්ථානය දෙනු ඇති. සාගර විශ්ව විද්‍යාලයීය පහසුකම් වර්ධනය කිරීම තුලින් මේ ක්ෂේත්‍රයේ කුසලතා ඉහළ නැංවීමේ අවස්ථාවන් ද බිහිකරනු ඇති. ප්‍රයෝජනයට නොගන්නා රට තුළ ඇති විශාල වැව් හා ජලාශ මිරිදිය මත්ස්‍ය ගොවිපල සඳහාත් කල්පිටිය සහ මඩකලපුව වැනි මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිත ජලාශ ඉස්සන් ඇති කිරීම සඳහාත් යොදා ගනු ඇති. ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් ආශ්‍රිතව මත්ස්‍ය සැකසුම් කිරීමේ හා ඇසිරීමේ කර්මාන්තශාලා ඇති කිරීමටද මගේ රජය බලාපොරොත්තු වෙනවා.

16. ගරු කථානායකතුමනි, අපේ අවධානය යොමු වනුයේ ගොවිපළ ආර්ථිකයක කෙරෙහි පමණක්ම නොවේ. තොරතුරු තාක්ෂණය වැනි නැගී එන අනෙකුත් අංශයන්ගෙන් ආර්ථික සංවර්ධනයට ලබාදිය හැකි වටිනා දායකත්වය අප පිළිගත යුතුව තිබෙනවා. අපගේ පරිගණක මෘදුකාංග කර්මාන්තය මේ වසරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100 කට ආසන්න බව සඳහන් කිරීමට ලැබීම මා දිරිමත් කරවන්නක්. වේගවත්ව වර්ධනය වන එම කර්මාන්තය ඉදිරි සත් වසරක කාලය තුළදී ඇමෙරිකානු ඩොලර් බිලියනයක අපනයන කර්මාන්තයක් බවට පත්වීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම අපේ මූලික වගකීමක්. තොරතුරු තාක්ෂණ නගරයක් වශයෙන් කඹුරුපිටිය දියුණු කිරීමට මගේ රජය බලාපොරොත්තු වෙනවා. ඒ හා සමාන පරමාර්ථයෙන්ම ඇඟළුම්, ආහාර නිෂ්පාදන, අලෙවි සහ වෘත්තීය සේවාවන් වැනි වේගවත් වර්ධනයක් සහිත කර්මාන්ත සමඟ බද්ධ වූ රට වැදගත් සේවයක් සලසන මුද්‍රණ සහ ඇසුරුම් කර්මාන්තය ද නගාසිටුවිය යුතුව තිබෙනවා.

17. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුව, අනෙකුත් බැංකු සමග සම්බන්ධ කොට ණය සුරැකුම් යෝජනා ක්‍රම, කල්බදු පහසුකම් සහ අවධානම් ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන සම්පාදනයන් වැනි-වත්කම් උගස් කිරීම් වලින් තොර මූල්‍ය සම්පාදන ක්‍රමයක් බිහි කෙරෙනු ඇති. ඒ තුළින් ශ්‍රී ලංකාවේ වෙළඳ නාමය යටතේ ක්ෂේත්‍ර ගණනාවකම එකතු කළ අගය වැඩි කල හැකි අන්දමේ ශක්තිමත් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත 500 ක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වනවා. මීට සහල් සැකසුම්, මුද්‍රණ, ඇසුරුම්, මැණික් හා ස්වර්ණාභාරණ, එළවළු හා පළතුරු, අත්යන්ත්‍ර, ඇඟළුම් මෝස්තර, මෘදුකාංග සංවර්ධන, ගෘහ භාණ්ඩ නිෂ්පාදන, වෘත්තියමය සේවා යනාදී අංශද ඇතුළත් වෙනවා. අපනයන ණය පහසුකම් සැලසීමත් සමඟම විදේශීය වෙළෙඳපොලට ඇතුළත් වීම සඳහා ද අවස්ථාව සැලසෙනු ඇති. රෙදි පිළි සැකසුම් කර්මාන්තයට අවශ්‍ය සියළු දේ සම්පාදනය කරමින් සහ දේශීය වෙළඳ නාමය යටතේ ඇසුරුම් කරමින් එකතු වූ අගය වැඩි කර්මාන්තයක් ලෙස මැදි කාලීන රාමුව යටතේ එක්සත් ජනපද ඩොලර් බිලියන 5 ක වටිනාකමක් සහිත කර්මාන්තයක් බවට ඇඟළුම් කර්මාන්තය දියුණු කිරීම මගේ රජයේ බලාපොරොත්තුවයි. තුල්හිරියේ සහ හොරණ රෙදිපිළි සැකසුම් කලාප දෙකෙහි ඉතා ඉක්මණින්ම මහා පරිමාණ රෙදිපිළි සැකසුම් කර්මාන්ත ශාලා දෙකක් පිහිටුවීමට අප බලාපොරොත්තු වෙනවා.

18. ගරු කථානායකතුමනි, රට පුරාම ආර්ථික ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස මාර්ග, විදුලි බලය, වාරි මාර්ග, පානීය ජලය, විදුලි සංදේශනය, කාර්මාන්ත පුර, නාගරික යටිතල පහසුකම්, ගමනා ගමනය හා තොරතුරු තාක්ෂණය ආදි යටිතල පහසුකම් වල වේගවත් සංවර්ධනය අපගේ ප්‍රතිපත්ති තුළ ප්‍රමුඛස්ථානයෙහිලා පිළිගෙන ඇත. ඒ අනුව විශේෂිත සංවර්ධන යෝජනා ක්‍රමයන් වන ගල් අඟුරු බලාගාර හා ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය ජනතාවගේ විදුලිබල වියදම් අඩු කර ගැනීම සඳහා ඉක්මණින් නිම කිරීමට කටයුතු කරනවා. ගල් අඟුරු බලාගාර ඉදිවන දිස්ත්‍රික්කවල ජනතාවට විදුලි බලය ලබා දීමේදී සාමාන්‍ය මිලෙන් අඩකට විදුලිය ලබා දීමට බලාපොරොත්තු වෙනවා. එම ප්‍රදේශ වල ආගමික මධ්‍යස්ථානවලට විදුලිය නොමිලේ සැපයීමට ද පියවර ගනු ඇති. නැව් සඳහා හම්බන්තොට ඉදිකරන ඉන්ධන වරාය සංකීර්ණය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය ඇතුළු අනෙකුත් වටරවුම් මාර්ග, කොළඹ-කටුනායක අධිවේගී දුම්රිය මාර්ගය, දෙවන ගුවන්තොටුපල ධාවන පථය, අප රටේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොල වශයෙන් වීරවිල ගුවන්තොටුපල, කොළඹ දකුණු වරාය පහසුකම්, කොළඹ නගරය තුල ගුවන් පාලම්, කළුතර සිට සුනාමියෙන් හානියට

පත් මුහුදු තීරය ඔස්සේ යාපනය දක්වා මාර්ගය, හම්බන්තොට කල්පිටිය හා අරුගම්බේ නගරයන්හී විශේෂ සංචාරක කලාප සහ කොළඹ යෝජිත ජනකලා කේන්ද්‍රය ආදී ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වයක් ලබා දී ඉක්මණින් නිම කිරීමට කටයුතු යෙදීමට බලාපොරොත්තු වෙනවා. බස්රථ 3000 කින් ලංකා ගමනාගමන මණ්ඩලය පුළුල් කිරීමත්, දුම්රිය යටිතල පහසුකම් නවීකරණය කිරීමත්, කතරගම දක්වා මුහුදුබඩ දුම්රිය මාර්ගය ද, කැළණිවැලි දුම්රිය මාර්ගය ඇඹිලිපිටිය හරහා හම්බන්තොට දක්වාද, කුරුණෑගල-දඹුල්ල හබරන නව දුම්රිය මාර්ගයක්ද ඉදි කිරීම මගින් ජනතාව සඳහා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීමට ඉවහල් වනු ඇතැයි මගේ රජය අපේක්ෂා කරනවා.

19. ගරු කථානායකතුමනි, ඒ හා සමාන වටිනාකමක් පලාත් හා ග්‍රාමීය මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස ග්‍රාමීය සංවර්ධන හිතකාමී වැඩසටහන් වලටද අප රජයේ මූලිකත්වය හිමි වනවා. අප රටේ ග්‍රාමීය පෙදෙස්වල ජල සම්පත් සංවර්ධනය කරමින් දහසක් වැව් වැඩසටහන මගින් වසරකට වැව් 2000 බැගින් සංවර්ධනය කරනු ඇති. දැදුරුඔය, කිරිඳිඔය, උමාඔය, මහඇල, මැණික් ගඟ, කුඹුක්කන් ඔය, .යාන් ඔය හා කිරම ඔය යන බහුකාර්ය වාරි සංවර්ධන යෝජනා ක්‍රම වැනි වැඩසටහන් නොසලකා හරිනු ලැබ ඇති දිස්ත්‍රික්ක කීපයක ඉදිරි දෙවසරතුල ක්‍රියාත්මක කිරීමට යෝජිතයි. එසේම ග්‍රාමීය සහ වතු අංශයේ මාර්ග තවත් කිලෝ මීටර් 5000 ක කටයුතු නිම කිරීම මග නැගුමේ ඉලක්කයයි. "පුබුදමු වෙල්ලස්ස", "රජරට නවෝදය", "සෞභාග්‍ය උදානය", "රුහුණු අරුණාලෝකය", උතුරු හා නැගෙනහිර පළාත්හී සංවර්ධන වැඩසටහන් මගින් ප්‍රාදේශීය සංවර්ධන මෙන්ම ප්‍රාදේශීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම රජයේ ප්‍රමුඛ වගකීම බව අපි දැඩිව විශ්වාස කරනවා.

20. ගරු කථානායකතුමනි, නීතිය හා අධිකරණ ක්ෂේත්‍රයේ අරඹන ලද වැදගත් ප්‍රතිසංස්කරණ ඊළඟ වසරේ තව තවත් පුළුල් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙහිදී අවධානය යොමු වනුයේ, එම ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් සංවර්ධනය, උසාවි සංකීර්ණ වැඩි දියුණු කිරීම, තොරතුරු තාක්ෂණය පුළුල් කිරීම, ව්‍යාපාරික කටයුතුවලට වඩාත් හිතකර නීතිමය හා නියාමන පරිසරයක් ඇති කිරීම, ගනුදෙනුවලදී දැරීමට සිදුවන පිරිවැය අඩු කළ හැකි පරිදි හා රටේ ව්‍යාපාරික සංවර්ධනයට හිතකර අන්දමේ නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ද යන කරුණු කෙරෙහිය. නීතිය සාමය හා මහජන ආරක්ෂාව මැනවින් පවත්වා ගෙන යාම මගිනුත්, නීතිමය අයිතිවාසිකම් සුරැකීම මගිනුත් තිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන පරිසරය නිර්මාණය කළ හැකියි. මෙහිදී අපරාධ මැඩලීමටත්, මහජනයාට අධිකරණයේ පිහිට පැතීමට ඇති ඉඩප්‍රස්ථා පුළුල් කිරීමටත් මත්ද්‍රව්‍ය හා ත්‍රස්තවාදය මර්ධනය කිරීමටත් අවධානය යොමු වනු ඇති. ඒ අතරම මේ වනවිටද සුරා බලපත්‍ර නිකුත් කිරීම මුළුමනින්ම අත්හිටුවීමට අපගේ රජය කටයුතු කර තිබෙන බව ඔබතුමා හොඳින් දන්නවා. නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රවාහනය තුරන් කරලීමට දැඩිසේ ක්‍රියාත්මක කරන අතර, දැනට පවත්වා ගෙන යනු ලබන මත්පැන් වෙළඳසැල් පාසල් හා පූජනීය ස්ථානවලින් ඈත් කර ඒවා දැඩි පාලනයකට යටත් කිරීමටත් මා බලාපොරොත්තු වෙනවා.

21. රජය මහජනයාට මිත්‍රශීලි ලෙස හා වගකීමෙන් යුතුව සේවා සපයන්නෙකු ලෙසත්, ව්‍යාපාරික කටයුතු සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සලසන්නකු ලෙසත් ක්‍රියා කළ යුතුව තිබෙනවා. එබැවින්,

රජයේ නීතිරීති ක්‍රියා පටිපාටි මෙන්ම ආකෘති පත්‍ර ආදිය ද සරල කිරීමටත් එමගින් ගනුදෙනුවලදී සිදුවන පිරිවැය පහත හෙලා නාස්තිය අඩු කොට රජයේ අකාර්යක්ෂමතාවය සහ දූෂණය පිටු දැකීමට ද කටයුතු කෙරෙනු ඇති. රාජ්‍ය ආයතනවල කාර්යසාධනය හා සේවාවන්හී ප්‍රමිතීන් උසස් මට්ටමක පවත්වා ගෙන යන බව තහවුරු කිරීම සඳහා වෘත්තීයමය ආයතනවල සහාය ලබා ගෙන එකී රාජ්‍ය ආයතන මහජනතාවගේ සුපරීක්ෂණයට ලක් කිරීමට හා ශ්‍රේණිගත කිරීමට ද අපි බලාපොරොත්තු වෙනවා. රට තුළ පවත්නා ප්‍රාදේශීය වශයෙන් වූ බලවත් අසමතුලිතතාවය සැළකිල්ලට ගත් කල්හී කොළඹ නගරය මුල් කරගත් පරිපාලන ප්‍රතිසංස්කරණ පවත්වාගෙන යා නොහැකි බවට අප අතර තර්කයක් මතුවන්නේ නැහැ. එබැවින් මහජනතාවගේ අභිලාශයන් ඉටු කිරීම සඳහා වඩාත් හොඳ ප්‍රතිචාරයක් දැක්වීමට හැකියාව ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කොට ගත් ශක්තිමත් දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් ඇති කිරීමට උපරිම ප්‍රමුඛතාවයක් ලැබෙනු ඇති. දිළිඳුකම තුනී කරලීම පිණිස ප්‍රජා අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී ප්‍රමුඛත්වය දෙන ආර්ථික සංවර්ධන ක්‍රියාමාර්ග, විමධ්‍යගත අයුරින් ක්‍රියාවට නැංවීම සඳහා ඔවුන්ගේ සහභාගිත්වය ලබා ගත යුතු වෙනවා. ප්‍රජා මට්ටමේ සියළුම සංවර්ධන කටයුතු මනා සම්බන්ධීකරණයකින් යුතුව හා ඵලදායී ලෙස කළමනාකරනය කිරීම සඳහා පිහිටුවන ලද "ගම නැගුම" වැඩ සටහන තුළින් මෙම විමධ්‍යගත සංවර්ධන ක්‍රියාවලිය සවිබල ගැන්වෙන බව මගේ අවංක විශ්වාසයයි.

22. ගරු කථානායකතුමනි, අප රටේ මහජනතාවගේ සුබසාධනය සඳහාත් සම්පත් කළමනාකරනයේදී ආර්ථිකමය කාර්යක්ෂමතාවය ළඟා කර ගැනීම සඳහාත් වූ අපගේ සංවර්ධන උපාය මාර්ගයේදී රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය ද එකසේ වැදගත් වන බව මා මීට පෙරද ප්‍රකාශ කලා. අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන හුදෙකලාව ක්‍රියාත්මක වීම නිසාත්, යල්පැන ගිය ක්‍රමවේදයන් සහ ක්‍රියා පටිපාටි නිසාත්, අනම්‍යශීලි නීති රීති නිසාත්, මනා සම්බන්ධීකරණයකින් තොරව ආයෝජන සම්බන්ධ කරවා ගැනීම නිසාත් පෞද්ගලික අංශයේ සංවර්ධනයට බාධා සිදු කරන බව රහසක් නොවේ. එබැවින්, ප්‍රමුඛතා පදනමක් මත මෙම ගැටළු ඉතා ඉක්මණින් නිරාකරණය කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අප රටේ ආයෝජන පරිසරය වඩාත් ඉහළ නැංවිය හැකි පරිදි ආයෝජන පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිරීති ලබන වසර මුලදී මෙම ගරු සභාව වෙත ඉදිරිපත් කිරීම අපේ අරමුණයි.. රට පුරා ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වීම පසුවිපරම් කිරීම සඳහා විශේෂ මෙහෙයුම් ඒකකයක් (Operation Room) සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ පිහිටුවනු ඇති. ජාතික මිළදී ගැනීමේ ආයතනය, රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ ආයතනය මෙන්ම අයවැය ක්‍රියාත්මක කිරීමේ හා විදේශාධාර පසුවිපරම් කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුව ද සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂිත ආයතන වනු ඇති. පෞද්ගලික අංශයේ සංවර්ධනය, රාජ්‍ය නොවන අංශයේ කාර්යයන්, ප්‍රාදේශීය සංවර්ධනය හා "ගම නැගුම" වැඩසටහනේ කටයුතු පසුවිපරම් කිරීම සඳහා විශේෂිත අංශයන් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ඇති.

23. ගරු කථානායකතුමනි, ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා වූ එකම උපාය මාර්ගය පෞද්ගලිකකරණය යැයි අපේ රජය විශ්වාස කරන්නේ නැහැ. අප විසින් රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලිකකරණය නොකෙරන අතර, කළමනාකරණ ප්‍රතිසංස්කරණ තුළින් ඒවායේ, කාර්යසාධනය

ඉහල නැංවීමට කටයුතු කෙරෙනු ඇති. අප රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංවිධානය කෙරෙනුයේ ඒවායේ රජයේ හිමිකම නොවෙනස්ව තබා ගනිමිනි. සියළුම රාජ්‍ය ව්‍යවසායයන් ඒවායේ උපරිම නිෂ්පාදන ධාරිතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, ඉතාම කාර්යක්ෂම ලෙස තම සේවාවන් මහජනතාව වෙත සැපයිය යුතු වනවා. සියළුම රාජ්‍ය ව්‍යවසායයන් රජයට ලාභාංශ ගෙවිය යුතුය. එසේ කළ නොහැකි නම් යටත් පිරිසෙයින් මහභාණ්ඩාගාරයේ මූල්‍ය සහාය මත යැපෙන ආයතන නොවිය යුතුයි. එබැවින් සියළුම රාජ්‍ය ව්‍යවසායයන් මහභාණ්ඩාගාරය සමඟ කාර්යසාධනය පිළිබඳව ගිවිසුමකට එළඹිය යුතුව තිබෙනවා.

24. ගරු කථානායකතුමනි, අපගේ සංස්කෘතික හා ආගමික සාරධර්මවලට අප ගරු නොකරන්නේ නම් අපට තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කර ගත නොහැකියි. අපේ ළමුන් අතර එබඳු සාරධර්ම වැඩි දියුණු වීම තුළින් අපට විනය ගරුක සමාජයක් බිහි කළ හැකි වනු ඇතැයි මම විශ්වාස කරනවා. හානිකර මත් ද්‍රව්‍ය සහ මත්පැන් වලට එරෙහිව දියත් කරන අපේ සටන තීව්‍ර කිරීම සඳහා අධ්‍යාපනය තුළින් ජනතාව හා දැනුවත් කිරීම උපකාර වනු ඇති. ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම නිසා, කලට වේලාවට නඩත්තු කටයුතු නොකිරීමෙන් අබලන්ව පවත්නා හෝ විනාශ මුඛයට යමින් පවතින විහාරස්ථාන, කෝවිල්, මුස්ලිම් පල්ලි හා කිතුනු දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට ආධාර සැලසීම අපේ වගකීමයි.. එමෙන්ම ක්‍රීඩා හා කායික සංවර්ධනය ඉහළ නැංවීම අපේ සංවර්ධන වැඩසටහනේ වැදගත් අංගයක් වනු ඇති. මෙම අරමුණ පෙරදැරිව අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි වැඩියෙන් ජාත්‍යන්තර තරඟවලට සහභාගී වීම ද දිරිමත් කිරීම අප රජයේ මහත් වූ වගකීමකි.

25. ගරු කථානායකතුමනි, මා මෙතෙක් ඉදිරිපත් කරනු ලැබුවේ මෙම අය-වැය යෝජනාවලියේ මූලික අවධානය යොමු වී ඇති ක්ෂේත්‍ර පිළිබඳව මගේ රජයේ දැක්ම හා පරමාර්ථ කවරාකාර වනු ඇත්ද යන්න පැහැදිලි කිරීමයි. අපගේ ආර්ථික දර්ශනය මත පදනම්ව අප ගනු ලබන ක්‍රියාත්මක පියවරයන් ඉදිරිපත් කිරීමට මම දැන් බලාපොරොත්තු වෙනවා. මෙහිදී එම යෝජනා සවිස්තරාත්මකව සඳහන් කිරීමට මම අදහස් නොකරමි. එම යෝජනා අංක 1 දරන ඇමුණුමේ සවිස්තරව දක්වා ඇත. එසේ වුවත් මම එම යෝජනා ගැන සැකෙවින් සඳහන් කරමි.

I. **ආගමික සංවර්ධනය**

ගරු කථානායකතුමනි,

- සියළු ආගමික දහම් පාසැල් ගුරුවරුන් සඳහා පොත් පත් ආදී ඉගැන්වීමේ උපකරණ මිලදී ගැනීමට රු. 2000/- බැගින් වාර්ෂික දීමනාවක් ලබාදීමට මම යෝජනා කරනවා.
- ආගමික අධ්‍යාපනය වර්ධනය කිරීම සඳහා සහ ඓතිහාසික සංස්කෘතිමය අගයකින් යුතු තෝරාගත් පන්සල්, කෝවිල්, ක්‍රිස්තියානි සහ මුස්ලිම් පල්ලි සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 200 ක් වෙන්කිරීමට මම යෝජනා කරනවා.

II. **කලාව සහ සංස්කෘතිය**

ගරු කථානායකතුමනි,

- ටවර් හෝල් පදනම සහ මධ්‍යම සංස්කෘතික අරමුදල ආදායම් බදු වලින් සහ එකතු කල අගය මත බදුවලින් නිදහස් කිරීමට මම යෝජනා කරනවා.
- සියළු කලාකරුවන්ට සිය නිර්මාණ කාර්යය සඳහා යොදා ගැනීම පිණිස "කලා නිකේතනයක්" කඳුරට පිහිටුවීම සඳහා 2006 වසර වෙනුවෙන් රුපියල් මිලියන 50 ක් යෝජනා කරනවා.
- කොළඹ නගරයේ ඉදිකිරීමට යෝජිත ජාතික චිත්‍රපට විද්‍යායතනය සහ රංගකලායතනය වසර 2 ක් තුළ නිම කරනු ඇති.
- ආනයනය කරනු ලබන අධ්‍යාපනික වාර්තාමය වැඩසටහන් හැර විදේශීය චිත්‍රපට සහ ටෙලි නාට්‍ය සඳහා රු. 75,000 ක විශේෂ බද්දක් පැනවීමට මම යෝජනා කරමි. මේ මගින් ලැබෙන ආදායම දේශීය චිත්‍රපට සහ ටෙලි නාට්‍ය කර්මාන්තය නගා සිටුවීමට යොදා ගනු ඇති.

## III. මාධ්‍යවේදීන්

ගරු කථානායකතුමනි,

- පරිඝනක හා සිය වෘත්තියට අදාළ වන්නා වූ උපකරණ සහ යතුරුපැදි ලබාගැනීම සඳහා මධ්‍යවේදීන්ට සහනදායි අරමුදල් සැපයීමට මම යෝජනා කරනවා.
- සිය වෘත්තීමය දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා තරුණ මාධ්‍යවේදීන්ට මුල්‍යාධාර සැපයීම සඳහා රුපියල් මිලියන 75 ක් වෙන් කිරීමට ද මම යෝජනා කරනවා.

## IV. මව්වරුන් සහ දරුවන්

ගරු කථානායකතුමනි,

- ලබන වසරේ සිට මාතෘ නිවාස සහ ග්‍රාමීය රෝහල් හරහා ගැබිනි මව්වරුන්ට පෝෂ්‍යදායි ආහාර, වෛද්‍ය සේවා සහ සිය අළුත උපන් දරුවාට කිරි මිලදී ගැනීම සඳහා මාසිකව රු. 200/- බැගින් ලබාදීමට මම යෝජනා කරනවා.
- අඩු පහසුකම් සහිත පාසැල් සඳහා නොමිලේ දිවා ආහාර වේලක් ලබන වසරේ ජනවාරි මස සිට ලබාදිමට මම යෝජනා කරනවා.
- ගරු කථානායකතුමනි, සුනාමියෙන් සහ ගැටුම්වලින් සිය දෙමාපියන් අහිමි වූ දරුවන් සඳහා මසකට රුපියල් 1500/- බැගින් "සෙනෙහස" ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ඇත. මේ යෝජනා සඳහා මම රුපියල් මිලියන 1500 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

## V. ආබාධිත තත්ත්වයනට පත් අය සඳහා සහන

ගරු කථානායකතුමනි,

- ළමා නිවාස, වැඩිහිටි හා ආබාධිත තත්ත්වයට පත් වූ අය රැක බලාගන්නා නිවාස ආදිය නවීකරණය කිරමට සහ ඔවුන් වෙනුවෙන් රජයේ දායකත්වය වැඩි කිරම සඳහා රුපියල් මිලියන 200 ක් වෙන් කිරමට මම යෝජනා කරනවා. පොලි ආදායම මත අයකරන සියයට 10 ක් වූ ආදායම් බද්දෙන් එම කටයුතුවල නියැලී සිටින සංවිධාන නිදහස් කරනවා.
- විවිධ ආබාධිත තත්ත්වයන්ට මුහුණ දී ඇති පුද්ගලයන් විසින් පාවිච්චි කරනු ලබන විවිධ ආධාරක උපකරණ සියළු වර්ගයේ බදු වලින් නිදහස් කරනවා.
- නිවහනක් නොමැති ආබාධිත පුද්ගලයන් හට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා "රැකවරණ නිවස" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා.

## VI. අඩු වරප්‍රසාදලාභී ප්‍රදේශ සඳහා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක්

ගරු කථානායකතුමනි,

- අඩු වරප්‍රසාදලාභී ප්‍රදේශවල ඇති රෝහල් 17 ක් කාර්යමය දිස්ත්‍රික් මූලික රෝහල් ලෙස වැඩි දියුණු කිරම සඳහා රුපියල් මිලියන 300 ක් වෙන් කිරමට මම යෝජනා කරනවා.
- මෙම රෝහල්වලට අනුයුක්ත කරන විශේෂඥ වෛද්‍යවරුන් සඳහා නිල වාහන සහ නේවාසික පහසුකම් සැපයීමට මම යෝජනා කරනවා.

## VII. සමෘද්ධි සහ ජීවනාධාර වැඩසටහන

ගරු කථානායකතුමනි,

- සමෘද්ධි දීමනාව සියයට 50 කින් වැඩි කිරමටත්, සමෘද්ධි ප්‍රතිලාභීන්ට රු. 5,000/- ක් දක්වා අතිරේක ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව උදාකර දීමට දීප ව්‍යාප්ත ප්‍රජා කාර්ය වැඩසටහන් සහ ජීවනාධාර සහායක ක්‍රියාකාරකම් ආරම්භ කිරමටත් මම යෝජනා කරනවා. දරු උපතකදී හෝ මරණයකදී සමෘද්ධි ලාභීන් පවුල්වලට දෙනු ලබන දීමනා දෙගුණ කරනවා.
- සමෘද්ධි ප්‍රතිලාභ හිමිවිය යුතු එහෙත් විවිධ හේතු මත එම දීමනා නොලැබී ඇති අයට ද සමෘද්ධි ප්‍රතිලාභ ලබා දීමට මා බලාපොරොත්තු වෙනවා. මෙම සුවිසල් ග්‍රාමීය සංවර්ධන ආරම්භයන් සඳහා රුපියල් මිලියන හය දහසක් වෙන් කිරමට මම යෝජනා කරනවා.

## VIII. යොවුන් දිරිය

ගරු කථානායකතුමනි,

- 2006 වර්ෂයේදී තරුණයන් 50,000 කට රැකියා සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් ව්‍යාප්ත කිරමට මම යෝජනා කරනවා
- විවිධ රාජ්‍ය ආයතනවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා 2006 වර්ෂයේදී උපාධිධාරීන් 10,000 ක් බඳවා ගැනීමට මම යෝජනා කරනවා

- පෙදරේරුවන්, වඩු කාර්මිකයන්, පයිප්ප වැඩකරුවන්, විදුලි කාර්මිකයන් වැනි නිපුණතා සපයන්නන් පිළිගැනීම සහ ආරම්භක ප්‍රාග්ධනය ලෙස රැකියාවේ නියුතුවීමට අවශ්‍ය වෙවලම් සහ උපකරණ ලබාදීමට මම යෝජනා කරනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

IX. **විදේශ සේවා නියුක්තිය**

ගරු කථානායකතුමනි,

- විදේශයන්හී සේවා නියුක්ත කිරීම සඳහා හෙදියන් පුහුණු කිරීමට හෙද පාසල් කීපයක් පිහිටුවීමට මම යෝජනා කරනවා. අනෙකුත් රැකියා සඳහා ද අවශ්‍ය නිපුණතා සංවර්ධනය සපයනු ඇති.
- විදේශයන්හී වසර දෙකක කාලයක් සේවා නියුක්තව සිට පැමිණෙන අයට ව්‍යාපාර හෝ ස්වයං රැකියා ඇරඹීමේ දිරිදීමනාවක් ලෙස ඇමෙරිකානු ඩොලර් 5,000 ක් දක්වා වූ ගමන් මළුවලට අමතර විශේෂ තීරුබදු දීමනාවක් සපයනු ඇති.

X. **වතු ප්‍රජා සුභ සාධනය**

ගරු කථානායකතුමනි,

- වතු මාර්ග ප්‍රතිසංස්කරණය සහ වතු ක්ෂේත්‍රයේ නිවාස 50,000 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 2,000 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.
- නව වෘත්තීය හා තාක්ෂණ පුහුණු පාසලක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටුවනු ඇති.

XI. **අඩු ආදායම් නාගරික නිවාස**

ගරු කථානායකතුමනි,

- කොළඹ සහ නාගරික තදාසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත පැල්පත් නිවාස වෙනුවෙන් නව නිවාස 60,000 ක් ඉදි කිරීම සඳහා නාගරික නිවාස සංවර්ධන අධිකාරියක් ඇති කිරීමට මම යෝජනා කරන අතර, ඒ සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

XII. **කෘෂිකර්මාන්තය**

පොහොර

- වී සහ එළවළු වගා කිරීම සඳහා අවශ්‍ය සෑම වර්ගයකම පොහොර කිලෝ 50 බෑගයක් රු. 350/- ට සැපයීම සඳහා අයවැය වෙන් කිරීම රු. මිලියන 8,500 දක්වා වැඩි කිරීමට මම යෝජනා කරනවා. කාබනික පොහොර භාවිතා කරන්නන්ට, විශේෂයෙන්ම පළතුරු සහ එළවළු වගා කරන්නන්ට මූල්‍යමය සහනයක් ලබාදෙනු ඇති.

බීජ

- ගුණාත්මක බීජ සහ පැල වර්ග සැපයීම සඳහා රජයේ බීජ ගොවිපලවල් නගා සිටුවීම සහ නවීකරණය සඳහා රු. මිලියන 300 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

ණය

- බැංකු සහ මූල්‍යමය ආයතන විසින් කෘෂිකර්මාන්තයට ලබාදෙන ණය ප්‍රමාණය ඉහළ නැංවීමට හැකිවන පරිද්දෙන් බැංකු නීති සංශෝධනය කිරීමට මම යෝජනා කරනවා.

වී අලෙවි මණ්ඩලය සහ සහතික මිල

- වී සහ සහල් මිලට ගැනීම සඳහා ගබඩා පහසුකම් සහ අලෙවිකරණ ජාලයක් ඇති කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය සහ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කරනු ඇති. මේ සඳහා දිසාපතිවරුන්ට මහභාණ්ඩාගාරය විසින් මේ වන විටත් ලබාදී ඇති රුපියල් මිලියන 2000 ක අත්තිකාරම් මුදල් චක්‍රීය අරමුදලක් වශයෙන් යොදාගනු ඇති.
- ඊළඟ කන්නයේදී වී කිලෝ 1 ක් සඳහා නිෂ්පාදකයාගේ මිල රු. 16.50-17.50 අතර ඉහළ නංවනු ඇති.

විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදිත කලාප

- අන්නාසි, මැංගුස්, දූරියන් වැනි විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදිතවල අලෙවිකරණ හැකියාව හා එකතු කළ අගය ප්‍රවර්ධනය කිරීමට භෝග කලාප පිහිටුවීම සඳහා රුපියල් මිලියන 160 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

කාබනික කෘෂිකාර්මාන්තය

- කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික කාබනික ප්‍රමිති සහ සහතිකි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 415 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

බදු සහන

- කෘෂිකර්මාන්තය සහ කෘෂිකාර්මික සැකසුම් බදුවලින් නිදහස් කෙරෙනු ඇති.
- පළතුරු, එළවළු සහ අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන අංශයන් ප්‍රවර්ධනය කිරීම සඳහා එම අපනයන ආදායම් ඉපයුම් මත පනවා ඇති සියයට 15 ක ආදායම් බද්ද ඉවත් කිරීමට ද මම යෝජනා කරනවා.

## XIII. වැවිලි කර්මාන්තය

ගරු කථානායකතුමනි,

- තේ, රබර් සහ පොල් වගා සංවර්ධන ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම සඳහා රුපියල් බිලියන 10 ක චක්‍රීය අරමුදලක් පිහිටුවීමට මම යෝජනා කරනවා.
- තේ, රබර් සහ පොල් නැවත වගා කිරීමේ සහ අළුතෙන් වගා කිරීමේ සහනාධාරය සියයට 25 කින් ඉහළ නැංවීමට මම යෝජනා කරනවා.

- මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් හෙක්ටයාර් 20,000 ක් වගා කිරීමටත්, තෝරාගත් දිස්ත්‍රික්කවල පොල් වගා කිරීමටත් මම යෝජනා කරනවා.
- කන්තලේ සහ හිගුරාන උක් වගාව සහ සැකසුම් මාස 03 ක් ඇතුළත ආරම්භ කරනු ඇති.
- කජු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ ගුණාත්වයේ යුත් බීජ පැල තවාන් පිහිටුවනු ඇති.
- එසේම කජු වගාව ධෛර්යමත් කිරීම සඳහා නව දිරිදීමනා ද සපයනු ඇති.
- තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්තශාලා මත පනවා තිබූ ආර්ථික සේවා ගාස්තුව සියයට 1 සිට සියයට 0.5 දක්වා අඩු කිරීමට මම යෝජනා කරනවා.
- වැවිලි භෝග සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 700 ක් වෙන් කරනු ඇති.

XIV. **පශු සම්පත්**

ගරු කථානායකතුමනි,

- කිරි සැකසුම් යන්ත්‍රෝපකරණ තීරු බදු ගෙවීමෙන් සහ එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කිරීමට මම යෝජනා කරනවා.
- කිරි ගොවීන්ට උසස් තත්ත්වයේ කිරි දෙනුන් ලබා ගැනීම සඳහා විශේෂ සහන ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීමටද මම යෝජනා කරනවා.
- අපගේ කිරි ගොවීන්ට ලාභදායි මිලක් ලබාදීම සඳහා කිරි නිෂ්පාදකයන්ට ලීටරයකට ගෙවන මිල රු. 25 - 30 දක්වා වැඩි කිරීමට මම යෝජනා කරනවා. තවද, දැනට ආනයන කිරිපිටි සඳහා වන බදු සහන ක්‍රමයෙන් ඉවත් කරනු ඇති.

XV. **මහවැලි**

ගරු කථානායකතුමනි,

- ඉහළ ගුණත්වයෙන් යුතු සහල් කෙටීම ඇතුළුව කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට මහවැලි කලාපයේ සුළු හා මධ්‍ය පර්මාණ ව්‍යවසායන් 500 ක් සඳහා විශේෂිත සුළු හා මධ්‍ය පර්මාණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ඇති.
- මධ්‍යගත නගරයක් ලෙස දඹුල්ල නගර සංවර්ධන වැඩසටහනට ප්‍රමුඛත්වය ලබාදීමට මම යෝජනා කරනවා. ආරම්භක සංවර්ධන කාර්යයන් සඳහා රුපියල් මිලියන 200 ක් වෙන් කෙරෙනු ඇති.

XVI. **ධීවර**

ගරු කථානායකතුමනි,

- බහුදින යාත්‍රා සහ ධීවර නැව් නිෂ්පාදනය සහ විදේශ වෙළෙඳපොල සඳහා මසුන් ඇල්ලීම හා සාගර විශ්ව විද්‍යාල සංවර්ධනය සඳහා පුහුණු පහසුකම් ප්‍රවර්ධනය

කිරීමට රුපියල් මිලියන 700 කින් යුත් ධීවර ප්‍රවර්ධන අරමුදලක් පිහිටුවීමට මම යෝජනා කරනවා.

- පුත්තලම සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ඉස්සන් වගාව ප්‍රවර්ධනය කිරීමට රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.
- කොළඹ ශාන්ත ජෝන් මාළු වෙළඳ මධ්‍යස්ථානය අතිනවීන මත්ස්‍ය වෙළඳ සංකීර්ණයක් වශයෙන් පෑලියගොඩ ප්‍රදේශයේ පිහිටුවීමට මම යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කරනු ඇති.
- සුරතල් මත්ස්‍ය ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම උදෙසා සුරතල් මත්ස්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවීමට රුපියල් මිලියන 50 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

## XVII. රෙදිපිළි සැකසුම් කර්මාන්තය

ගරු කථානායකතුමනි,

- රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා ලියාපදිංචි වී ඇති දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් විසින් නොගෙවූ ණය කපා හැරීම සඳහා රුපියල් මිලියන 350 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.
- දේශීය එකතු කළ අගය ප්‍රවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩල දිරිදීමනා සහිතව මහා පරිමාණ රෙදිපිළි කර්මාන්තශාලා ආරම්භ කිරීම සඳහා තුල්හිරිය සහ හොරණ විශේෂිත රෙදිපිළි කලාප පිහිටුවීමට මම යෝජනා කරනවා.
- ඇඟළුම් සහ රෙදිපිළි කර්මාන්තය සඳහා වෘත්තීය කළමනාකරුවන්, සුදුසුකම්ලත් සේවා සපයන්නන් සහ පුහුණු ශ්‍රමිකයන් පුහුණු කිරීම් සඳහා 2006 වර්ෂයේදී රුපියල් මිලියන 250 ක් වෙන් කිරීම මගින් තුල්හිරියේ රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳ විද්‍යායතනයක් පිහිටුවීමට මම යෝජනා කරනවා.
- කලාපීය ඇඟළුම් ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කටුනායක නව සුවිසල් වෙළඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට මම යෝජනා කරනවා.

## XVIII. කාන්තා දිරිය

ගරු කථානායකතුමනි,

- ගම්බද කාන්තාවන් 20,000 කට රැකියා අවස්ථා උදා කරලිය හැකි පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා, ඉහළ ගුණත්වයෙන් යුතු තෑගි භාණ්ඩ සහ අත්‍යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කරන ව්‍යවසායන් 250 කින් සමන්විත කේන්ද්‍රගත කණ්ඩායමක් පිහිටවනු ඇති. ආරම්භයක් ලෙස රුපියල් මිලියන 75 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා
- අත්‍යන්ත්‍ර රෙදිපිළි සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණය ආනයනය කිරීමේදී තීරුබදු සහ එකතුකළ අගය මත බදුවලින් නිදහස් කිරීමට මම යෝජනා කරනවා.

- අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කෙරෙන නූල් සහ සායම් සඳහා වන එකතුකළ අගය මත බද්ද ඉවත් කිරීමට මම යෝජනා කරනවා.

## XIX. ඉහළ ආදායම් තලයේ සංචාරක කටයුතු

ගරු කථානායකතුමනි,

- ත්‍රිකුණාමලය, හබරණ, පොලොන්නරුව යන ප්‍රදේශ පරිසර හිතකාමී සංචාරක කටයුතු සිදු කෙරෙන විශේෂිත ස්වාභාවික සංචාරක කලාප ලෙස සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

## XX. මුද්‍රණ හා ඇසුරුම් කර්මාන්තය

ගරු කථානායකතුමනි,

- දේශීය මුද්‍රණ හා ඇසුරුම් සේවයේ අධික පිරිවැය අඩුකර ගැනීම සඳහා සියළු වර්ගයේ ආනයනික කඩදාසි වල සියයට 15 ක් වන තීරුබදු අඩුකර ඇත.
- එසේම ඇසුරුම් ද්‍රව්‍යයන්ගේ ආනයන බදු අඩුකර ඇත.

## XXI. ප්‍රවාහනය

ගරු කථානායකතුමනි,

- පවත්නා බස්රථ වෙනුවට සහන පොලී ක්‍රමයක් යටතේ නව බස්රථ මිලදී ගැනීම සඳහා පෞද්ගලික බස් හිමියන් වෙනුවෙන් රුපියල් මිලියන 75 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.
- ක්ෂේත්‍ර නිලධාරින්ට, සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට, මාධ්‍යවේදීන්ට දරාගත හැකි මිලකට යතුරුපැදි ලබා ගැනීමට හැකිවන පරිදි සියයට 5-15 අතර වූ යතුරු පැදිවල නිෂ්පාදන බදු ප්‍රමාණය ඉවත් කර ඇත.
- ත්‍රීරෝද රථ ක්‍රියාකරුවන්ට සහනයක් සැලසීම සඳහා ත්‍රිරෝද ටයර්වල ආනයන තීරුබදු සියයට 28 සිට සියයට 15 දක්වා අඩුකර ඇත.

## XXII. ගම නැගුම

ගරු කථානායකතුමනි,

- ජනතා සහභාගිත්වයෙන් ගම් දියුණු කිරීමේ වැඩ සටහන් බල ගැන්වීම සඳහා රුපියල් මිලියන 1000 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.

## XXIII. ග්‍රාමීය විදුලි බලය සැපයීම පිණිස යළි උත්පාදනය කළහැකි බලශක්ති ඒකක

ගරු කථානායකතුමනි,

- ග්‍රාමීය නිවාස ලක්ෂ 3 කට ඉදිරි වසර 3 තුළ බලය නැවත උත්පාදනය කළ හැකි සෝලා වැනි බලශක්ති කට්ටල ලබාදීම පිණිස රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.

## XXIV.ඉදිකිරීම් කර්මාන්තය

ගරු කථානායකතුමනි,

- ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නවීන යන්ත්‍රසූත්‍ර ආනයනය සහනදායි අරමුදල් යටතේ සිදු කිරීම සඳහා ණය සුරැකුම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට මම යෝජනා කරමි. එම පොළී සහන වෙනුවෙන් රුපියල් මිලියන 200 ක් වෙන් කිරීමට ද මම යෝජනා කරනවා.
- මූලික වශයෙන් දැරීමට සිදුවන පිරිවැය අඩුකර ගැනීම සඳහා ඉදිකිරීමේ යන්ත්‍රෝපකරණ සඳහා වන රේගු බදු සහ එකතු කළ අගය මත බදු වලින් නිදහස් කරනු ඇති.
- දේශීය ඉදකිරීම් කර්මාන්තයේ උන්නතිය සඳහා "ලංකා පුත්‍ර ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන බැංකුව" පිහිටුවනු ඇති.
- දේශීය ලී මෝල්කරුවන්ට, ඉදිකිරීම් කර්මාන්තයට, ගෘහ භාණ්ඩ නිෂ්පාදකයන්ට රැකුලක් වශයෙන් සහ අපගේ ස්වාභාවික වනාන්තර ආරක්ෂා කර ගැනීමට ආනයනය කරන නොසැකසූ දැව කඳන් සඳහා එකතුකල අගය මත බද්ද ඉවත් කිරීමට මම යෝජනා කරනවා.

## XXV.පර්යේෂණ සහ සංවර්ධන

ගරු කථානායකතුමනි,

- විද්‍යාත්මක පර්යේෂණ සහ මොරටුව විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව පවතින නව සොයා ගැනීම් සඳහා පහසුකම් සපයන ජාලය වර්ධනය කිරීම සඳහා ජාතික පර්යේෂණ සභාවට රුපියල් මිලියන 300 ක් වෙන් කරනු ඇති.
- ආර්ථික සහ විදේශ සම්බන්ධතාවයන්හී ශක්‍යතා ගොඩනගා ගැනිම සඳහා සහ ප්‍රතිපත්ති පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 75 ක් වෙන් කරනු ඇති.
- කම්කරු සම්බන්ධතා පිළිබඳ අධ්‍යාපන කටයුතු පිණිස විද්‍යායතනයක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 50 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.
- බදුකරණය පිළිබඳ අවබෝධය ගුණාත්මක මට්ටමකට ගෙනඒම පිණිස බදු විද්‍යායතනයක් පිහිටුවීමට රුපියල් මිලියන 50 ක් වෙන් කරනු ඇති.
- පරිගණක භාවිතය ප්‍රචලිත කිරීමට සහ "නැණසල" වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා පරිගණක සහ උපාංග මත වන තීරුබදු ඉවත් කර ඇත.
- ජංගම දුරකථනවල මිල ගණන් අඩු කිරීම සඳහා ඒ මත පනවා තිබූ නිෂ්පාදන බදු ඉවත් කර ඇත.

## XXVI.බදු කරණය

ගරු කථානායකතුමනි, මගේ අයවැය කථාවේ අඩංගු සියළුම අයවැය යෝජනා I වන ඇමුණුමේ සවිස්තරව දක්වා ඇත. ඉන් ප්‍රධාන යෝජනා කීපයක් පහත සඳහන් කරමි.

- සැලකිය යුතු ලෙස බැංකු වල ලාභය වර්ධනය වී ඇති බැවින් මූල්‍ය සේවා මත අයකරන එකතු කළ අගය මත බද්ද සියයට 20 ක් තලයෙහි තබනු ඇත. අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 2700 කි.
- වර්තමානයේ ඇතැම් බදු ගෙවන්නන් විසින් එකතු කළ අගය මත බද්ද ගෙවිය යුතු වන්නේ තුන් මසකිනි. රජයේ මුදල් ප්‍රවාහය වඩාත් වර්ධනය කරනු සඳහා මාසිකව බදු ගෙවන ලෙස ඔවුනට නියම කරනු ඇති. මෙමගින් ඉහළ නංවා ඇති අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 1500 ක්
- සමාගම් බදු අනුපාතය සියයට 35 ක පොදු මට්ටමක පවත්වාගෙන යනු ඇති. කොටස් වෙළඳ පොලේ ලැයිස්තු ගත සමාගම් සඳහා දැනට ලැබෙන සහනදායි බදු අනුපාතය ලැයිස්තුගත කිරීමේ දින සිට වසර 5 කට සීමා කරනු ඇති. මෙම ප්‍රතිශෝධනය තුළින් රුපියල් මිලියන 2600 ක ආදායමක් බලාපොරොත්තු වෙනවා.
- පැවරුම් මිල කරණය හා පටු ප්‍රාග්ධනායනය ක්‍රියාදාමයන් තුල පවත්නා සංකීර්ණතා මගහැරීම තුළින් බදුකරණය ශක්තිමත් කිරීමට මම යෝජනා කරනවා. මේ තුළින් බදු ආදායම රුපියල් මිලියන 550 කින් ඉහළ යනු ඇති.
- ළමුන් සඳහා වන ජාතික ක්‍රියාකාර සැලැස්ම ඵලගැන්වීම සඳහා රුපියල් මිලියන 1000 ක් උපයා ගැනීම පිණිස සමාජ වගකීම් බද්ද සියයට 0.25 සිට සියයට 1 දක්වා වැඩි කරනු ඇති.
- වරාය හා ගුවන් කටයුතුවල සංවර්ධන බද්දට, හරබද්දට සහ කොටස් වෙළඳ පොලේ ගනුදෙණුවලට අදාල ලියකියවිලි හැර අනෙකුත් ලියකියවිලි මත මුද්දර බද්ද යළි හඳුන්වා දෙනවා. මේ තුළින් රුපියල් මිලියන 3700 ක් ජනනය වේ යැයි අපේක්ෂා කෙරෙනවා.
- භාණ්ඩ බෙදාහරින්නට සහ කුඩා තේ කර්මාන්තශාලා හිමියන් හට සහන සපයා දෙමින් ආර්ථික සේවා බදු ප්‍රතිශෝධනය කරනවා. එමගින් රුපියල් මිලියන 1000 ක ආදායමක් බලාපොරොත්තු වෙනවා.
- සජීවී විකාශනය කරණු ලබන මධ්‍යස්ථාන සඳහා රුපියල් ලක්ෂ 3 ක් දක්වා සහ සජීවී විකාශය නොකරන මධ්‍යස්ථාන සඳහා රුපියල් 50,000 දක්වා ඔට්ටු සහ සූදු බදු ඉහළ නංවනවා. කැසිනෝ වැනි සූදු සහ ස්වයංක්‍රීය ලොතරැයි ව්‍යාපාර වල ආදායම සහ අදාල වන අදායම් බදු අනු ප්‍රමාණය සියයට 40 ක තලයෙහි තබනු ඇති. අවුරුදු 5 ක් ඇතුළත මේ මධ්‍යස්ථාන කොළඹින් පිටත ඒ සඳහා සුදුසු තෝරාගත් ප්‍රදේශවලට ගෙන යනු ඇති. මේ ක්‍රියාමාර්ග තුළින් රුපියල් මිලියන 300 ක ආදායමක් අපේක්ෂා කෙරෙනවා.

- යථාවත් වෙළඳ ආන්තිකයක් ලබාගැනීමට හැකි ආකාරයේ මිල, රක්ෂණය සහ ගැල්කුළී පිරිවැය මත අයකරන, එකතු කල අගය බද්ද සියයට 7 ක් ලෙස ප්‍රතිශෝධනය කරනවා. රුපියල් මිලියන 2000 ක් මෙමගින් අපේක්ෂා කෙරෙනවා.
- ඇතැම් භාණ්ඩ මත පනවා ඇති රේගු බදු සහ සෙස් බදු ප්‍රතිශෝධනය කර ඇති අතර, ඒ සඳහා වු ගැසට් පත්‍ර දැනටමත් පළ කොට තිබෙනවා. එමගින් බලාපොරොත්තු වන ආදායම රුපියල් මිලියන 3500 ක් පමණ වෙනවා.
- අපනයනය කිරීමට, ආනයනය කරනු ලබන භාණ්ඩ හැර අනෙකුත් භාණ්ඩ සඳහා පවත්නා සියයට 1.5 ක වරාය සහ ගුවන් තොටුපල බදු සියයට 2.5 දක්වා ඉහළ නංවා ඇත. මෙම ක්‍රියාදාමය මගින් රුපියල් මිලියන 2500 ක ආදායමක් අපේකෂා කෙරෙනවා.
- 2005 නොවැම්බර් 08 වන දින වැඩි කරන ලද නිෂ්පාදන බදු ප්‍රමාණයට අමතරව මත්පැන් මත සහ සිගරට් මත බදු මචිසින් තවදුරටත් වැඩි කර තිබෙනවා. මෙම ප්‍රතිශෝධන දෙක මගින් රුපියල් මිලියන 4300 ක ආදායමක් ලැබෙනවා. එසේම මත්පැන් අලෙවිහල් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු සියයට 50 කින් ඉහළ දැමීමට ද යෝජනා කරනවා. එමගින් රුපියල් මිලියන 400 ක ආදායමක් මා බලාපොරොත්තු වෙනවා.
- දැනට සියයට 30 කින් බදු අයකරන ආදායම් ප්‍රමාණය රුපියල් ලක්ෂ පහකට සීමාකර අතිරික්තය සඳහා සියයට 35 ක අනු ප්‍රමාණයක් ඇති කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව පුද්ගල බදුකරණය වඩාත් තීව්‍ර ලෙස ප්‍රතිගතික කරණය කරනු ඇති. එසේම ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශිකයන් සඳහා ද යම් ගැලපුම් යොදා ගැනීමට මම යෝජනා කරනවා. එම ප්‍රතිශෝධන මගින් රුපියල් මිලියන 450 ක් අපේක්ෂා කෙරෙනවා. අනේවාසිකයන් සඳහා කෙරෙන මෙම බදු ගැලපීමේදී රුපියල් මිලියන 150 ක අතිරේක ආදායමක් උපයා දෙනවා ඇති.
- විවිධ බදු පරිපාලන ක්‍රියාදාමයන් තුලින් බලාපොරොත්තු වන අතිරේක ආදායම රුපියල් මිලියන 1750 ක් වන අතර එම ක්‍රියාමාර්ග ඇමුණුම් I හි දක්වා ඇත.

## XXVII.රාජ්‍ය සේවක වැටුප්

ගරු කථානායකතුමනි,

- පොලිසියේ හා හමුදා සාමාජිකයන් ඇතුළුව සියළු රජයේ සේවකයන්හට රුපියල් 1000 ක මාසික ජීවන වියදම් දීමනාවක් 2006 ජනවාරි මස සිට ගෙවීමට මම යෝජනා කරනවා. ජීවන වියදම් දර්ශකය අනුව එක් අංකයකට රුපියල් 2.50 බැගින් ගණන් බලා සෑම 6 මසකට වරක් ඊට ගැලපුම් කරනවා.

- පරිපාලනය පිළිබඳ ජාතික සභාව අනුමත කල වැටුප් ව්‍යුහය 2006 ජනවාරි මස සිට ක්‍රියාත්මක කරනවා. කෙසේ වුවද, මෙම වැඩිවීමෙන් සියයට 50 ක් 2006 වර්ෂයේද, ඉතිරිය 2007 වර්ෂයේද ගෙවනු ඇති. ඉහත ක්‍රියාමාර්ග දෙක තුලින් රුපියල් 1300 ක අවම වැටුප් වැඩිවීමක් 2006 ජනවාරි මස සිට සිදුවන බව තහවුරු කරනවා. මෙම වැටුප් වැඩිවීම I ඇමුණුමෙහි I වගුවේ දක්වා ඇත. මෙම වැටුප් ගැලපීම සඳහා අයවැය ප්‍රතිපාදන රුපියල් මිලියන 9600 ක් වෙන් කරනු ඇති.
- පොලිසියේ සහ හමුදා සාමාජිකයන් ඇතුළු සියළු රජයේ සේවකයන් ඔවුන් විසින් ප්‍රයෝජනයට නොගත් නිවාඩු උපරිම වශයෙන් දින 30 ක් දක්වා සෑම වසරකම මුදල් කර ගැනීමට අවස්ථාව ලබා දෙනවා. රාජ්‍ය සේවකයකු පියකු වන විට ඔවුනට දින 3 ක විශේෂ නිවාඩුවක් ලබා දෙනවා.
- රජයේ සේවකයන් හට බැංකු ක්ෂේත්‍රය හරහා ලබාදෙන නිවාස ණය යෝජනා ක්‍රමය පොලිසියේ සහ ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන අතර, උපරිමය වසර 7 ක වැටුපකට යටත්ව රුපියල් ලක්ෂ 30 දක්වා ඉහළ නංවනු ලබනවා. වාහන මිළදී ගැනීම සඳහා ද රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ණය පහසුකම් 2006 වසරේ සිට බැංකු ක්‍රමය මගින් ලබා දෙනු ඇති.
- සුදුසුකම් ලබන රජයේ නිලධාරීන්ට එන්ජින් ධාරිතාවය CC 1500 කට වඩා අඩු පෙට්‍රල් වාහන මිළදී ගැනීමට සහනදායි සියයට 25 ක තීරුබද්දක් ලබාදීමට මම යෝජනා කරනවා. තෙල් සහනාධාර සහ පාරිසරික පිරිවැය සැලකිල්ලට ගෙන ඩීසල් වාහන සියයට 40 ක තීරු බද්දකට යටත් කෙරෙනවා.

XXVIII. **විශ්‍රාමිකයන්**

ගරු කථානායකතුමනි,

- සියළුම විශ්‍රාමිකයන්ට රු. 500/- ක ජීවන වියදම් දීමනාවක් ලබාදීමටත් රජයේ සේවකයන්ට මෙන් එය සෑම 6 මසකට වරක්ම ගැලපීම් කිරීමටත් මම යෝජනා කරනවා.
- අඩු නොකළ විශ්‍රාම වැටුපෙන් සියයට 10 ක වැඩිවීමක්, රු. 500/- ක අවමයකට සහ රු. 1,250/- උපරිමයකට යටත්ව 2006.01.01 දින සිට මාසිකව ලබාදීමට මම යෝජනා කරනවා. එම නිසා මෙම වෙනස්කම් තුළින් සියළු විශ්‍රාමිකයන් හට අවම වශයෙන් මසකට රු. 1,000/- ක වැඩිවීමක් හිමිවනු ඇති.
- 1997.01.01 දිනට පෙර විශ්‍රාම ගිය අයටද 06/2004 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සපයා තිබූ ප්‍රතිලාභ ලබාදීමට මම යෝජනා කරනවා. කෙසේ වුවද, හිඟ මුදල් හිමිකමකින් තොරව මෙම වැඩිවීමෙන් සියයට 50 ක් 2006 වර්ෂයේදී ද ඉතිරිය 2007 වර්ෂයේදී ද ගෙවනු ඇති. මේ සඳහා රුපියල් මිලියන 4,500 ක් වෙන් කෙරෙනු ඇති.

**XXIX.අපරාධ වැළැක්වීම.**

ගරු කථානායකතුමනි,

- මහජන සම්බන්ධතා පොලිස් සේවය ප්‍රවර්ධනය කිරීමට සහ නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා විද්‍යුත් ආවේක්ෂණ පද්ධතියක් කොළඹ හා සමුද්‍ර ආවේක්ෂණ යාන්ත්‍රණයක් පිහිටුවීමට පොලිස් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 900 ක විශේෂ වෙන් කිරීමක් සිදු කරනු ඇති.

**XXX.ආපදා අවදානම් කළමනාකරණය**

ගරු කථානායකතුමනි,

- ස්වාභාවික ආපදා අවදානම් ඉහළයාමේ තත්ත්වයක් තුළදී ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට රු. මිලියන 200 ක් සහ කාලගුණ විද්‍යා නිරීක්ෂණ රේඩාර් පද්ධතියක් සංවර්ධනය කිරීමට රු. මිලියන 400 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

**XXXI.පොදු අරමුදල් කළමනාකරණය**

ගරු කථානායකතුමනි,

- ඵලදායි ආකාරයෙන් අවසරලත් අරමුණුවලට කාර්යක්ෂම ලෙස අරමුදල් යොදා ගැනීම තහවුරු කිරීම පිණිස පොදු අරමුදල් සඳහා විශේෂ කළමනාකරණ කමිටු පත් කරනවා.

**XXXII.අග්‍රහාර රක්ෂණ භාරය**

ගරු කථානායකතුමනි,

- රාජ්‍ය සේවකයින්, විශ්‍රාමිකයන් සහ විදේශ රැකියා ලාභීන් සඳහා වූ රක්ෂණ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීමට නව රක්ෂණ භාරයක් පිහිටුවනවා. පොලිසිය සහ යුධ හමුදාවන්හි සාමාජිකයන් ඇතුළු රාජ්‍ය සේවකයන්ගෙන් සහ විශ්‍රාමිකයන්ගෙන් එකතු කර ගන්නා රක්ෂණ වාරිකය මෙම අරමුදලට බැර කෙරෙනවා.

26. ගරු කථානායකතුමනි, උතුර හා නැගෙනහිර සංවර්ධනය කිරීම වෙනුවෙන් ඊළඟ වසර 3 සඳහා ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 650 ක් විවිධ ව්‍යාපෘති වෙනුවෙන් විදේශාධාර අනුමත කර තිබෙනවා. මේ ප්‍රදේශවල ජනයාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට රජයේ අරමුදල් මගින් වසරකට රුපියල් බිලියන 4.5 පමණ පමණක් ද සපයනු ඇති. මෙම ව්‍යාපෘති බොහොමයක් අදාල වන්නේ මේ ප්‍රදේශවල ජනයාගේ ජීවන තත්ත්වය ඵලදායීව නගා සිටුවීමට අවශ්‍ය සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙන්ම නිවාස, මහාමාර්ග ප්‍රතිසංස්කරණය සහ වාරිමාර්ග, විදුලිබල, ප්‍රවාහනය පුනරුත්ථාපනය කිරීම සඳහායි. කෙසේ වෙතත් සාමයේ ප්‍රතිලාභ ජනතාවට ලබාදීමට මෙම ප්‍රදේශවල ලබා ඇති ප්‍රගතිය ප්‍රමාණවත් නොවන බව පෙනී යනවා. එහෙයින්, විශේෂ අවධානයකින් යුක්තව උතුර සහ නැගෙනහිර සංවර්ධන කාර්යයන් වේගවත් කිරීමට මම යෝජනා කරනවා. මෙම කර්තව්‍යය සඳහා ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන අධිකාරිය කැපවනු ඇති.

27. ගරු කථානායකතුමනි, මේ අයවැය ලේඛනයේ ඇතුළත් එක් වැදගත් දිරිගැන්වීමේ යෝජනාවක් සම්බන්ධව මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට මම කැමතියි. කර්මාන්ත සංවර්ධනය කොළඹ සහ ගම්පහ ප්‍රදේශවලින් පිට ප්‍රදේශයන්හි පුළුල් කිරීම සඳහා සහ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් පාසාම එක් කර්මාන්ත ශාලාව බැගින් ස්ථාපනය කිරීම දිරිගැන්වීමට එසේ කොළඹ සහ ගම්පහ ප්‍රදේශවලින් පිටත කරන ආයෝජන වසර 5-10 දක්වා බදු විරාමයක් ලබාදීමට මම යෝජනා කරනවා. ඔවුන්ගේ ආයෝජන සඳහා ද ආදායම් බදු සහන ලබනු ඇති. එවැනි ආයෝජන ව්‍යාපෘති සඳහා ආනයනය කරන සියළු යන්ත්‍රෝපකරණ ද රේගු බද්දෙන් හා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වෙනවා. එවැනි ප්‍රදේශවලට කර්මාන්ත නැවත ස්ථානගත කරන්නන්ට ද ඒ හා සමාන සහන ලැබෙනවා. උසස් තාක්ෂණය යොදා ගන්නා කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායයන් දිරිමත් කිරීම උදෙසා ඔවුන්ටද යන්ත්‍රෝපකරණ බදු නිදහස්ව ආනයනය කිරීමට හැකිවනු ඇති. තවද සෞඛ්‍ය ආරක්ෂණ, මුද්‍රණ කර්මාන්තය, මැණික් කැපීම සහ ඔපදැමීම, ඇසුරුම් සහ සහල් සැකසුම් යන ක්ෂේත්‍රයන්හී කර්මාන්ත සඳහා වන ක්ෂයවීම් ගණනය කරන දීමනා 1/3 දක්වා ඉහල දමනු ලබනවා. දේශීයව නිපදවන එකතු කළ වටිනාකම සියයට 30 ට වැඩි මෝටර් රථ සඳහා පවතින නිෂ්පාදන බද්ද ඉවත් කර තිබෙනවා. එහෙයින් මෙම කර්මාන්තයන්හී ආයෝජනය කරන ව්‍යාපාරික ප්‍රජාවට මෙම දිරිගැන්වීම් යොදාගනිමින් සිය ආයෝජන වර්ධනය කර උතුරු හා නැගෙනහිර ප්‍රදේශ හා සුනාමියෙන් හානි වූ ප්‍රදේශ ද ඇතුලත්ව ග්‍රාමීය ආර්ථික දියුණු කිරීමට කටයුතු කරන්න මම ආරාධනය කර සිටිනවා. මෙමගින් කර්මාන්ත 300 ක් ඉතා ඉක්මණින් දිවයින පුරා ආරම්භ කිරීමට මා අදහස් කරනවා.

28. ගරු කථානායකතුමනි, එසේම මෙම අයවැය මගින් මෙරටේ වෘත්තිකයන්ට සිය වෘත්තීය කටයුතු මගින් විදේශ විනිමය උපයා ගැනීමට දිරි ගැන්වීම් පිරිනැමීම ද සිදු කරනවා. ඔවුන්ගේ විදේශ ආදායම් බදුවලින් නිදහස් කරනවා. අප රටට ප්‍රතිලාභ අත්වන පරිදි විදේශයන්හී ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට හා වෘත්තිකයන්ට ආයෝජනය කිරීමට වසර 3-5 අතර කාලය තුළ කල් පිරෙන විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කෙරෙන භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට ද මම යෝජනා කරනවා. ඔවුන්ගේ අභිමතය පරිදි තීරුබදු සහන සහිත වාහන ආනයනය කිරීමට ඔවුන් හිමිකම් පානු ඇති. ඒ නිසා පිටරට වෙසෙන වෘත්තිකයන්ට හා ශ්‍රී ලාංකිකයන්ට මෙම පෙළඹවීම් ප්‍රයෝජනයට ගෙන නව ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට මවිසින් දරන ප්‍රයත්නයට අත්වැල් සපයන මෙන් මම ආරාධනය කර සිටිනවා.

29. ගරු කථානායකතුමනි, මෙම අයවැය මගින් සහන පිරිනමා ඇත්තේ අත්‍යාවශ්‍යයෙන්ම ඒවා ලැබිය යුතුම අය වෙතයි. පොහොර සහනාධාරය යොමු වන්නේ අනෙකුත් කෘෂි නිෂ්පාදනවලට වඩා බොහෝ අඩු ආදායම් ලබන වී සහ එළවළු ගොවීන් හටයි. පෝෂ්‍යදායී ආහාර සහ ඊට අදාළ අනෙකුත් සහනයන් ඉලක්ක ගත කර ඇත්තේ ද එවැනි සහන හිමි විය යුතු ආබාධිතයන්, මව්වරුන් හා දරුවන් වැනි ජනකොටස් වලටයි. ඉන්ධන සහනාධාරය ත්‍රීරෝද රථ ධාවකයන්, ධීවරයන්ට හා පොදු ප්‍රවාහන සේවාවන්ට පමණක් යොමු කෙරෙනු ඇත. එමගින් මේ සඳහා වෙන් කෙරුනු රුපියල් මිලියන 3000 ක් පමණ වූ සහනාධාරය අඩු ආදායම් ලබන කොටස් සඳහාම ඉලක්ක කෙරෙනු ඇත. ගොවිතැන් වලට සහ විශේෂයෙන්ම අඩු සංවර්ධිත දිස්ත්‍රික්කයන්හී දිළිඳුභාවය තුරන් කිරීමට මව්වරුන් හා දරුවන් සඳහා වන වැඩසටහන් ආදිය සඳහා අවශ්‍ය අමතර ආදායම් උපයා ගැනීම පිණිස මෙම

ගරු සභාවට පසුගිය නොවැම්බර් 8 දා ඉදිරිපත් කළ ආදායම් යෝජනාවලට අමතරව අළුත් ආදායම් මාර්ග මෙම අයවැයට මම ඇතුළත් කර තියෙනවා. අනෙක් අතට ඇතැම් තෝරාගත් වැය ශීර්ෂවල වෙන් කිරීම් සිය ශක්‍යතා මට්ටමට වඩා තරමක් ඉහළ බව මහභාණ්ඩාගාරය නිරීක්ෂණය කර තිබෙනවා. එම නිසා රාජ්‍ය ආයෝජන වලින් සියයට 6 ක් පමණ වන එම වියදම් ප්‍රමාණය අත්හිටුවා තබා ගැනීමට කටයුතු කරනු ඇති. ඒ අනුව සුනාමි වැය ඇතුළත් නොවන අයවැය හිඟය ඇමුණුම් III දක්වා ඇති පරිදි රුපියල් බිලියන 197.3 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 7.3 කි. 2008 වන විට මෙම හිඟය සියයට 5 ක මට්ටමට ලඟා වෙනු ඇති. එසේම ඒ වන විට රජයේ ආදායම ද දළ ජාතික නිෂ්පාදනයේ සියයට 19 ක් දක්වා ඉහළ යනු ඇති.

30. ගරු කථානායකතුමනි, ජාතික ආර්ථිකයක් ගොඩ නගා නව ශ්‍රී ලංකාවක් බිහි කරමින් ජාතියක් වශයෙන් නැගී සිටීමට දැවැන්ත සංවර්ධන වැඩසටහනක් අප දැන් දියත් කර තිබෙනවා. එසේම උතුරු සහ නැගෙනහිර පලාත් මෙන්ම සුනාමියෙන් හානියට පත් වෙරළබඩ තීරයේ ජනතාව දැඩි අසීරුතාවන්ට භාජනය වී ඇති හෙයින් ඔවුන් වෙත අපගේ සුවිශේෂ අවධානය ද යොමු විය යුතුයි. ගොවීන්, ධීවරයන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, කම්කරුවන්, කර්මාන්තකරුවන්, ව්‍යාපාරික ප්‍රජාව, සිවිල් සමාජය සහ අප සියළුම දෙනා මහත් දිරියෙන් වැඩකොට අපගේ දරුවන් වෙනුවෙන් යහපත් අනාගතයක් බිහි කිරීම සඳහා කැපවිය යුතුයි. අපේ රට ගොඩ නැගීමේ උදාර කර්තව්‍යයේදී මා සමග එක්වන ලෙස විරුද්ධ පක්ෂයේ සියළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ද මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා.

31. ගරු කථානායකතුමනි, මා මෙම අයවැය කථාව අවසාන කිරීමට ප්‍රථම මා සමඟ වෙහෙස නොබලා මෙම අයවැය ලේඛනය පිළියෙල කළ භාණ්ඩාගාර ලේකම් ඇතුළු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ට මම ස්තුතිය පුද කිරීමට කැමතියි.

**ඔබ සැමට ස්තුතියි !**

ඇමුණුම I

## අයවැය යෝජනා

### 01. ආගමික සංවර්ධනය

. දරුවන් තුළ ආගමික ගුණධර්ම ප්‍රගුණ කිරීම තුළින් දැහැමි සමාජයක් ඇති කිරීමට මාගේ රජය විසින් ඉහළතම ප්‍රමුඛත්වයක් ලබා දෙයි. මේ සඳහා නේවාසික පුහුණු පාඨමාලා තුළින් සියළු ආගම්වල ආගමික/දහම් පාසල් ගුරුවරුන්ගේ ඉගැන්වීමේ කුසලතා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. එවිට ඔවුන්ගේ දැනුම වඩාත් කාර්යක්ෂමව දරුවන් වෙත ලබා දිය හැකිය. විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල පිහිටි බොහෝ ආගමික ස්ථාන මුදල් නොමැතිකම නිසා නොසලකා හැර ඇත. ඒවා යථා තත්ත්වයට පත් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් දිරිගැන්වීම් ලබා දෙනු ඇත.

(අ) සෑම ගුරුවරයෙකුටම ඉගැන්වීම සඳහා අවශ්‍යය පොත් මිලදී ගැනීමට රුපියල් 2000 ක වාර්ෂික දීමනාවක් ලබා දෙනු ඇත.

(ආ) විශේෂ ආගමික වැදගත්කමකින් යුත් ආගමික සිද්ධස්ථාන සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදන වෙන් කරනු ඇත.

### 02. කලාව සහ සංස්කෘතිය

ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ පොහොසත් බව සහ විවිධත්වය සැලකිල්ලට ගෙන අපගේ පාරම්පරික රංගන කලාව සංවර්ධනයේ කොටසක් ලෙස කලාව හා සංස්කෘතිය තවදුරටත් පෝෂණය කරනු පිණිස පහත සඳහන් සහන යෝජනා කෙරේ.

(අ) ටවර් හෝල් රඟහල පදනම, පොළී ආදායම මත රඳවා ගැනීමේ බදු ඇතුළු සියළු ආදායම් බදුවලින් සහ පදනම විසින් සපයනු ලබන සේවා වැට් බදු ගෙවීමෙන් නිදහස් කරනු ඇත.

(ආ) සියළුම කලාකරුවන්ට මිත්‍ර ශීලී පරිසරයක් යටතේ නිර්මාණ සිදු කිරීමට සහ පර්යේෂණ සහ අනෙකුත් අධ්‍යයන කටයුතුවල යෙදීමට කඳුකරයේ කලා නිකේතනයක් ඉදිකරනු ඇත. මේ සඳහා 2006 අයවැය මගින් රුපියල් මිලියන 50 ක් වෙන් කිරීමට යෝජනා කරනු ලැබේ.

(ඈ) යුනෙස්කෝවේ සහයෝගය ඇතිව ජාතික චිත්‍රපට ඇකඩමියක් පිහිටු වනු ඇත.

(ඇ) චීන රජයේ ආධාර ඇතිව නවීන රංගන ශාලාවක් කොළඹ ඉදිකරනු ඇත.

(ඉ) දේශීය චිත්‍රපට හා ටෙලි නාට්‍ය කර්මාන්තය දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකාවේ රූපවාහිනී මධ්‍යස්ථාන මගින් විකාශනය කරනු ලබන අධ්‍යාපනික වාර්තාමය වැඩ සටහන් හැර අනෙකුත් සෑම විදේශීය ටෙලි නාට්‍යයක් සහ විදේශීය චිත්‍රපටයක් සඳහා රුපියල් 75,000 ක බද්දක් පැනවීම. මෙම බද්ද මගින් ලැබෙන ආදායම දේශීය චිත්‍රපට සහ ටෙලි නාට්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා කැපවුණ අරමුදලකට බැර කරනු ඇත.

## 03. මාධ්‍යවේදීන් සඳහා දිරි ගැන්වීම්

ජනසංනිවේදනයේ සහ පුවත්පත් කලාවේ ශ්‍රී ලාංකීය අගයන් සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට මාධ්‍යවේදීන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන්ගේ හැකියාවන් වර්ධනය සහ පුවත්පත් කලාවේ වෘත්තීයමය දියුණුව සඳහා ඇති ඉඩප්‍රස්ථා පුළුල් කිරීමට පහත සඳහන් දිරි ගැන්වීම් ලබා දෙනු ඇත.

(අ) පරිගණක, මාධ්‍ය උපකරණ හා යතුරු පැදි මිලදී ගැනීමට සහනදායි ණය පහසුකම් ලබා දෙන අතර එය තීරු බදු හා වැට් බදු ගෙවීමෙන් නිදහස් කරනු ඇත.

(ආ) තරුණ මාධ්‍යවේදීන්ට අධ්‍යයන ආයතන මගින් ඔවුන්ගේ වෘත්තීය නිපුණතා දියුණු කර ගැනීමට මූල්‍යමය ආධාර සපයනු ඇත.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වියදම් පියවා ගැනීම පිණිස තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට රුපියල් මිලියන 75 ක් වෙන් කරනු ඇත.

## 04. මව්වරුන් සහ දරුවන්

මව්වරුන් සහ දරුවන් සඳහා රජය සුවිශේෂ අවධානයක් යොමු කරයි. මව්වරුන් සහ දරුවනගේ පෝෂණ ඌනතා මෙන්ම සුනාමියෙන් සහ ගැටුම්වලින් පීඩාවට පත් දරුවන් ද සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ක්‍රියා මාර්ග යෝජනා කෙරේ.

(අ) ගර්භනී මව්වරුන් සඳහා අය කිරීමකින් තොරව පෝෂ්‍යදායී ආහාර සමඟ ග්‍රාමීය රෝහල් මගින් වෛද්‍ය උපදේශනය සහ අදාළ සේවාවන් සපයනු ඇත.

(ආ) අළුත උපන් දරුවන්ට වයස අවු. 5 දක්වා කිරිපිටි මිලදී ගැනීම සඳහා රුපියල් 200 ක මාසික දීමනාවක් ලබා දෙනු ඇත.

(ඇ) අඩු වරප්‍රසාද සහිත පාසල්වල දරුවන් සඳහා ආහාර වේලක් ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරනු ඇත.

(ඈ) සුනාමි ව්‍යසනය හා උතුරු නැගෙනහිර අර්බුදය හේතුවෙන් දෙමාපියන් අහිමි වූ සෑම දරුවෙකුම සඳහා "සෙනෙහස" බැංකු ගිණුමක් ආරම්භ කරනු ඇත. මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන එවැනි ගිණුම්වලට සෑම මසකම රුපියල් 1,500 බැගින් බැර කරනු ලැබේ.

සංගනන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම ලබා දී ඇති දරිද්‍රතා දර්ශකය අනුව අදාළ ග්‍රාමීය රෝහල් සහ පාසල් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. එබඳු අඩු වරප්‍රසාද සහිත ප්‍රදේශවල සුදුසුකම් ලබන දරුවන් සඳහා විශේෂ

ළමා සුරැකුම් වැඩ සටහනක් සැලසුම් කිරීමට සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවල වෘත්තිකයින්ට ඇරයුම් කරනු ලැබේ. 2006 වර්ෂය සඳහා දැනටමත් වෙන්කර ඇති රුපියල් මිලියන 1,000 ට අමතරව තවත් රුපියල් මිලියන 1,500 ක් වෙන් කරනු ඇත.

05. **ළමා, විවිධ හැකියාවන් ඇති ආබාධිත අය සහ වැඩිහිටි අය සඳහා වන නිවාස සඳහා සහන**

වැඩිහිටි නිවාස, ළමා නිවාස, විවිධ හැකියාවන් ඇති ආබාධිත අය සඳහා වන නිවාස ආදිය පාලනය කිරීම වැනි ඉතා වැදගත් සමාජ සේවාවන් සඳහා කැපවුණ පුණ්‍ය ආයතන සමාජයට ඉතා අඩු පිරිවැයක් දැරීමට සලස්වමින් ඉතා වටිනා සමාජ මෙහෙවරක් ඉටු කරයි. මේ සඳහා පහත සඳහන් දිරි ගැන්වීම් ලබා දීමට යෝජනා කෙරේ.

(අ) ඉදිරි වසර තුළදී මෙම නිවාස නැවත සකස් කිරීමට හා අළුත්වැඩියා කිරීමට මුල්‍ය ආධාර සපයනු ඇත.

(ආ) එබඳු නිවාසවල පොළී ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන අතර ඒ සඳහා අදාල වන සියයට 10 ක පොළී ආදායම මත රඳවා ගැනීමේ බද්ද බැංකු විසින් අය නොකරනු ඇත.

(ඇ) රැකවරණ නිවාස - වඩාත් යහපත් ජීවන තත්ත්වයක් සහතික කිරීම සඳහා වෘත්තීය නිපුණතා සහ නිවහනක් නොමැති ශාරීරික වශයෙන් ආබාධිත පුද්ගලයින් සඳහා නිවාස ඉදිකරනු ඇත.

(ඈ) විවිධ හැකියාවන් ඇති ආබාධිත පුද්ගලයින් සඳහා ලබා දෙන දීමනාව සුදුසු පරිදි වැඩි කරනු ඇත.

(ඉ) දුබලතාවයන් හානිපූරණය සඳහා පළඳින කෘතිම අත් පා, කිහිලි කරු, ශ්‍රවනාධාර සහ අනෙකුත් උපාංග තීරු බදු, බදු හා වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඇතුළුව අනෙකුත් මුල්‍ය බදු ගෙවීමෙන් නිදහස් කරනු ඇත.

ඉහත ක්‍රියාමාර්ගය සඳහා රුපියල් මිලියන 200 ක් වෙන් කරනු ඇත.

06. **රටෙහි අඩු වරප්‍රසාද ලාභීන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක්**

රටෙහි අඩු වරප්‍රසාදලාභී සියළු මට්ටම්වල පුද්ගලයින්ට නොමිලේ සහ සාධාරණ ලෙස භුක්තිවිඳිය හැකි ඉහළ ගුණාත්මක භාවයකින් යුත් සෞඛ්‍ය සේවයක් ලබාදීමට ආර්ථික සංවර්ධනය උදෙසා වූ ජාතික සභාවේ (NCED) සෞඛ්‍යය අනුකමිටුව විසින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර ඇත. මේ සඳහා මානසික සෞඛ්‍යය, රුධිර පාරවිලනය, ජාතික ඖෂධ සහ සෞඛ්‍ය පර්යේෂණ වැනි ක්ෂේත්‍රවලට අදාළ වූ නීති මාලාවක් සෞඛ්‍ය අනුකමිටුව විසින් හඳුනාගෙන ඇත. එසේම මෙම අනුකමිටුව මගින් පාසල් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සහ මහජන පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගැනීම නිර්දේශ කර ඇත. කුළියාපිටිය, පුත්තලම, දඹුල්ල, දියතලාව, මහියංගනය, මන්නාරම, කන්තලේ, කල්මුනේ, පේදුරුතුඩුව, තෙලිප්පලේ, අවිස්සාවේල්ල, හෝමාගම, වතුපිටිවල, හොරණ, පානදුර, අයි.ඩී.එච්, බලපිටිය සහ ඇඹිලිපිටිය යන නගරවල ඇති රෝහල් 17 ක් මූලික දිස්ත්‍රික් රෝහල් ලෙස වැඩි දියුණු කරනු ලැබේ. විශේෂඥ වෛද්‍යවරුන් රෝහල්වලට ආකර්ශණය කර ගැනීම සඳහා වාහන සහ නේවාසික පහසුකම් සපයනු ලැබේ. මෙම වැඩ සටහන සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කිරීමට නිර්දේශ කරනු ලැබේ.

07. **සමෘද්ධි වැඩ සටහන තුළින් ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම**

දිළිඳුකම අඩු කිරීමේ හා දිළිඳු ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා වන අපගේ රජයේ කැපවීමේ කොටසක් ලෙස කිරි නිෂ්පාදනය, බාහිර වගාකරුවන් විසින් පළතුරු සහ එළවළු වගා කිරීමේ වැඩ සටහන්, කාර්මාන්ත අංශය සඳහා උප කොන්ත්‍රාත් වැඩ සටහන් සහ ස්වයං රැකියා සඳහා සූක්ෂම ණය යෝජනා ක්‍රම වැනි නව ජීවන තත්ත්වයක් ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් ඇති කරනු ඇත. සමෘද්ධි වැඩ සටහන ප්‍රධාන ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන බවට පත් කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග යෝජනා කරනු ලැබේ.

(අ) සමෘද්ධි ප්‍රතිලාභීන් ස්වයං රැකියාවල සහ ප්‍රජාපාදක යටිතල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිවල යෙදවීමෙන් ඔවුන්ට මසකට රුපියල් 5,000 දක්වා අමතර ආදායමක් ඉපයීමට හැකිවන පරිදි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම රුපියල් මිලියන 10 ක් ලබාදීම සඳහා 2006 ජනවාරි සිට රජය රුපියල් මිලියන 3,000 ක් වෙන් කරනු ඇත.

(ආ) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් කාර්යක්ෂම ව්‍යාප්ත සේවා දායකයන් බවට පත් කිරීම පිණිස ඔවුන්ට යතුරු පැදි ලබා දීම සඳහා සහනදායී ණය සපයනු ලැබේ.

(ඇ) ලබන වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි සමෘද්ධි මාසික දීමනාව සියයට 50 කින් වැඩි කරනු ඇත. මේ සඳහා රුපියල් මිලියන 3,000 ක් වෙන් කරනු ලැබේ.

(ඈ) මරණාධාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා ද ළදරු උපත් දීමනාව රුපියල් 2,500 සිට රුපියල් 5,000 දක්වා ද වැඩි කරනු ඇත.

මෙම සමාජීය ආරක්ෂණ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම පිණිස සමෘද්ධි සහන ආරක්ෂණ අරමුදල ශක්තිමත් කරනු ලබන අතර එවිට එය වාර්ෂික අයවැය මත බලපෑමක් නොකරනු ඇත.

08. **යොවුන් දිරිය**

2006 වසරේදී යෞවනයින් 50,000 කට හා 2007 වසරෙහි තවත් යෞවනයින් 50,000 කට රැකියා අවස්ථා ඇති කිරීමට යොවුන් දිරිය වැඩ සටහනෙන් අරමුණු කරනු ඇත. එබඳු යෞවනයින්ගේ රැකියා නිපුණතාවය වැඩි දියුණු කිරීමට වෘත්තීය පුහුණු ආයතන හා නිපුණතා සංවර්ධන ආයතන මගින් නිපුණතා වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වේගවත් කරනු ඇත.

(අ) රජයේ විවිධ ආයතනවල නිපුණතා අංශයන්ගේ ඇතිවේයැයි අපේක්ෂිත රැකියා පුරප්පාඩු සඳහා 2006 වසරේදී උපාධිධාරීන් 10,000 ක් බඳවා ගනු ඇත.

(ආ) පෙදරේරු, වඩු කාර්මික, විදුලි කාර්මික, ජලනල සවි කිරීම සහ අනෙකුත් කාර්මික අංශවල පිළිගත් නිපුණතාවයකින් යුත් සේවා සපයන්නන් බිහි කිරීම සඳහා නව යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ඇත. "යොවුන් දිරිය" වැඩ සටහන යටතේ පිළිගත් නිපුණතාවයකින් යුත් සේවා සපයන්නන් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වන පරිදි වෙනම නාමාවලියක් සකස් කරනු ඇත.

මෙම වැඩ සටහන සඳහා රුපියල් මිලියන 1,000 ක් ලබා දෙනු ඇත.

09. **විදේශ රැකියා**

විදේශ රැකියා වෙළෙඳපොළ ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා උත්පාදන මාර්ගයක් බවට පත්ව ඇත. විදේශ රැකියා තුළින් ඉපැයීම් වර්ෂයකට ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1,500 ක් පමණ වේ. දැනටමත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ඇති කර ගෙන ඇති ගිවිසුම අනුව 2006 වසරේදී විදේශ රැකියා අවස්ථා 150,000 සුරක්ෂිත කිරීමට රජය බලාපොරොත්තුවේ. එබඳු විදේශ රැකියා අවස්ථා වැඩිකරලීම සඳහා තවත් එවැනි ගිවිසුම් ඇති කිරීමට කටයුතු කරනු ඇත. ඉහළ වැටුප් ලබන රැකියා අවස්ථා සහතික කිරීම සඳහා හෙද සේවාව, නාවික, පරිගණක විද්‍යාව සහ වෙනත් නිපුණතා ක්ෂේත්‍රයන්හි විශේෂ පුහුණු වැඩ සටහන් වැඩි දියුණු කරනු ඇත. විදේශ රැකියා සඳහා හෙදියන් පුහුණු කිරීමට හෙද විදුහල් පිහිටුවනු ඇත. ස්වයං රැකියා අවස්ථා ආරම්භ කිරීම දිරි ගැන්වීම සඳහා, අඛණ්ඩ වසර දෙකක විදේශ සේවයකින් පසු පැමිණෙන්නන් සඳහා විදේශගතව සිටි කාලයට අනුරූපව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 5,000 දක්වා විශේෂ තීරු බදු රහිත දීමනාවක් (ගමන් බඩු හැර) ලබා දෙනු ඇත. අනුමත නිර්ණායක යටතේ පිළිගත් ස්වයං රැකියා ව්‍යාපෘතියක් හෝ ව්‍යවසායක් ආරම්භ කිරීම සඳහා දිවයිනට පැමිණි දිනයේ සිට මාස 6 ක් තුළදී මෙම දීමනාව ලබා ගැනීමට ඔවුන් හිමිකම් ලබනු ඇත.

## 10. වතු යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රජා සුභ සාධනය

කලින් පැහැදිලි කළ පරිදි සහශ්‍ර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේ ක්‍රමෝපායයන්ට අනුකූලව වතු වැවිලි අංශය සඳහා රජය විසින් දස අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇත. ඒ අනුව වැවිලි සංවර්ධන භාරය මගින් ජලය සපැයීම, පෙර පාසල්, ළමා සංවර්ධනය හා ක්‍රීඩා වැනි කටයුතුවලට අවධානය යොමු කරනු ඇත. වතු අංශයේ සියළුම රෝහල් සහ පාසල් සංවර්ධන කටයුතු පළාත් සභා මගින් සිදු කරනු ලැබේ. වතු පාරවල් ප්‍රතිසංස්කරණය සහ වතු නිවාස 50,000 ක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම පිණිස වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් දැනට වෙන් කර ඇති රුපියල් මිලියන 1,641 ක ප්‍රතිපාදනවලට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් වෙන් කරනු ඇත. නුවරඑළියේ වෘත්තීය පුහුණු පාසලක් ලබන වසරේදී ස්ථාපනය කරනු ඇත. වෙනමම විශ්ව විද්‍යාලයක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාවය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

## 11. නාගරික ප්‍රදේශවල අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස

නාගරික ප්‍රදේශවල අඩු ආදායම් ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පමණක් ඉතා අයහපත් සෞඛ්‍ය හා පරිසරික තත්ත්වයන් යටතේ පැල්පත් වාසීන් 60,000 ක් පමණ ජීවත් වේ. ඔවුන්ට යහපත් නිවාස පහසුකම් සැපයීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම පිණිස නාගරික පැල්පත් නිවාසවල ජීවත් වන අයටම වෙන් වූ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් ඇරඹීම සඳහා නාගරික නිවාස සංවර්ධන සංස්ථාව පිහිටුවනු ඇත. 2006 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ඇරඹීමට රුපියල් මිලියන 500 ක් වෙන් කරනු ඇත.

## 12. කෘෂිකර්මාන්තය

ග්‍රාමීය කෘෂිකාර්මික ආර්ථිකය නඟා සිටුවීම සඳහා ණය මුදල්, පොහොර, උසස් තත්ත්වයේ බීජ හා වගා කිරීමේ උපකරණ ආදී යෙදවුම් දැරිය හැකි මිලකට සැපයීම සහ ඒ සඳහා ව්‍යාප්ත සේවා යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

(අ) **පොහොර**

සියලුම වර්ගයේ පොහොර, කිලෝ ග්‍රෑම් 50 ක බෑගයක් රුපියල් 350 කට ලබාදීමට අපගේ රජය දැනටමත් තීරණය කර ඇත. එම නිසා, පොහොර සහනාධාරය සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 6,200 සිට රුපියල් මිලියන 8,500 දක්වා වැඩි කරනු ඇත. මෙමගින් කුඩා පරිමාණයේ ගොවියන්ට ප්‍රතිලාභ ලැබීම සහතික කිරීමට මෙම සහනාධාරය වී සහ එළවළු වගාවන් සඳහා යොමු කරනු ඇත. කාබනික පොහොර භාවිතා කරන්නන් සඳහා අතිරේක දිරි ගැන්වීම් ලබා දෙනු ඇත. තත්ත්වයෙන් බාල රසායනික පොහොර ආනයනය වැළැක්වීම සඳහා පරීක්ෂණ පහසුකම් සහ තත්ත්ව පාලන කටයුතු ශ්‍රී ලංකා රේගුවේ ස්ථාපනය කරනු ඇත.

(ආ) **බීජ**

විශේෂිත භූගෝලීය හා කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමට හැකි උසස් තත්ත්වයේ බීජ හා රෝපන ද්‍රව්‍ය සැපයීමට හොරණ, සීතාඑළිය, ගිරාඳුරු කෝට්ටේ හා ලබුදූව බීජ ගොවිපොළවල් සහ මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය සංවර්ධනය කරනු ඇත. මේ සඳහා රුපියල් මිලියන 300 ක් වෙන් කරනු ඇත.

(ඇ) **ණය පහසුකම්**

අපගේ බැංකු හරහා ග්‍රාමීය කෘෂිකර්මාන්තය සඳහා ලබා දුන් ණය මුදල් ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නැත. ග්‍රාමීය ආර්ථිකයන් තුළින් බැංකුවල ඉතුරුම් තැන්පතු ඉහළ ගොස් ඇතත් 1995 වර්ෂයේදී සියයට 6.3 ක්වූ කෘෂිකර්මාන්තය සඳහා ණය ලබාදීමේ ප්‍රමාණය 2004 වන විට සියයට 4.7 දක්වා පහළ බැස ඇත. එම නිසා, ඉදිරි වසර තුන තුළදී කෘෂිකාර්මික සැකසුම් ඇතුළුව කෘෂිකර්මාන්තය සඳහා බැංකු මගින් ණයදීමේ ප්‍රමාණය මුළු ණයවලින් සියයට 10 ක් දක්වා වැඩි කිරීම කළ හැකි වන පරිදි, බැංකු රෙගුලාසි සංශෝධනය කරනු ඇත.

(ඈ) **වී අලෙවි මණ්ඩලය සහ සහතික මිල ගණන්**

රුපියල් මිලියන 2,000 ක මූලික ප්‍රාග්ධනයකින් වී අලෙවි මණ්ඩලය ප්‍රතිස්ථාපනය කරනු ඇත. දැනටමත් දිස්ත්‍රික් ලේකම්වරුන් සතුව ඇති අරමුදල් මේ සඳහා යොදවනු ඇත. රට පුරා විසිරී ඇති රජයේ සියළු ගබඩා කිරීමේ පහසුකම් වී අලෙවි මණ්ඩලය සඳහා පවරනු ඇත. ළඟ එන මහ කන්නයේ සිට වී මිලදී ගැනීමේ සහතික මිල වී කිලෝවකට රුපියල් 16.50-17.50 අතර පරාසයක වැඩි කරනු ඇත.

(ඉ) **විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදන කලාපය**

ශ්‍රී ලංකාවේ වැවෙන මැංගුස්, දොඩම්, දූරියන්, ගස් ලබු, රඹුටන් සහ අන්නාසි වැනි කලාපීය පළතුරු විශේෂිත පාරිසරික පසුබිමක් ඇති නිශ්චිත දිස්ත්‍රික්ක කීපයකට ඒකරාශී වී ඇත. එම නිසා, අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාප්ති පහසුකම් සපයාදීමට

සහ අපනයන වෙළෙඳපොළ සඳහා ඉදිරිපත් කරන භාණ්ඩවල අලෙවි කරන තත්ත්වයන් ඉහළ නැංවීමට බෝග නිෂ්පාදන කලාපයන් පිහිටුවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 160 ක් වෙන් කිරීමට යෝජනා කෙරේ.

(ඊ) **කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම**

ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම ජෛව විවිධත්වයකින් යුත් ස්ථාන 25 න් එකක් ලෙස ලබා ගෙන ඇති ප්‍රතිරූපය ආරක්ෂා කිරීමට සහ වැඩි දියුණු කිරීමට අවශ්‍ය වේ. කෘෂි රසායනික නොයෙදූ කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීමට ජාතික කාබනික ප්‍රමිතිකරණ හා සහතික කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට, නිෂ්පාදන වල තත්ත්වය උසස් කිරීම සඳහා කෘෂිකාර්මික ජීවාණුහරණ ක්‍රියාවලියක් ඇති කිරීම තහවුරු කිරීමට ප්‍රකීරණ ඒකකයක් (Irradiation Plant) ස්ථාපනය කිරීමට සහ අස්වනු නෙලීමෙන් පසු ඇති වන හානිය අඩු කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන ඇසිරීම හා ප්‍රවාහනය කිරීමේ ක්‍රම වැඩි දියුණු කිරීමට සඳහා රුපියල් මිලියන 415 ක් වෙන් කරනු ඇත.

13. වැවිලි කෘෂිකර්මාන්තය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර වැවිලි කර්මාන්ත අංශය සංවර්ධනය සඳහා සකස් කර ඇති ජාතික සැලසුම් ලබන වසරේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. තේ, රබර්, පොල් සහ වෙනත් බෝග සඳහා පැල තවාන් සංවර්ධනය, කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා කර්මාන්ත ශාලා නවීකරණය, නැවත වගා කිරීමේ හා අළුතින් වගා කිරීමේ වැඩ සටහන් මෙන්ම බෝග විවිධාංගීකරණය සහ පාංශු සංරක්ෂණය ද මෙම සැලසුමෙන් අපේක්ෂා කෙරේ. මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග 2006 අයවැය මගින් යෝජනා කරනු ලැබේ.

(අ) දැනට ස්ථායිකරණ අරමුදලේ ඇති රුපියල් මිලියන 1,600 න් ආරම්භ කරනු ලබන රුපියල් බිලියන 10 ක චක්‍රීය අරමුදල පිහිටු වීම. කුඩා පරිමාණයේ වැවිලිකරුවන් සඳහා විශේෂ අවධානය යොමු කරමින් මෙම අරමුදල මගින් වැවිලි කර්මාන්තයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සපයනු ඇත.

(ආ) මෙම අරමුදල සඳහා අරමුදල් ලැබීම සහතික කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සතු අතිරේක නාගරික ඉඩම් හා දේපොළ වාණිජ වශයෙන් සංවර්ධනය කරනු ඇත.

(ඇ) තේ, රබර් සහ පොල් වගාවන් සඳහා නැවත වගා කිරීමේ සහ අළුතින් වගා කිරීමේ සහනාධාරය සියයට 25 කින් වැඩි කරනු ඇත.

(ඈ) මහවැලි ප්‍රදේශ සහ ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල පොල් වගා කිරීම සංවර්ධනය කරනු ඇත.

(ඉ) මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් හෙක්ටයාර් 20,000 ක් සංවර්ධනය කරනු ඇත.

(ඊ) කර්මාන්ත ශාලා නවීකරණය දිරිමත් කිරීම සඳහා තේ, රබර් සහ පොල් සැකසීමේ කර්මාන්ත ශාලාවලින් අය කරනු ලබන සියයට 1 ක ආර්ථික සේවා ගාස්තුව සියයට 0.5 දක්වා අඩු කරනු ඇත.

(උ) උක් වගා කිරීමත් සමඟ කන්තලේ සීනි කර්මාන්ත ශාලාව සංවර්ධනය කිරීම වහාම ආරම්භ කරන අතර, හිඟුරාන සීනි කර්මාන්ත ශාලාව මාස 3 ක් ඇතුළත ආරම්භ කිරීම මගින් මෙම ප්‍රදේශවල ජීවන තත්ත්වයේ පුනරුදයක් ඇති වනු ඇත.

(ඌ) කජු වගා කිරීම දිරි ගැන්වීම සඳහා මහඔය, අනුරාධපුරය සහ මොණරාගල යන ප්‍රදේශවල ඉහළ ඵලදායිතාවයකින් යුත් උසස් වර්ගයේ පැල තවාන් ඇති කරන අතර, පුත්තලමේ සහ වවුනියාවේ නව කජු වෙන්දේසියක් පිහිටු වනු ඇත.

මෙම කටයුතු සඳහා පහසුකම් සැපයීමට රුපියල් මිලියන 700 ක් වෙන් කරනු ඇත.

14. **පශු සම්පත් සංවර්ධනය**

2004 වසරේ දී එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය මගින් හඳුන්වා දුන් නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම කර්මාන්තය විශිෂ්ඨ ප්‍රගතියක් පෙන්වා ඇත. ග්‍රාමීය මට්ටමින් "කිරි ගම්මාන" වැඩ සටහන සැලකිය යුතු ලෙස ව්‍යාප්ත වී ඇත. පුද්ගලික අංශයේ ව්‍යවසායකයින් විසින් මෙම ක්ෂේත්‍රයේ මහ පරිමාණයේ ආයෝජනයන් ද සිදු කර ඇත. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ රටේ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීමට තවදුරටත් දිරි ගැන්වීම් ලබාදීම පිණිස පහත සඳහන් ක්‍රියාමාර්ග යෝජනා කරනු ලැබේ.

(අ) අපගේ ගොවීන්ට ප්‍රතිලාභ ලැබෙන මිලක් ගෙවනු පිණිස කිරි නිෂ්පාදකයින් සඳහා ගෙවන මිල ලීටරයකට රුපියල් 25 - 30 පරාසයක වැඩි කරනු ඇත.

(ආ) ගොවීන්ට උසස් වර්ගයේ කිරි ගවයින් ලබාදීම සඳහා විශේෂ සහනදායී ණය යෝජනා ක්‍රමයක් ඇති කරනු ඇත.

(ඇ) කිරි සැකසීමේ යන්ත්‍ර සූත්‍ර තීරු බදු සහ වැට් බද්දෙන් නිදහස් කරනු ඇත.

(ඈ) ජාත්‍යන්තර තරඟකාරිත්වයෙන් ඇති වන බලපෑමෙන් දේශීය කිරි නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට හැකි වනු පිණිස ආනයනික කිරි පිටි සඳහා දැනට පවතින බදු සහන ක්‍රමයෙන් ඉවත් කරනු ඇත.

15. **මහවැලි ආර්ථිකය**

කිරි නිෂ්පාදනය, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ප්‍රජා සංචාරක ව්‍යාපාරය වැනි ඉහළ එකතු කළ අගයක් සහිත වාණිජ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට හා මහවැලි ප්‍රදේශවලින් ලැබෙන දායකත්වය දැනට පවත්නා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1 ක මට්ටමේ සිට සියයට 3 දක්වා වැඩි කිරීමට සහ මහවැලි ප්‍රදේශවල දෙවැනි පරම්පරාවට රැකියා අවස්ථා ලබාදීම සහතික කිරීමට නව නාගරික සංවර්ධන වැඩ සටහන් ඇති කිරීම සඳහා අපගේ රජය මහවැලි ආර්ථිකය නැවත සකස් කරනු ඇත. ඉහළ ප්‍රමිතියකින් යුත් සහල් නිෂ්පාදනය ද ඇතුළුව උසස් තාක්ෂණයෙන් හා අපනයනය සඳහා වූ කෘෂි සැකසුම් කර්මාන්ත ඇති කිරීමට මහවැලි ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් 500 ක් සඳහා වෙන් වූ සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ඇත. ඉදිරි අවුරුදු 3 සඳහා රුපියල් මිලියන 700 - 1000 ක ආරම්භක ප්‍රාග්ධනයක් මෙම නව මහවැලි ආර්ථිකය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වේ. 2006 වසරේදී මෙම කාර්යය ආරම්භ කිරීමට රුපියල් මිලියන 200 ක් වෙන් කරනු ඇත. දඹුල්ල මධ්‍ය ගත නගරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වන මහ දඹුල්ල (Greater Dabulla) නගර සංවර්ධන වැඩ සටහන ද මෙම නව ආර්ථිකය සමඟ සම්බන්ධ කරනු ඇත.

16. **ධීවර අංශයේ සංවර්ධනය**

සුනාමි ව්‍යසනයෙන් දැඩි ලෙස හානියට පත් අපගේ වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය නැවත නගා සිටුවීම කඩිනමින් කළ යුතුව ඇත. ප්‍රමාණවත් බහු දින යාත්‍රා සහ ධීවර යාත්‍රා නොමැතිකම නිසා ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට ඇති හැකියාව සීමා සහිතය. එම නිසා පහත සඳහන් කටයුතු සඳහා ධීවර කටයුතු ප්‍රවර්ධන අරමුදලක් පිහිටු වීමට රුපියල් මිලියන 700 ක් වෙන් කරනු ඇත.

(අ) බහු දින යාත්‍රා නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සංවර්ධනය කිරීම මෙන්ම ධීවරයන්ට මෙවැනි යත්‍රා මිලදී ගැනීම සඳහා පහසු ගෙවීමේ ක්‍රමයක් සහ ගැඹුරු මුහුදේ හා අක්වෙරළ ධීවර කර්මාන්තය සඳහා මවු යාත්‍රාවක් යෙදවීම .

(ආ) අපනයන වෙළෙඳපොළ සඳහා යෝග්‍ය ලෙස මත්ස්‍ය නිෂ්පාදනය කිරීම සඳහා පුහුණු පහසුකම් සැපයීම අවශ්‍ය වේ.

යහපත් සෞඛ්‍ය ප්‍රමිතීන් සහ නවීන පාරිභෝගික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මැද කොළඹ ශාන්ත ජෝන් මාළු වෙළෙඳපොළ වෙනුවට මාළු වෙළෙඳ සංකීර්ණයක් ඇති කිරීම වැදගත් වේ. මෙම සංකීර්ණය පෑලියගොඩ අක්කර 10 ක භූමියක ඉදිකරනු ලබන අතර, මේ සඳහා මූලික ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස රුපියල් මිලියන 500 ක් වෙන් කරනු ඇත.

ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමට හා සුරතල් මසුන් පිළිබඳ ව්‍යාපෘති මගින් ඉහළ එකතු කළ අගය සහිත අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ විභවතාවයක් ධීවර අංශය සතුව ඇත. මෙම කාර්යය ජනප්‍රිය කරවීමට සහ ප්‍රවර්ධනය කරවීමට සුරතල් මත්ස්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට යොජනා කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 50 ක් වෙන් කළ යුතු යැයි නිර්දේශ කෙරේ.

ඉස්සන් වගාව පුත්තලම් දිස්ත්‍රික්කයේ පුනර්ජීවනය වී ඇති අතර, එහි ගොවිපොළ වගාවේදී දරා ගැනීමේ සීමාව සියයට 60 දක්වා වැඩි කිරීමට සහ ඉස්සන් වගාව ප්‍රතිස්ථාපනය කිරීමට ලන්දේසි ඇල පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීමට අමතරව මෙම කර්මාන්තය මඩකලපුව දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත කළ හැකිය. එම නිසා 2006 වසරේ ඉස්සන් ගොවිපොළ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කරනු ඇත.

17. **රෙදිපිළි සැකසුම් කර්මාන්තය**

ශ්‍රී ලංකාව වසරකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5 කට වඩා වැඩි වටිනාකමකින් යුත් රෙදි පිළි ශුද්ධ වශයෙන් ආනයනය කරනු ලබයි. පාසල් ළමුන් සහ හමුදා සේවාවල නිල ඇඳුම් දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගැනීම පසුගිය වසරේ පටන් රජය ආරම්භ කර ඇත. එම නිසා රෙදි පිළි කර්මාන්තය සඳහා දැනට ක්‍රියාත්මක වන ණය ප්‍රතිසංවිධාන වැඩපිළිවෙල සම්පූර්ණ කිරීම තුළින් රෙදි පිළි කර්මාන්තය පුනර්ජීවනය කිරීම අවශ්‍ය වේ. බැංකු සහ රජය අතර, අවදානම බෙදා ගැනීමේ පදනම යටතේ ආසන්න වශයෙන් රුපියල් මිලියන 350 ක් 2006 වසරේදී වැය කිරීමෙන් මෙම වැඩ සටහන සම්පූර්ණ කළ හැකි වේ යයි අපේක්ෂා කෙරේ. පාසල් නිල ඇඳුම් සහ හමුදා සේවාවල නිල ඇඳුම් සඳහා අවශ්‍ය

සම්පූර්ණ රෙදි පිළි අවශ්‍යතාවය දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගැනීමට කටයුතු කරනු ඇත.

ඇඟළුම් කර්මාන්තය සඳහා දේශීය වශයෙන් නිෂ්පාදිත රෙදි නොසපයන ලද තත්ත්වයක සිට දේශීය වශයෙන් සකසා සපයනු ලබන රෙදි ප්‍රමාණය සියයට 30 දක්වා වර්ධනය වී ඇත. රෙදි පිළි සැකසුම් ක්‍රියාවලිය දේශීය වශයෙන් වැඩි දුරටත් ප්‍රවර්ධනය කළ හැකි නම් ඇඟළුම් කර්මාන්තයේ සමස්ත එකතු කළ අගය සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය හැකි වනු ඇති අතර, ආනයන පිරිවැය අඩු වනු ඇත. ජලය අඛණ්ඩව ලැබීම ද, විදුලිය ස්ථාවරව පැවතීම ද කාර්යක්ෂමව අපද්‍රව්‍ය බැහැර කරලීමේ යන්ත්‍ර ද රෙදි පිළි කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය වේ. එම නිසා හොරණ රෙදි පිළි සැකසුම් කලාපයට අමතරව තුල්හිරිය සංකීර්ණය විශේෂිත රෙදි පිළි සැකසුම් කලාපයක් වශයෙන් සංවර්ධනය කරනු ලබන අතර රෙදි පිළි සැකසීමේ කාර්මාන්ත ශාලා වැඩි වශයෙන් ස්ථාපනය කිරීම උනන්දු කරනු ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ දැනට ලබා දෙන සියළු දිරි ගැන්වීම් මෙම කලාප දෙක සඳහා ලබා දෙනු ඇත.

18. **රෙදි පිළි සහ ඇඟළුම් සඳහා වන විද්‍යායතනය**

ගුණාත්මක බවින් උසස් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන්නා වූ වෘත්තීය කළමනාකරුවන්, තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් සේවා සපයන්නන් හා කුසලතා පිරි සේවකයන්, රෙදි පිළි හා ඇඟළුම් කර්මාන්තයේ මීළඟ අදියර සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. මෙවැනි වෘත්තිකයින් පුහුණු කිරීමේ ආයතනයක් සාර්ක් (SAARC) කලාපයේම නොමැතිවීම, අදාළ පුහුණුව පිළිබඳව කලාපීය සමස්ත වෙළෙඳපොළම අත් කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාවක් ද මෙම විද්‍යායතනය පිහිටුවීමෙන් අප සතු වනු ඇත. එම නිසා ලෝක මට්ටමින් පිළිගනු ලබන උපාධි හා ඩිප්ලෝමා පිරිනැමීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ එවැනි ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරන "රෙදි පිළි හා ඇඟළුම් පිළිබඳ විද්‍යායතනයක් " තුල්හිරියේ පිහිටුවනු ඇත. අවුරුදු තුනක් වෙනුවෙන් මේ ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තු ගත වියදම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 7.5 ක් වේ. මේ පිළිබඳව මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා 2006 වසරේදී රුපියල් මිලියන 250 ක් වෙන් කරනු ඇත.

19. **කලාපීය ඇඟළුම් කේන්ද්‍රස්ථානයක්**

ශ්‍රී ලංකාවේ පිහිටීමේ වාසිදායක තත්ත්වය මෙන්ම ඇඟළුම් කර්මාන්තයේ දැනට පවත්නා ශක්තිමත් භාවය ද කලාපය තුළ උසස් මට්ටමේ ඇඟළුම් කේන්ද්‍රස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා අනර්ඝ ඉඩ ප්‍රස්ථාවක් ලබා දෙයි. ඇඟළුම් වෙළෙඳපොළ සඳහා ධනාත්මක පරිසරයක් නිර්මාණය කිරීමෙන් දැනට ඉදිවෙමින් පවතින නව සුවිසල් වෙළෙඳ මධ්‍යස්ථානයන්හි කෙරෙන විශාල ආයෝජනයන් තවදුරටත් දිරිමත් කළ හැකිය. දේශීය කර්මාන්ත උසස් තත්ත්වයකට නංවාලීමේ රජයේ ප්‍රකාශිත ප්‍රතිපත්ති තුළ, ඇඟළුම් කර්මාන්තයන් අවම අපනයන ප්‍රමාණයන් පවත්වා ගැනීමේ තත්ත්වයන්ට හා වැට් බදු ගෙවීමට යටත්ව දේශීය ඇඟළුම් වෙළෙඳපොළ පුළුල් කිරීමට නව ඇඟළුම් කේන්ද්‍රස්ථානයක් කටුනායක පිහිටු වනු ලැබේ.

20. **කාන්තා දිරිය - තැගි භාණ්ඩ සහ අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය**

තැගි භාණ්ඩ මෙන්ම අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදන ඉහළ ආදායම් ලබන පාරිභෝගිකයන් අතර, ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතී. මෙය රුපියල් බිලියන 1 ක කර්මාන්තයක් බවට පත් කිරීමට හා එමගින් රැකියා අවස්ථා 20,000 ට වැඩි ප්‍රමාණයක් සැපයිය හැකි වන පරිදි පුහුණුව, මෝස්තර නිර්මාණය කිරීම, අලෙවි ප්‍රවර්ධනය සහ අලෙවිකරුවන් හා මිලදී ගන්නන් අතර සබඳතා සංවිධානය කිරීම සඳහා යොමු වූ ජාතික ක්‍රමෝපායක් අත්යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය සඳහා සැලසුම් කර ඇත. රෙදි වියන්නන් සහ මෝස්තර නිර්මාණකරුවන් පුහුණු කිරීමට හා දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනීම නංවාලීම සඳහා "කාන්තා දිරිය" ස්වයං රැකියා වැඩ සටහන යටතේ කොළඹ, අම්පාර, කුරුණෑගල, කෑගල්ල හා නුවර යන ප්‍රදේශවල විසිරී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදකයින් ඒකරාශී කර ස්ථාවර ලෙස ස්ථාපිත වී ඇති මෙම ක්ෂේත්‍රයේ නිෂ්පාදකයන් සමඟ ඔවුන් සම්බන්ධ කිරීමට කටයුතු කරනු ඇත. ශ්‍රී ලාංකික පාරම්පරික තැගි භාණ්ඩ සංචාරකයින් අතර, ජනප්‍රිය කරවීම සඳහා උසස් තත්ත්වයේ තැගි භාණ්ඩ නිෂ්පාදනය කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 250 කින් යුත් කේන්ද්‍රගත කණ්ඩායමක් දිරි ගන්වනු ලැබේ. මෙම කාර්යය ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 75 ක් වෙන් කරනු ඇත. උසස් තාක්ෂණ වැඩ සටහන යටතේ මේ සඳහා අවශ්‍ය යන්ත්‍ර සහ තාක්ෂණය, තීරු බදු හා වැට් බදු රහිතව ලබා දෙනු ඇත. අත් යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තයට අනුග්‍රහය දක්වනු පිණිස නූල් සහ සායම් වැට් බදු ගෙවීමෙන් නිදහස් කරනු ඇත.

21. **ඉහළ ආදායම් තලයේ (Up market) සංචාරක කටයුතු**

ඉහළ ආදායම් තලයේ සංචාරක කටයුතු නැංවීම සඳහා, සංචාරකයින් ආකර්ශනය වන ආකාරයේ උසස් තත්ත්වයේ සුවිශේෂී නිෂ්පාදනයන් අප රටට අවශ්‍ය වනු ඇත. කුරුල්ලන් නැරඹීම, දුෂ්කර කඳු හා ප්‍රදේශ තරණය, කෘෂි ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය, වන ජීවී සම්පත් ගවේශණය හා තල් මසුන් නැරඹීම වැනි ස්වාභාවික පරිසරය හා බැඳුණු සංචාරක ව්‍යාපාරය, පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයේ අංගයන් ලෙස සැලකිය හැකිය. ත්‍රිකුණාමලයේ තල්මසුන් නැරඹීමේ පහසුකම් සමඟ ත්‍රිකුණාමලය, හබරණ, පොළොන්නරුව යන ප්‍රදේශවල අලි ඇතුන් නැරඹීමේ පහසුකම් ස්ථාපනය කිරීම සම්බන්ධ කළ හැකිය. මහ දඹුල්ල සංවර්ධනය කිරීම සහ නව මහවැලි ආර්ථික ප්‍රවර්ධන කාර්යය ද මෙම ව්‍යාපෘතිය සමඟ මනාව බද්ද වේ. මෙම කර්තව්‍යය දිරි ගැන්වීමට රුපියල් මිලියන 100 ක් සෙස් ආදායමෙන් වෙන් කරනු ඇත.

22. **මුද්‍රණ සහ ඇසුරුම් කර්මාන්තය**

උසස් තත්ත්වයේ නිෂ්පාදන සඳහා වැඩි වන ඉල්ලුමෙන් ලැබෙන ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ මුද්‍රණ සහ ඇසුරුම් කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් දිරි ගැන්වීම් ලබා දෙනු ඇත.

(අ) දේශීය මුද්‍රණ හා ඇසුරුම් කර්මාන්තයේ අධික පිරිවැය අඩු කිරීම සඳහා සියළුම කඩදාසි වර්ග ආනයනය සඳහා දැනට පවත්නා සියයට 15 ක තීරු බද්ද ඉවත් කරනු ඇත.

(ආ) එකතු කළ වටිනාකම නැංවීම සඳහා පරීක්ෂණාගාරයක් ද ඇතුළත් ඇසුරුම් සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවනු ඇත.

(ඇ) අමුද්‍රව්‍ය සඳහා වන තීරු බදු පහළ බදු අනුපාතයකට ඇතුළත් කිරීම තුළින් දැනට පවත්නා ආනයන තීරු බදු විෂමතා ඉවත් කරනු ඇත.

(ඈ) දේශීය නිෂ්පාදකයින් මිල අතින් තරඟකාරිත්වයට පත් කිරීම පිණිස කෑන්වලට අදාළ තීරු බදු සියයට 6 දක්වා අඩු කරනු ඇත.

23. **පුද්ගලික බස් රථ හිමියන්**

දිනපතා කොළඹ නගරයට ඇතුළු වන බස් රථවලින් සියයට 40 ක් පමණ වසර 25 කට වඩා පැරණි බැවින් අබලන් තත්ත්වයේ පවතින පුද්ගලික බස් රථ වෙනුවට නව බස් රථ යෙදවීම සඳහා පුද්ගලික බස් හිමියන්ට ආධාර කිරීමේ කඩිනම් අවශ්‍යතාවයක් පවතී. එම නිසා ඔවුන්ගේ පැරණි බස් රථ වෙනුවට නව බස් රථ මිලදී ගැනීම සඳහා ආධාර කිරීමට සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ඇත. මෙම බස් රථ ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩ පිළිවෙල මගින් සේවා තත්ත්වය වැඩි දියුණු වන අතරම නඩත්තු පිරිවැය ද අඩු වනු ඇත. මෙම නව වැඩ පිළිවෙලෙහි පොලී පිරිවැය සඳහා සහනාධාර සැලසීමට රුපියල් මිලියන 75 ක මුදලක් වෙන් කරනු ඇත.

24. **"ගම නැග්ම" - ප්‍රජා පාදක සංවර්ධනය**

ශ්‍රී ලංකාවේ සෑම ගමකටම සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා විදුලිය, විදුලි සංදේශන පහසුකම්, ජල සම්පාදනය, ප්‍රවාහන පද්ධතීන්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, පෙර පාසල් පහසුකම්, අලෙවි කරන පහසුකම් හා සුසාන භූමි, ක්‍රීඩා පිටි, ළමා උද්‍යාන ආදී ප්‍රජා පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් සැපයීමට "ගම නැග්ම" ව්‍යාපෘතිය අරමුණු කර ඇත. මෙවැනි පහසුකම් සැපයීම ප්‍රාදේශීය අධිකාරීන් විසින් ද නොසලකා හැර ඇත. එම නිසා එබඳු අවශ්‍යතාවයන් සපුරාලීමට මෙම ව්‍යාපෘතින් සඳහා අප රජය විසින් අරමුදල් සපයනු ඇත. මෙම කාර්යය සඳහා සහනදායි කොන්දේසි යටතේ විදේශ ආධාර ලබා ගැනීමට අදහස් කරන අතර, ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය දිරිගැන්වීම සහ ප්‍රාදේශීය අධිකාරීන් සම්බන්ධීකරණය කිරීම මගින් "ගම නැග්ම" වැඩ සටහන එබඳු පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කරනු ඇත. ලබන වසරේ සිට මෙම වැඩ සටහන ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට යෝජනා කෙරේ.

25. **ග්‍රාමීය ප්‍රදේශවලට විදුලි බලය ලබාදීම සඳහා නැවත උත්පාදනය කළ හැකි බලශක්ති ප්‍රභවයයන්**

අද නැවත උත්පාදනය කළ හැකි බලශක්ති අංශයේ ඇති වී තිබෙන උද්යෝගය හේතුවෙන් නැවත උත්පාදනය කළ හැකි බලශක්ති ප්‍රභවයයන් මගින් ජනනය කළ මෙගාවොට් 74 ක විදුලි බලයක් විදුලි බල පද්ධතියට එක් වී ඇත. සූර්ය කෝෂ මගින් පමණක් නිවාස 75,000 ක් පමණ විදුලි බලය ලබා ගනියි. ඉදිරි වසර 3 තුළදී අවම වශයෙන් තවත් නිවාස 300,000 කට පමණ විදුලි බලය සැපයීමට මෙම විදුලි බල සැපයීමේ මාර්ග දිරි ගැන්වීම පිණිස, ග්‍රාමීය නිවාසයක් සඳහා නැවත උත්පාදනය කළ හැකි බලශක්ති ප්‍රභවයයක් මගින් ලබා දෙන සෑම

විදුලි සම්බන්ධතාවයකටම රුපියල් 10,000 ක සහනාධාරයක් රජය විසින් ලබා දෙනු ඇත. මේ සඳහා අප රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත. මෙම බලශක්ති ප්‍රභවයයන් මගින් ග්‍රාමීය ප්‍රදේශවලට විදුලි බලය ලබාදීමට සහායවීම සඳහා මුදල් ලබාදීමට සංවර්ධන මූල්‍ය ආයතනයක් හරහා රුපියල් බිලියන 2 ක "නැවත උත්පාදනය කළ හැකි බලශක්ති උපකාරක බැදුම්කරයක් " 2006 වසරේදී නිකුත් කරනු ඇත.

26. **ඉදිකිරීම් කර්මාන්තය නවීකරණය කිරීම.**

අපගේ රට නැවත ගොඩනැගීමේ අපගේ කැපවීම තුළ ඉදිකිරීම් කර්මාන්තය පුනර්ජීවනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය යුතුය. ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල ශක්තිමත් කිරීමට අමතරව, ඉදිකිරීම් කර්මාන්තය කාර්යක්ෂම කර්මාන්තයක් බවට පත් කිරීම සඳහා එයට නවීන යන්ත්‍ර සූත්‍ර සහ අදාළ උපකරණ ලබා දිය යුතුය. එම නිසා පහත සඳහන් සහන සපයනු ලැබේ.

(අ) නව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සහනදායී මූල්‍ය පහසුකම් යටතේ ආනයනය කිරීමට ඉදිකිරීම් සමාගම් සඳහා ණය සහතික ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ඇත. මෙහි පොලී පිරිවැය අඩු කිරීම සඳහා රුපියල් මිලියන 200 ක මුදලක් වෙන් කරනු ලැබේ.

(ආ) ඉදිරි වසර 2 ක තුළදී ගොඩනැගිලි බිඳ හෙලීමේ යන්ත්‍ර සූත්‍ර ද ඇතුළුව විශාල ඉදිකිරීම් සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම තීරු බදු සහ වැට් බදු ගෙවීමෙන් නිදහස් කරනු ඇත.

27. **නැවත ඉදිකිරීම් සහ සංවර්ධනය සඳහා වූ " ලංකා පුත්‍ර" බැංකුව**

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් සමාගම් විසින් සිදු කරනු ලබන නැවත ගොඩනැගීමේ සහ සංවර්ධනය කිරීමේ කුඩා හා මධ්‍ය පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති මූල්‍යනය දිරිගැන්වීම පිණිස නව බැංකුවක් පිහිටුවනු ඇත. දැනට " පුද්ගලික අංශයේ යටිතල පහසුකම් සංවර්ධන සමාගම" සතුව පවතින ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 75 ක් මෙම නව බැංකුව සඳහා යොදවනු ලැබේ.

28. **නව සොයා ගැනීම් සඳහා පහසුකම් සැපයීම සහ පර්යේෂණ හා සංවර්ධන ජාලය**

නව සොයා ගැනීම්, නව අදහස් උත්පාදනය කිරීම් සහ ඒවා වාණිජමය නිෂ්පාදනයන් බවට පරිවර්තනය කිරීම ජාතික සංවර්ධනයට මූලික වන බව රජය විශ්වාස කරයි. හිටපු ජනාධිපතිතුමියගේ විශේෂ ඉල්ලීම පරිදි රටෙහි ආර්ථික සංවර්ධනයට දායකවීම සඳහා ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් සහ නව නිපැයුම් සම්බන්ධ කිරීමට මොරටුව විශ්ව විද්‍යාලය සහ නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සම්බන්ධ කරමින් නව සොයා ගැනීම් සඳහා පහසුකම් සැපයීමේ ජාලයක් ස්ථාපිත කිරීමට යෝජනා කරනු ලැබේ. විද්‍යාත්මක පර්යේෂණ සහ අනෙකුත් පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ජාලය ඉහළ නැංවීමට, ජාතික පර්යේෂණ කවුන්සිලයට රුපියල් මිලියන 300 ක් වෙන් කරනු ඇත.

29. **අන්තර් ජාතික සම්බන්ධතා සහ ක්‍රමෝපාය අධ්‍යයනය සඳහා වූ ආයතනය**

තාක්ෂණය සහ දැනුම පාදක කර ගත් ආර්ථිකය වේගයෙන් ගෝලීයකරණය වන තත්ත්වයක් තුළ අපගේ විදේශ සම්බන්ධතාවයන්හි ආර්ථිකමය පැත්ත කෙරෙහි නව අවධානයක් යොමුවීමේ ප්‍රවනතාවයක් ඇත. මේ සම්බන්ධයෙන් ධාරිතා නැංවීම සහ ප්‍රතිපත්ති පර්යේෂණ ඉහළ ප්‍රමුඛත්වයක් ගනී. අපගේ වෙළෙඳපොළ සඳහා සුවිශේෂී ලාභදායක අංශයන් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික හා විදේශ සබඳතා භාවිතා කළ යුතු වේ. මෙම කටයුත්ත සඳහා අන්තර් ජාතික සම්බන්ධතාවයන් සහ ආර්ථික ක්‍රමෝපාය ගැටළු දෙස යොමු වූ නව ආයතනයක් ගොඩනගමින් පවතී. මෙම කටයුත්ත ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 75 ක් වෙන් කරනු ඇත.

30. **කම්කරු සම්බන්ධතා ඇකඩමිය**

ඵලදායිතාවය සහ කාර්මික සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ භූමියෙහි සහයෝගී කාර්මික සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මේ අනුව, සංවර්ධනයට සම්බන්ධ සියළු පාර්ශවයන් අභිප්‍රේරණය කිරීම සඳහා ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවයක් ගොඩනැංවීම අවශ්‍ය වේ. එම නිසා, කාර්මික සම්බන්ධතා ගැටළු පිළිබඳව අධ්‍යයන සිදු කිරීමටත් සම්මන්ත්‍රණ සහ වැඩ මුළු පැවැත්වීමටත් ඇකඩමියක් පිහිටුවනු ඇත. මෙම ඇකඩමිය ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, වෘත්තීය සංගම් සහ වෙළෙඳ මණ්ඩල සමඟ උපදේශාත්මක ක්‍රියාවලියක් තුළින් ඉතා කිට්ටුවෙන් කටයුතු කරනු ඇත. මෙම ඇකඩමිය පිහිටුවීමට රුපියල් මිලියන 50 ක් වෙන් කරනු ලැබේ.

**බදු යෝජනා**

31. **අවුරුදු 19 න් පහල ලෝක ශූරතාවය - 2006 සඳහා බදු නිදහස**

ශ්‍රී ලංකාව ද ඇතුළු රටවල් 16 ක් සහභාගී වන ඉහත සඳහන් ඉසව්ව පැවැත්වීම සඳහා ක්‍රිකට් ක්‍රීඩා කරන බොහෝ රටවල් අතරින් ශ්‍රී ලංකාව තෝරා ගනු ලැබ ඇත. 2006 ජනවාරි 31 දින සිට පෙබරවාරි 21 දින දක්වා ශ්‍රී ලංකාවේ දී එය පැවැත්වෙන අතර, ක්‍රිකට් ලෝලී ප්‍රේක්ෂකයින් බොහෝ සංඛ්‍යාවක් පැමිණෙතැයි අපේක්ෂා කෙරේ. මෙවැනි ඉසව් ශ්‍රී ලංකාවෙහි පැවැත්වීම දිරි ගන්වනු සඳහා එවැනි සෑම ජාත්‍යන්තර ඉසව්වක් සම්බන්ධයෙන්ම බදු නිදහස ප්‍රදානය කෙරෙනු ඇත.

**ආදායම් බද්ද**

32. **සංස්ථාපිත ආදායම් බද්ද**

ග්‍රාමීය සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍ර සංවර්ධනය සඳහාත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහාත් අප තුළ ඇති විශේෂ උනන්දුව ද, රජයේ ආදායම් අවශ්‍යතාවයද සැලකිල්ලට ගනිමින් 2006 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් වෙනස් කම් සිදු කෙරේ.

(අ) සමුපකාර සමිති මත වන සංස්ථාපිත ආදායම් බදු අනුප්‍රමාණය සියයට 20 සිට සියයට 5 දක්වා අඩු කිරීම.

(ආ) බදු අය වන ආදායම රුපියල් මිලියන 5 ට අඩු සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් (SME) වලට අදාළ බදු අනුප්‍රමාණය සියයට 20 සිට සියයට 15 දක්වා අඩු කිරීම.

(ඇ) බදු අයවන ආදායම රුපියල් මිලියන 5 ට වැඩි සමාගම් සඳහා වූ බදු අනුප්‍රමාණය සියයට 35 දක්වා වැඩි කෙරේ. කෙසේ වෙතත් ප්‍රාග්ධන වෙළඳ පොලේ වර්ධනය ගැන සලකා බලා අළුතින් නිල ලැයිස්තු ගත පොදු සමාගමක් බවට පත් වන සමාගමකට එසේ පත්වන වර්ෂයේ සිට පළමු වර්ෂ 5 සඳහා බදු අනු ප්‍රමාණය සියයට 33 1/3 ක් වනු ඇත. දැනට ක්‍රියාත්මක වන මානව සම්පත් සංවර්ධන අරමුදලේ බදු දායකත්වය සංස්ථාපිත බදු හා සමග ඒකාබද්ධ වනු ඇත.

(ඈ) සූදු සහ ඔට්ටු ලොතරැයි ව්‍යාපාර වලින් ලැබෙන ලාභ හෝ ආදායම් වලට අදාල බදු අනුප්‍රමාණය සියයට 40 හි තබනු ඇත.

මෙමගින් රුපියල් මිලියන 2,700 ක අතිරේක ආදායමක් අපේක්ෂා කෙරේ.

## 33. පුද්ගල ආදායම් බද්ද

(අ) සංස්ථාපිත ආදායම් බද්ද සම්බන්ධයෙන් වන සංශෝධනයන් හා ගලපනුවස්, පුද්ගල ආදායම් බදුකරණයේදී සියයට 30 අනුප්‍රමාණය අදාල වනසේ රුපියල් 500,000 ක් වන බදු අයවන ආදායම් ඛණ්ඩයක් අළුතින් නිර්මාණය කරනු ලබන අතර, ආදායමෙහි ඉතිරි කොටස සියයට 35 බැගින් බද්දට යටත් කරනු ඇත. මේ මගින් අපේ බදු පද්ධතියෙහි ප්‍රගතිගතිකත්වය වැඩි දියුණු වනු ඇත.

(ආ) අදාල ක්ෂේත්‍රයන්හි නිපුණත්වයන් නොපැවති 1970 ගණන් වලදී, ශ්‍රී ලාංකික සමාගම් වල සේවයේ නියුතු වන විදේශිකයන් සඳහා සියයට 15 ක අනුග්‍රාහක බදු අනුප්‍රමාණයක් හඳුන්වා දෙන ලදි. එහෙත් දැන් බොහෝ ක්ෂේත්‍රයන් තුළ නිපුණත්වය ලබා ඇති දේශීය වෘත්තිකයෝ සිටිති. එහෙයින් අදාල විධිවිධාන පහත දැක්වෙන පරිදි සංශෝධනය කළ යුතු යැයි යෝජනා කෙරේ.

i. ප්ලැග්ෂිප් සමාගම් වල සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් පළමු වර්ෂ 5 සඳහා ද, අනෙකුත් සමාගම් වල සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් පළමු වර්ෂ 3 සඳහා ද, සියයට 15 අනුප්‍රමාණය නොවෙනස්ව පවතිනු ඇත.

ii. සේවා යෝජකයා ප්ලැග්ෂිප් සමාගමක වන අවස්ථාවකදී ඊළඟ වර්ෂ 5 අවසානය හෝ සමාගමේ බදු නිදහස් කාලපරිච්ඡේදයේ අවසානය යන මේ දෙකින් පළමුව උදාවන දිනය දක්වා වන කාල පරිච්ඡේදය සඳහා බදු අනුප්‍රමාණය සියයට 20 දක්වා වැඩි කරනු ඇත. තවද, සේවා යෝජකයා ප්ලැග්ෂිප් සමාගමක් නොවන අවස්ථාවකදී, ඊළඟ වර්ෂ 2 සඳහා බදු අනුප්‍රමාණය සියයට 20 දක්වා වැඩි කරනු ඇත.

මේ සංශෝධනයෙන් අපේක්ෂිත අතිරේක ආදායම රුපියල් මිලියන 450 කි.

## 34. සමාජ වගකීම් බද්ද (SRL)

එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද, හර බද්ද සහ පොලී සහ ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද යන බදු හැර අනෙකුත් සියළුම බදු මත සියයට 0.25 ක සෙස් බද්දක්, දරුවන් සඳහා වන ජාතික ක්‍රියා මාර්ගයක් දියත් කිරීම සඳහා මුදල් පනත යටතේ පනවා ඇත. අපගේ රජය දරුවන්ගේ යහපත සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙන බැවින් දරුවන් වැඩි සංඛ්‍යාවකගේ යහපත සඳහා කටයුතු කිරීමේ අරමුණින් මේ සඳහා තවත් රුපියල් මිලියන 1000 ක් ලබා ගැනීම සඳහා මෙම බද්ද සියයට 1 දක්වා ඉහළ දැමේ.

35. **කෘෂිකර්මාන්තය සඳහා වූ බදු අනුග්‍රහ**

සැකසුම් ක්‍රියාවලියන් ද අඩංගු කෘෂිකර්මාන්තයෙහි ආයෝජනයන් වඩාත් දිරි ගැන්වීමට මෙම රජය කැපවී ඇති බැවින්, ප්‍රාථමික නිෂ්පාදනයන් සැකසීමෙන් උද්ගත වන ලාභ ද ආවරණය වන සේ පහත සඳහන් අතිරේක දිරිගැන්වීම් ලබා දෙනු ඇත.

(අ) 2005 අයවැය යෝජනා තුළින් ඉදිරිපත් කරන ලද කෘෂි ආදායම් මත බදු නිදහසට අමතරව, පළතුරු සහ එළවළු සකස් කිරීම දිරිමත් කරනු සඳහා ප්‍රාථමික නිෂ්පාදන සැකසීමෙන් උද්ගත වන ලාභය බද්දෙන් නිදහස් කිරීම.

(ආ) පළතුරු, එළවළු, හාල්, කැපූ මල්, විසිතුරු පැල, සහ කාබනික කෘෂි නිෂ්පාදන අපනයන ලාභ මත දැන් පවතින සියයට 15 ක බද්ද ඉවත් කිරීම.

36. **ඌන සංවර්ධිත පලාත් සංවර්ධනය**

ධනෝපායන ආර්ථික ක්‍රියාකාරකම් බොහොමයක් වර්තමානයේදී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල කේන්ද්‍රගත වී තිබීමෙන් එම දිස්ත්‍රික්ක සහ අනෙකුත් දිස්ත්‍රික්ක අතර ආර්ථික අසමානතා මතුවී ඇත. මෙය සමනය කරනු වස් අප විසින් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට අඩු වශයෙන් එක් කර්මාන්තයක් හෝ ඇති වන අයුරින් රට පුරා කර්මාන්ත 300 ක් පිහිටවනු ලැබේ. ඉන්දියාව සහ පකිස්ථානය යන දෙරට සමඟ වූ නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ යුරෝපා සංගමයට අයත් රටවල වෙළෙඳපොළ අපගේ භාණ්ඩ 7,000 කට අධික ප්‍රමාණයකට විවෘතවීම නිසා ඇති වී ඇති නව අවස්ථා අනුව එම කර්මාන්ත වල නිෂ්පාදිත භාණ්ඩ අලෙවි කරණය පිළිබඳව ගැටළු ඇති නොවනු ඇත. එබැවින් ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවලින් පිටත ප්‍රදේශයක 2006 අප්‍රේල් 01 දින සිට වසර දෙකක කාලයක් තුළ, රුපියල් මිලියන 30 කට නොඅඩු මුදලක් යන්ත්‍ර සූත්‍ර සහ ගොඩනැගිලි සඳහා ආයෝජනය කර පුද්ගලයන් 200 කට වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා දෙන නව කර්මාන්ත පිහිටුවන සමාගම් සඳහා පහත සඳහන් දිරි ගැන්වීම් ලබා දෙනු ඇත.

(අ) එම ආයෝජනයේ ලාභ ආයෝජනයේ ප්‍රමාණය අනුව තීරණය කරනු ලබන වසර 5 ක අවමයකට සහ වසර 10 ක උපරිමයකට යටත් කාලයකට බද්දෙන් නිදහස් කිරීම.

(ආ) ආයෝජනය කරනු ලැබූ මුදල මත ආදායම් බදු සහන දීම

(ඇ) මෙම ආයෝජනය සඳහා ණය දෙන ආයතනයන් විසින් දී ඇති ණය සඳහා ලැබෙන පොලී ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

(ඈ) එම කර්මාන්ත සඳහා ආනයනය කරනු ලබන අළුත් යන්ත්‍ර හෝ පිරියත සඳහා තීරු බදු සහ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම.

දැනට  කොළඹ හෝ ගම්පහ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් එම දිස්ත්‍රික්කවලින් පිටත දිස්ත්‍රික්කයක ප්‍රතිස්ථානගත කරන අවස්ථාවකදී,  ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාවේ අඩු කිරීමක් නොකරන්නේ නම් ඉහතින් යෝජනා කරනු ලැබූ දිරිගැන්වීම් වලට අමතරව  ප්‍රතිස්ථානගත කිරීමේ වියදම, ආදායම් බදු ගනනය කිරීමේදී අඩු කිරීමට ඉඩ දෙනු ඇත.  මෙම යෝජනාව ඉක්මණින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් පහසුකම් ලබාදීම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත බාර කරනු ඇත.

37. **උසස් තාක්ෂණය පදනම් කරගත්  කර්මාන්ත සඳහා දිරි ගැන්වීම්.**

සෞඛ්‍ය සේවා, මුද්‍රණ, මැණික් කැපීම සහ ඔපදැමීම, ඇසුරුම් සහ සහල් මෝල් වැනි කර්මාන්ත තරඟ කාරිත්වයකට මුහුණ දිය යුතු බැවින් ඒවා ඉක්මණින් වෙනස් වන නව තාක්ෂණ දියුණුව සමඟ උරෙන් උර ගැටී සිටීම අවශ්‍ය වෙයි.  මේ නිසා මෙම කර්මාන්ත සඳහා ප්‍රයෝජනයට ගන්නා යන්ත්‍ර සූත්‍ර සඳහා ප්‍රාග්ධන දීමනාව සියයට 33 1/3  දක්වා වැඩි කරනු ඇත.  මෙම  කර්මාන්ත තව දුරටත් ආකර්ෂණීය කරනු වස් මෙවැනි යන්ත්‍ර සූත්‍ර සඳහා වන තීරු බදු අදාළ අමාත්‍යාංශයේ හෝ නියෝජිත ආයතනයේ පරීක්ෂාව යටතේ නිදහස් කරනු ලැබේ.  නව තාක්ෂණය ලබා ගනිමින් සිය නිෂ්පාදන වල තත්ත්වය ඉහළ නැංවීම සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර ගත් යෝජනා ක්‍රමය 2007 දෙසැම්බර් දක්වා දීර්ඝ කරනු ලැබේ.  සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය විශාල ප්‍රමාණයකට සහයක් ඇති වන පරිදි ආයෝජන සීමාව රුපියල් මිලියන 5 සිට 2 දක්වා අඩු කරනු ලැබේ.

38. **ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන වාර්ෂිකයන් බද්දෙන් නිදහස් කිරීම**

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් වෙත දැනට විවෘතව ඇති සියළුම ව්‍යවස්ථාපිත විශ්‍රාම දීමනා සැලසුම්, එම සේවා නියුක්තිකයන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී එකවර ගෙවීමකින් සමන්විත ගෙවීමක් ලබා දෙන නමුත් ජීවිත කාලය සඳහා අඛණ්ඩ ආදායම් මාර්ගයක් ලබා නොදේ.  විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබන එවැනි එක් ගෙවීමකින් සමන්විත ගෙවීම තමන්ට මූල්‍ය ස්වාධීනත්වය ලබා ගත හැකි වන සේ, ජීවිත කාලය තුළ අඛණ්ඩ ආදායම් මාර්ගයක් බවට පත් කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම බොහෝ පුද්ගලයන් වෙත නැත. අප සමාජයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සංඛ්‍යාව ඉහළ යාම සමගම මහළු වයස සඳහා ඉතිරි කිරීම් දිරිමත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.  ඒ නිසා විශ්‍රාමිකයන් සඳහා ආදායම් සැලසුම් ප්‍රවර්ධනය කරනු වස් මිලයට ගත් වාර්ෂික ආදායම් බද්දෙන් මුළුමනින්ම නිදහස්  වනු ඇත.  බැංකු සහ මූල්‍ය ආයතන විසින් එකී සැලසුම් වර්ධනය කිරීම සහ අප රටේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දිරි ගැන්වීම් යොදා ගත යුතුය.

39. **වෘත්තිකයන් සඳහා දිරි ගැන්වීම්**

පුද්ගලයන් සහ හවුල් ව්‍යාපාර විසින් ශ්‍රී ලංකාවෙන් පිටතදී කරනු ලබන වෘත්තීමය කටයුතු වලින් උපයන ලාභය බද්දෙන් නිදහස් කිරීම සහ ශ්‍රී ලංකාව තුළදී කරනු ලබන එම කටයුතු වලින් උපයන ලාභය සියයට 10 ක බද්දකට යටත් කිරීම වර්තමාන බදු ප්‍රතිපත්තිය වෙයි. අවස්ථා දෙකෙහිදීම වෘත්තීය ඉපයීම් බැංකු පද්ධතිය මගින් ශ්‍රී ලංකාවට ගෙන ඒම සිදු විය

යුතුය. අපගේ වෘත්තිකයන් ජගත් සේවා සපයන්නන් වශයෙන් සීඝ්‍රයෙන් ඉදිරියට ඇදෙමින් සිටින හෙයින් සියළුම ශ්‍රී ලාංකීය වෘත්තිකයන් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටතදී, ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට, විදේශ මුදල් සඳහා, සපයනු ලබන සේවාවන් බද්දෙන් නිදහස් වනු ඇත. සමාගම් විසින් ශ්‍රී ලංකාව තුලදී විදේශ මුදලින් ගෙවීම් කරනු සඳහා සපයන එවැනි සේවාවන්ගෙන් උපදින, දැනට සම්මත අනුප්‍රමාණයෙන් බද්දට යටත් වන ලාභ, අපනයන ලාභ හා සමවන පරිදි සියයට 15 ක් වන අනුප්‍රමාණයෙන් බද්දට යටත් කරන අතර, ශ්‍රී ලංකාවෙන් පිටතදී සපයන සේවා සම්බන්ධයෙන් වන බදු නිදහස එලෙසම පවතිනු ඇත.

## 40. විදේශ මුදලින් වටිනාකම දැක්වෙන භාණ්ඩාගාර බැඳුම්කර

වසර 3-5 කින් කල් පිරෙන විදේශ මුදලින් වටිනාකම දැක්වෙන භාණ්ඩාගාර බිල් පත් නිකුත් කර, බද්දෙන් නිදහස් කිරීමට යෝජනා වී ඇති ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ගේ විදේශ මුදලින් වන ඉපැයීම් එම බැඳුම්කර වල ආයෝජනය කිරීමට දිරි ගන්වනු ඇත. ඒ අනුව ආයෝජනයේ වටිනාකම 1/5 ක් නොඉක්මවන අගයකින් යුත් තමා කැමති වාහනයක් තීරු ගාස්තු සහ සියළුම බදු වලින් සියයට 25 කින් වන සහනදායී බද්දක් පමණක් ගෙවීමට ආනයනය කිරීමට ඉඩ දෙනු ඇත. විදේශ ගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ඉපැයීම් මෙම බැඳුම්කර වල ආයෝජනය කිරීම මගින් ඔවුන්ටද මෙම දිරි ගැන්වීම් හිමි වනු ඇත.

## 41. නාවික කටයුතු

ප්‍රතිනැව්ගත කිරීමේ ක්‍රියාවන්ගෙන් නිර්වාසික නැව් සමාගම් ලබන ලාභ ආදායම් බද්දෙන් නිදහස් කර ඇතත් නැව් සමාගම් නියෝජිතයින්, ප්‍රතිනැව්ගත කිරීමේ ක්‍රියාවලිය තුල ඔවුන්ගේ සහභාගීත්වයෙන් ලබන ලාභ මත සම්මත අනුප්‍රමාණ අනුව ආදායම් බද්දට යටත් වේ. වෙළෙඳ නාවික අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ නැව් සමාගම් නියෝජිතයෙකුගේ, ප්‍රතිනැව්ගත කිරීම මත විදේශ මුදලින් ලැබෙන නියෝජිත ගාස්තුවට අදාළ වන ලාභ මත බදු අනුප්‍රමාණ, අපනයනවලට අදාළ වන්නා වූ අනුප්‍රමාණයම වන, සියයට 15 දක්වා අඩු කෙරේ. නැවක් ශ්‍රී ලංකා ධජය යටතේ ලියා පදිංචි කිරීම, ශ්‍රී ලංකාවට ආනයනය කිරීමක් ලෙස සැලකීම හේතුවෙන් එකතු කළ අගය මත බද්ද ගෙවීමට සිදුවීම නිසා, නැව් ශ්‍රී ලංකාවේ ලියා පදිංචි කිරීම කෙරෙහි දිරි ගැන්වීමක් නැත. ජාත්‍යන්තර භාන්ඩ ප්‍රවාහනය දිරිමත් කරනු වස් සියළු බදු වලින් නැව් නිදහස් කිරීම සම්මත ජාත්‍යන්තර ව්‍යවහාරයයි. ඒ අනුව බද්ද නිසා සිදුවන අවාසිය මග හරවනු වස් ශ්‍රී ලංකා ධජය යටතේ ලියා පදිංචි කරනු ලබන නැව් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.

## 42. පැවරුම් මිලකරණය හා පටු ප්‍රාග්ධනය

සම්බන්ධිත ආයතන දෙකක් පැවරුම් මිලකරණය (යාන්ත්‍රණයක් ලෙස) යොදා ගැනීම මගින් එම සම්බන්ධිත ආයතන සාමාජිකයින් වන සමාගම් සමූහයේ සමස්ත බදු බැදියාව අඩු කර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙයි. අසම්බන්ධිත මිල ක්‍රමයක මූලධර්ම උපයෝගී කර

ගනිමින් සම්බන්ධිත තැනැත්තන් අතර කෙරෙන එවැනි ගනුදෙනුවලින් පැනනගින අහිතකර බලපෑම් අහෝසි කිරීමට තරම් දේශීය ආදායම් පනතේ පවත්නා විධිවිධාන ප්‍රමාණවත් නොවේ. මේ නිසා අසම්බන්ධිත මිල ක්‍රමයක මූලධර්ම බදු නීතියට ඇතුළත් කිරීමට යෝජනා කෙරේ. සමාගම් සමූහයක සමස්ත බදුබර අවම කර ගැනීම සඳහා යොදා ගන්නා තවත් ක්‍රියාමාර්ගයක් වනුයේ පටු ප්‍රාග්ධනායනයයි. එක් සාමාජිකයෙකු විසින් තවත් සාමාජිකයෙකුට ගෙවනු ලබන පොළිය පිළිබඳ ගැලපීම් කිරීම මගින්, මෙම ක්‍රියාදාමය අධෛර්යමත් කෙරෙනු ඇත. නිෂ්පාදන සමාගමක දී ණය ස්කන්ධ අනුපාතය 2:1 ලෙස ද, අනිකුත් අවස්ථාවලදී එම අනුපාතය 3:1 ලෙසද විය යුතු යයි යෝජනා කෙරේ. නීතියේ පවතින මෙම දුර්වලතාවයන් මග හරවා ගැනීම මගින් අපේක්ෂිත අතිරේක ආදායම රුපියල් මිලියන 550 කි.

43. **ඇතැම් නිර්වාසිකයන්ගේ බදු කරණය**

ශ්‍රී ලංකාව තුල ව්‍යාපාර පවත්වාගෙන යන ඇතැම් නිර්වාසිකයන්ගේ ලාභය නිසැකයෙන් නිශ්චය කළ නොහැකි අවස්ථා වලදී, පිරිවැටුමෙහි සාධාරණ ප්‍රතිශතයක් ලෙස ලාභය ගණනය කළ යුතු බවට, දේශීය ආදායම් පනතේ 77 වගන්තිය විධිවිධාන සලසයි. ලාභය නිසැකයෙන් නිශ්චය කළ නොහැකි අවස්ථා කවරේදැයි පැහැදිලිව නිර්වචනය කර නොමැති නිසා සහ සාධාරණ ප්‍රතිශතය කුමක්දැයි තීරණය කිරීමෙහි තිබිය හැකි පුළුල් පරාසය නිසා අවශ්‍යයෙන්ම බදු පරිපාලනයෙහි තිබිය යුතු පාරදෘශ්‍ය භාවයට හානි පැමිණේ. අදාල පාර්ශව කරු සහ කොමසාරිස් ජනරාල් වරයා අතර ඇති කර ගනු ලබන පූර්ව ගිවිසුමක පදනම මත අදාල ලාභය නිශ්චය කිරීමට කොමසාරිස් ජනරාල් වරයාට බලය පැවරීම මගින්, මෙම වගන්තිය වඩාත් පැහැදිලි කිරීමට යෝජනා කෙරේ. එහෙත් එසේ ගිවිසුමක් ඇති කර ගැනීමට නම් අදාල තොරතුරු සැපයිය නොහැකි බවට එම පාර්ශව කරු විසින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතුය. තවද, ගිවිසුම අනුව නිශ්චය කරනු ලබන ලාභය ශ්‍රී ලංකාවෙහි මෙහෙයුම් වලින් උද්ගත වන පිරිවැටුමෙන් සියයට 6 කට නොඅඩු විය යුතුය. මේ සංශෝධනයෙන් රුපියල් මිලියන 150 ක අතිරේක ආදායමක් අපේක්ෂා කෙරේ.

44. **බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන වෙතින්වූ පොළී බදුකරණය**

දැනට පවතින ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් මූල්‍ය අංශ මත පනවා ඇති නියමයන් කෙරෙහි අනුකූලතාවය දැක්වීමේ අපහසුතාවය සම්බන්ධයෙන් මූල්‍ය අංශ වෙතින් පැමිණිලි ලැබී ඇත. ඒ අනුව, මූල්‍ය ආයතනවල කාර්යභාරය පහසු කිරීම සහ ඒ සමඟම අනුකූලතාවය වර්ධනය කර ගැනීම සඳහා දැනට පවතින ක්‍රමය පහත දැක්වෙන ලෙස වෙනස් කරනු ඇත.

(අ) තැන්පත්කරු තම මුළු පොළී ආදායම මසකට රුපියල් 9,000 ක් හෝ වර්ෂයකට රුපියල් 108,000 ක් නොඉක්මවන බවට ප්‍රකාශනයක් කරන්නේ නම්; හෝ යම් බැංකු ශාඛාවක් වෙතින් ලබන මුළු පොළිය මසකට රුපියල් 1,000 ක් හෝ වර්ෂයකට රුපියල් 12,000 ක් නොඉක්මවන්නේ නම් පමණක් බදු අඩු නොකරනු ඇත.

(ආ) සියයට 10 අනුපාතය මත අඩු කිරීම් කරනු ලැබූ පොලී ආදායම්, පුද්ගලයන්ගේ තක්සේරු වන ආදායමේ කොටසක් නොවනු ඇත. එසේ අඩු කරනු ලැබූ බද්ද අවසාන බද්ද ලෙස සලකනු ඇත.

45. **සංස්ථා ණය සුරැකුම්පත්**

බැංකු සහ මූල්‍ය ආයතනවලින් ලබන පොලී සියයට 10 වූ තනි අනුපාතයක් මත බද්දට යටත් කරන අතර, සංස්ථාපිත ණය සුරැකුම්පත්, සියයට 5 සිට සියයට 30 දක්වා වූ පරාසයක් තුළවූ සම්මත ආන්තික බදු අනුප්‍රමාණ තුළ බද්දට යටත් වේ. සංස්ථාපිත ණය සුරැකුම් වෙළඳ පොලට එරෙහි මෙම විශමතාවය ඉවත් කිරීම සඳහා බැංකුවලින් උපයන පොලී වෙත බදු කාර්යයන් සඳහා දක්වන සැලකීමට සමානම සැලකීමක් සංස්ථාපිත ණය සුරැකුම් පත්‍ර වලින් ලබන පොලී වෙතද දැක්වීමට යෝජනා කෙරේ.

46. **මුද්දර බද්ද නැවත පැනවීම**

2002 වර්ෂයේ මුද්දර බද්ද අහෝසි කරන අවස්ථාවේදී, එය රුපියල් මිලියන ලක්ෂ 8500 ඉක්ම වන බදු ආදායමක් ජනිත කළේය. බදු ආදායම් ප්‍රභවයක් ලෙස සැලකීමේදී මුද්දර බද්දෙහි ආකර්ශණීය ලක්ෂණ කීපයක්ම ඇත. යම් ගනුදෙනුවක් යථාවත් කරනු පිණිස ඊට අදාලව ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමට මුද්දර බද්ද විසින් ගනුදෙනුවේ පාර්ශවකරුවන්ට බල කිරීමක් කෙරේ. එමගින් එම ගනු දෙනුව ගිනුම් පරීක්ෂණයකින් විමසා බැලීමට අවස්ථාව සැලසේ. මුද්දර බද්ද ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන අතර, ආදායම් ලැබීම ක්ෂණික වේ. මේ නිසා මුද්දර බද්ද නැවත පනවනු ඇත. එහෙත් හර බද්දට යටත් ලේඛන හෝ සාධන පත්‍ර සහ වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්දට යටත් ණයවර ලිපි සහ කොටස් වෙළඳ පොලේ ගනු දෙනු මුද්දර බද්දෙන් නිදහස් වනු ඇත. මෙයින් ජනනය වන අතිරේක බදු ආදායම රුපියල් මිලියන 3,700 ක් ලෙස ඇස්තමේන්තු කරනු ලැබේ.

47. **ආර්ථික සේවා ගාස්තුව**

පසුගිය වසරේ හඳුන්වා දෙනු ලැබූ ආර්ථික සේවා ගාස්තුව මැනවින් ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් ආර්ථික සේවා ගාස්තුවේ වර්තමාන ස්වරූපය නිසා එයට අනුකූලතාවය දැක්වීමට දුෂ්කර වී ඇති ව්‍යාපාරික ආයතනවලට සහනයක් සැලසීමත්, ආර්ථික සේවා ගාස්තුව සරල කිරීමත් අරමුණු කරගෙන පහත සඳහන් සංශෝධන යෝජනා කෙරේ.

(අ) එක් ආයතනයක් විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව සඳහා පනවා ඇති රුපියල් මිලියන 50 සීමාව රුපියල් මිලියන 60 දක්වා වැඩි කරනු ඇත. දැනට බද්දට බැදෙන පිරිවැටුම රුපියල් මිලියන 50 කට අඩු අවස්ථාවක ආර්ථික සේවා ගාස්තුව අය නොකෙරේ. මෙම සීමාව රුපියල් මිලියන 40 දක්වා අඩු කරනු ඇත.

(ආ) පවතින නීතිය යටතේ ආර්ථික සේවා ගාස්තුවේ පදනම වන්නේ පෙර වර්ෂයේ පිරිවැටුමයි. මෙම පදනම පවත්නා වර්ෂයේ පිරිවැටුම ලෙස වෙනස් කරනු ඇත.

(ඇ) ගෙවනු ලැබූ ආර්ථික සේවා ගාස්තුව දැනට හිලව් කළ හැක්කේ බද්දට යටත් පිරිවැටුමට අදාල ආදායම් බද්දට පමණි. ඉදිරියේදී ආර්ථික සේවා ගාස්තුව ඕනෑම ආදායම් බද්දකට හිලව් කිරීමට ඉඩදෙනු ඇත.

(ඈ) දේශීය ආදායම් පනතේ 8(ආ) වගන්තිය යටතේ බද්දෙන් නිදහස් ආයතන ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් වනු ඇත.

(ඉ) බෙදාහරින්නන්, දියමන්ති කැපීම සහ ඔපදැමීම්, කුඩා තේ කම්හල් අයිතිකරුවන් යනාදි විවිධ ව්‍යාපාරික කොටස්වල බද්දට යටත් පිරිවැටුමෙහි අඩු කිරීමක් ඇති කරනු ඇත.

මෙම වෙනස්වීම්වලින් අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 1,000 කි.

48. **ඔට්ටු හා සූදු බද්ද**

නීති රීති වඩා සඵල ආකාරයෙන් බලාත්මක කිරීමට රජයට ඇති වගකීම අනුව යමින් අදාල ප්‍රඥාප්තීන් 80 කට අධික සංඛ්‍යාවක් සඳහා 2005 අය වැය ලේඛනය තුලින් සමූල වෙනස්කම් රාශියක් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රියාදාමය මගින් නීති බලාත්මක කිරීම් තීව්‍ර වූවා පමණක් නොව රජයට රුපියල් මිලියන 500 කට අධික ආදායමක් නීති කඩකිරීමේ දණ්ඩනය ලෙස අයකර ගත හැකි විය. ඔට්ටු හා සූදු ක්‍රීඩා පවත්වාගෙන යන ආයතන බොහොමයක් නීතියෙහි සහ එය බලාත්මක කරන ආයතනයන්හී පවතින විවිධ දුර්වලතා උපයෝගි කරගනිමින් ගෙවීම් පැහැරහරිනු ලබයි. රජයට කිසියම් බදු ප්‍රතිලාභයක් නොමැතිව අළුත් ඔට්ටු හා සූදු මධ්‍යස්ථාන හතු පිපෙන්නාක් මෙන් ඇතිවෙමින් පවතී. මේ නිසා මෙකී ඔට්ටු බද්ද පහත දැක්වෙන අයුරන් වැඩි කෙරේ. සජීවී විකාශණ සහිත මධ්‍යස්ථන සඳහා රුපියල් 300,000 බැගින්ද, සජීවී විකාශණ නොමැති මධ්‍යස්ථාන සඳහා රුපියල් 50,000 බැගින්ද බද්ද ගෙවිය යුතු වනු ඇත. සියළුම ඔට්ටු හා බදු ක්‍රීඩා ආයතන වසර 5 ක් ඇතුළත කොළඹින් බැහැර නිශ්චිත ප්‍රදේශ වල ප්‍රත්ස්ථාන ගත කරනු ඇත. මෙමගින් රුපියල් මිලියන 300 ක අතිරේක ආදායමක් අපේක්ෂා කෙරේ.

49. **එකතු කල අගය මත බද්ද**

එකතු කළ අගය මත බදු පනතේ දැනට පවතින ප්‍රතිපාදන අනුව අපනයනකරුවන් දින 30 ක් ඇතුළත ආපසු ගෙවීම් ලැබීමට හිමිකම් ලබයි. ආපසු ගෙවීමේ මුළු මුදල ආවරණය වන පරිදි බැංකු ඇපකරයක් හෝ රක්ෂණ බැඳුම්කරයක් ඉදිරිපත් කළ හැකි අපනයනකරුවන් සඳහා මෙම කාල සීමාව දින 15 දක්වා අඩු කෙරේ. අනෙකුත් අපනයනකරුවන් සඳහාවූ එම ආපසු ගෙවීම් කාල සීමාව එවැනි ආපසු ගෙවීම් සකස් කිරීමේදී ඇති වන අවදානම සැලකිල්ලට ගෙන දින 45 දක්වා දීර්ඝ කෙරේ. ආපසු ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා, ආනයන මත එකතු කරනු ලබන එකතු කළ අගය මත වූ බද්දෙන් සියයට 10 කට සමාන වූ මුදලක් නිරන්තරව බැර කරනු ලැබිය යුතු ආපසු ගෙවීමේ කාර්යය සඳහා වූ විශේෂිත ගිණුමක් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වාගෙන යනු ඇත. මේ මගින් ආපසු ගෙවීම් සඳහා වූ අරමුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට විධිමත්ව ගලා ඒම නොකඩවා සිදුවනු ඇත.

දැනට ශ්‍රී ලංකාවේ පවතින ක්‍රමය අනුව එකතු කළ අගය මත වූ බද්ද බොහෝ භාණ්ඩ සහ සේවාවල මිලට ඇතුළත් කර ඇත. ශ්‍රී ලංකාවෙන් බැහැරදී සිදුවන පාරිභෝජනයන් මත එකතුකළ අගය මත බද්ද අය නොකිරීමේ මූලික ප්‍රතිපත්තියට අනුව යමින් රටින් බැහැර වන මගීන්ගේ පහසුව සඳහා එකතුකළ අගය මත බද්ද ආපසු ගෙවීමේ කාර්යාලයක්, බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල තුළ පිහිටුවනු ඇත. මෙවැනි ආපසු ගෙවීම් එම ආපසු ගෙවීම් ඉල්ලීම ඇමෙරිකානු ඩොලර් 100 ඉක්මවන අවස්ථාවල පමණක් සිදු කරනු ඇත.

එකතු කළ අගය මත වූ බදු ක්‍රමය තුලට පහත දැක්වෙන වෙනස් කිරීම් ද යෝජනා කෙරේ.

(අ) මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 20 දක්වා වැඩි කෙරේ. අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 2,700 කි.

(ආ) දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන භාවිතය දිරිමත් කිරීම සඳහා ජින්ජ බියර්, පේයාව සහ නෙල්ලි වැනි ඖෂධීය සිසිල් බීම වර්ග මත වූ එකතු කළ අගය මත වූ බදු අනුපාතය සියයට 20 සිට සියයට 15 දක්වා අඩු කෙරේ.

(ඇ) පරිගණක භාවිතය ජනප්‍රිය කරවීම පිණිස පරිගණක සහ උපාංග එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරේ.

(ඈ) දේශීය ලී මෝල්කරුවන්, ඉදිකිරීමේ කර්මාන්තය සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා සහායවීමේ අරමුණින් සහ අපගේ ස්වාභාවික වනාන්තර ආරක්ෂා කරනු වස් සකස් නොකළ ලී කඳන් ආනයනය මත වූ එකතු කළ අගය මත බද්ද ඉවත් කෙරේ.

(ඉ) වෙළඳ ලාභය යථාවත්ව ප්‍රකාශවන පරිදි, තීරුබදු කාර්ය සඳහා තීරණය කරන ලද භාණ්ඩවල වටිනාකම මත රේගුවේදී අය කරනු ලබන එකතු කල අගය මත බද්ද සඳහා වූ ආන්තික ලාභය සියයට 7 දක්වා සංශෝධනය කෙරේ. මේ මගින් අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 2,000.

(ඊ) සියයට 5 අනුපාතය මත බදු අයවන අත්‍යාවශ්‍ය ආහාර අයිතමයන් සඳහා බදු මත බදු අයවීමේ බලපෑම අවම කිරීම සඳහා එම අයිතම රේගුවේදී පමණක් බද්දට යටත් කරනු ලබන අතර පසුව කෙරෙන විකිණීම් මත බදු අය නොවනු ඇත. මේ අනුව සීනි, පරිප්පු, අල, කරවල සහ එළු වල මිල පහල යනු ඇත.

(උ) ලියාපදිංචි තැනැත්තන්ගෙන් අය විය යුතු බද්ද වන්නේ තමා ගෙවනු ලැබූ බද්ද හිලව් කළ පසු ගෙවිය යුතු ශුද්ධ බද්ද වන බැවින්, අදාල බදු අයවන කාලසීමාව අවසානයේ වර්තාව ඉදිරිපත් කිරීම සමග කළ යුතු අවසාන ගැලපීම් කිරීමට යටත්ව, සියළුම ලියාපදිංචි තැනැත්තන් මාසික පදනම මත ගෙවීම් කළ යුතුවේ. මෙමගින් අපේක්ෂිත අතිරේක එකතු කළ අගය මත බද්ද රුපියල් මිලියන 1,500 ක් වන අතර මේ මගින් භාණ්ඩාගාරයේ මෙහෙයුම් කටයුතු ද කාර්යක්ෂම වනු ඇත.

(ඌ) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ධාන්‍ය වලින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන අධි ප්‍රෝටීන, අධි ශක්ති ජනක කෘෂි ආහාර එම ධාන්‍ය පූර්ව ඒකාබද්ධ කරන ක්‍රියා දාමයක් මගින් බාහිර වගා කරුවන්ගෙන් ලබා ගන්නේ නම් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කෙරෙනු ඇත.

බදු පරිපාලනය

50. **අධිකාර් බලය පැවරීම**

දේශීය ආදායම් සහ රේගු දෙපාර්තමේන්තු වඩාත් ක්‍රමානුකූලව සංවිධාන කිරීම තුලින්, තීරණ ගැනීමේ සහ කළමනාකරණ තලයේ අධීක්ෂණ කටයුතු ශක්තිමත් කරනු වස් ජ්‍යෙෂ්ඨ නිලධාරි සේවක සංඛ්‍යාව වැඩි කරනු ලැබ තිබේ. දේශීය ආදායම් සහ රේගු නීති යටතේ බලතල පැවරීම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සීමා කිරීම සඳහා එම පනත් සංශෝධනය කරනු ඇත. එකතු කළ අගය මත බදු පනතේ අඩංගු නිල රහසයතා වගන්තියේ විධිවිධාන, දේශීය ආදායම් පනතේ අදාල වගන්තියේ විධිවිධානවලට වඩා බොහෝ සෙයින් උග්‍ර වෙයි. එහෙයින් දේශීය ආදායම් පනතේ විධිවිධාන හා සමඟ ගැලපෙන ලෙස එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන සංශෝධනය කෙරෙනු ඇත.

51. **කාලාවරොධය- ආදායම් බද්ද**

අපගේ බදු ව්‍යවස්ථාවේ අඩංගුව පවතින කාලාවරොධය පනවන ලද්දේ මීට දශක 3 කට පමණ පෙර, නවීන තාක්ෂණය ලබාගත නොහැකි වූ වකවානුවකය. යම් තක්සේරු වර්ෂයක් සඳහා වාර්තා සැපයීම සඳහා ඉඩදී ඇති කාලය එම තක්සේරු වර්ෂය අවසානයේ සිට මාස 6 දක්වාත්, තක්සේරුවක් සෑදීම සඳහා දී ඇති කාලය තක්සේරු වර්ෂය අවසානයේ සිට මාස 18 දක්වාත් අඩු කෙරෙනු ඇත. වාර්තා සපයා නොමැති අවස්ථාවක තක්සේරු සෑදිය හැකි කාල සීමාව අවුරුදු 3 දක්වා අඩු කරනු ඇත.

52. **ආයාචනා ලැබුණු බව දැන්වීම.**

දැනට පවත්නා නීතිය අනුව යම් තක්සේරුවකට එරෙහිව ඉදිරිපත් වූ ආයාචනයක් එම ආයාචනය ලැබුණු බව තක්සේරුකරු විසින් දැන්වීමේ දින සිට වසර දෙකක් ඇතුළත දෙපාර්තමේන්තු මට්ටමින් විසඳිය යුතු වේ. ආයාචනය ලැබූ බව දැන්වීමේ ලිපිය සැලකිය යුතු තරම් ප්‍රමාද වන බවට පෙනීගොස් ඇත. මෙම අකාර්යක්ෂම ක්‍රියාදාමය අහෝසි කරනුවස් ආයාචනය ලැබුනු බව දැන්වීමේ ලිපිය නිකුත් නොකළ අවස්ථාවක එම අභියාචන ලිපිය ලැබුණ දින සිට දින 30 ඇතුළත අභියාචනය ලැබුන ලෙස සලකන පරිදි ව්‍යවස්ථා සම්පාදනය කිරීමට කාලය පැමිණ ඇත. එම දිනය සනාථ කිරීමේ කාර්ය භාරය අභියාචක වෙත පැවරෙනු ඇත. මෙම තත්ත්වය ආදායම් බදු සහ එකතු කල අගය මත බදු යන දෙකටම අදාළ වනු ඇත. රිතියක් මාස 12 ක් ඇතුලත කොමසාරිස්වරයෙකු හෝ ඊට ඉහළ නිලධාරියෙකු විසින් නිකුත් කළ යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින් පෞද්ගලිකවම අනු අත්සන තැබිය යුතුය.

53. **බදු අනුකූලතාව**

ස්වතක්සේරු ක්‍රමය ශ්‍රී ලංකා බදු ක්‍රමයට හඳුන්වා දෙනු ලැබුයේ 1972 දීය. ස්වතක්සේරු ක්‍රමයක ඇති වැදගත්ම අංග ලක්ෂණ වන්නේ බදු දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමකින් තොරව, බද්දට බැඳෙන සෑම තැනැත්තෙක්ම ඔහුගේ බදු බැදියාව ගනනය කර, නම් කළ බැංකුවකට බද්ද ගෙවා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීමේ හැකියාවයි. කණගාටුවට කරුන වන්නේ ශ්‍රී ලංකාව ස්වේච්ඡා අනුකූලතාවය පිළිබඳ දියුණුවක් ලබා නොතිබීමයි. බදු

පරිපාලනය සවිමත් කිරීම තුළින් සහ අනුකූලතාව දැක්වූ බදු ගෙවන්නන් අගය කිරීම කිරීම මගින් අනුකූලතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් යෝජනා ගණනාවක් පසුගිය වර්ෂයේදී යෝජනා කරනු ලැබිණ. අනුකූලතාවය වැඩි දියුණු කිරීම සඳහා නීති ගරුක බදු ගෙවන්නන් වෙත තවදුරටත් දිරිගැන්වීම් ප්‍රදානය කෙරේ.

(අ) **වාර්තා පිළිගැනීම.**

i බදු ලිපිගොනුවක් විවෘත කරවා ගැනීම මගින් ස්වේච්ඡාවෙන්ම බදු ක්‍රමයට ඇතුළත් වන පුද්ගලයෙකුගේ ආදායම රුපියල් දශලක්ෂයකට අඩු වූ අවස්ථාවලදී, ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමකින් තොරව ඔහුගේ/ ඇයගේ වාර්තාව පිළිගනු ඇත. මෙම යෝජනාව මගින් කුඩා පරිමාණ බදු ගෙවන්නන් කරදරකාරී පරිපාලන ක්‍රියාමාර්ගයන්ගෙන් තොරව බදු ක්‍රමයට ඇතුළත්වීම දිරිමත් වනු ඇත.

ii 2005/06 හෝ ඉන් අනතුරුව වන තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකු විසින් ආදායම් වාර්තාවක් සපයා ඇති අවස්ථාවක පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් එම වාර්තාව පිළිගනු ලබන අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක තක්සේරු නොසාදනු ඇත.

- පෙරාතු වර්ෂ තුන තුලදී ඔහු/ඇය වාර්තා සැපයීම හා බදු ගෙවීම් සම්බන්ධව නීතිමය අවශ්‍යතාවයන් හා අනුගත වී සිටීම.
- පෙරාතුවම වූ වර්ෂය සඳහා වූ බද්ද මෙන් සියයට 120 කට නොඅඩු මුදලක් බදු වශයෙන් ගෙවා තිබීම හෝ පෙරාතුවම වූ වර්ෂය සඳහා වූ තක්සේරුවන ආදායම මෙන් සියයට 125 ට නොඅඩු තක්සේරු වන ආදායමක් ප්‍රකාශ කරමින් ආදායම් වාර්තා සපයා තිබීම සහ එකී වර්ෂය සඳහා ගෙවිය යුතු වූ බද්ද සම්බන්ධයෙන් යම් වංචාවක් හෝ මගහැරීමක් කර නොමැති බවට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

(ආ) **යහපත් බදු ගෙවන්නන් සඳහා දිරි ගැන්වීම්.**

ප්‍රමාද වී කරනු ලබන බදු ගෙවීම වලට අදාලව සිදුවී ඇති ප්‍රමාදයේ කාල පරිච්ඡේදය පදනම් කර, සියයට 10 සිට සියයට 50 දක්වා වන පරාසයක පැතුරුනු දඩ පනවනු ලැබේ. මේ තත්ත්වය යටතේ නිසි කලට කරන බදු ගෙවීම් සඳහා වට්ටමක් ප්‍රදානය කිරීම සාධාරණ වනු ඇත. මේ නිසා යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයකු විසින් ගෙවිය යුතු මුළු බද්ද ගෙවිය යුතු දිනට මසකට කලින් ගෙවන අවස්ථාවන්හිදී සියයට 10 ක වට්ටමක් දිය යුතු යයි යෝජනා කෙරේ.

(ඇ) **අනුකූලතාව දක්වන බදු ගෙවන්නන්ට තැගි**

යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් 250,000 නො අඩු බද්දක් ගෙවන යම් පුද්ගලයකු එම මට්ටම 2003 වර්ෂයෙන් ආරම්භ වන අවුරුදු 5 ක කාල පරිච්ඡේදයක්

තුල පවත්වා ගන්නේ නම් ඔහුට අභිමත වාහනයක් සියළු බදු වලින් සියයට 25 ක සහනයක් මත ආනයනය කිරීමට ඉඩදෙනු ඇත. වාහනය මෝටර් රථයක් වන්නේ නම්, එහි එන්ජින් ධාරිතාව ඝන සෙ.මී. 1,500 නො ඉක්මවිය යුතුය. එහෙත් වෑන් රථ, ට්‍රක් රථ, යතුරු පැදි හා එවැනි වෙනත් වාහන සඳහා එන්ජින් ධාරිතාව මත සීමා නොපැනවේ.

54. **නව දේශීය ආදායම් පණතක්**

2000 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබූ දේශීය ආදායම් පණත ඉන්පසුව ර්ට කෙරුනු සංශෝධන හේතුවෙන් සංකීර්ණ බවට පත්වී ඇත. ඒ අනුව 2006 අප්‍රේල් මාසයෙන් පසුවට අදාල නොවන සියලු විධිවිධාන ඉවත් කරමින් සහ දැන් කරනු ලබන යෝජනා ද ඇතුලත් කරමින් නව දේශීය ආදායම් පනතක් සකස් කෙරේ. මෙම නව පනත 2006 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරේ.

55. **බදු විද්‍යායතනයක් පිහිටුවීම.**

බදු පිළිබඳ දැනුමේ ගැඹුර හා ගුණාත්මක භාවය වර්තමානයේදී බොහෝදුරට පිරිහී ඇති බව බදු ගෙවන්නන් හා බදු වෘත්තිකයන් අතර පවතින සාමාන්‍ය මතයයි. මේ තත්ත්වය වෙනස් කර ප්‍රබුද්ධ බදු සංස්කෘතියක් ඇති කරනු සඳහා ස්වාධීන බදු විද්‍යායතනයක් පිහිටු විය යුතු යැයි යෝජනා කරමි. මේ සඳහා රුපියල් මිලියන 50 ක් වෙන් කරනු ඇත.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිසංවිධාන හා ඉහත දැක්වූ පරිපාලන වෙනස්කම් තුළින්, ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, පොලී මත වූ බද්ද හා රේගු බදු හරහා ඇස්තමේන්තු කරන ලද අතිරේක ආදායම රුපියල් මිලියන 1,750 කි.

56. **දේශීය මූලාශ්‍ර තුලින් අපනයන කර්මාන්තයක් බිහි කිරීම**

දේශීය සම්පත් උපයෝජනය මගින් අපනයන කර්මාන්ත බිහිකිරීම සඳහා අපනයන අභිමුඛ යෙදවුම් හා අන්තර් භාණ්ඩ දේශීය වශයෙන් නිපදවා ඇඟළුම් කර්මාන්ත කරුවන්ට සපයන නිෂ්පාදකයන්ගේ නිමැවුම් මත වන වැට් බද්ද අත්හිටුවීම පසුගිය අයවැය තුළින් ආරම්භ කරන ලදී. මෙය අනෙකුත් අපනයන අභිමුඛ කර්මාන්තවලට ද ගෙන ඒමේ හැකියාව පවතී. ඒ අනුව, රෙදිපිළි පංගු මණ්ඩලය හෝ අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ඇඟළුම් නිෂ්පාදකයන් ඇතුළු සම්ප්‍රදායික නොවන අපනයන අභිමුඛ සමාගම් වලට යෙදවුම් සහ අන්තර් භාණ්ඩ සපයන නිෂ්පාදකයන් මෙම වැට්බදු අත්හිටුවීමේ වැඩපිළිවෙලට ගෙන ඒමට කටයුතු කෙරේ. තවද අමුද්‍රව්‍ය මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ ද විලම්භන වැට් පදනම යටතේ ආනයනය කිරීමේ පහසුකම් ද ලබාදෙනු ඇත. අපනයන කරුවන්ට ලැබුණු ප්‍රාග්ධන භාණ්ඩ සඳහා ආනයනය කරන අවස්ථාවේ වැට්බදු විලම්භනයක් ලැබේ. මෙම නියමය නිසා එම නිෂ්පාදකයන්ට මුදල් ප්‍රවාහ ගැටළු වලින් සහනයක් හිමිවනු ඇත.

ලෝක වෙළඳපොළේ රෙදිපිළි සහ ඇඟළුම් සඳහා වූ සලාක ඉවත් කිරීමත් සමඟ ගැණුම්කරුවන්ගේ කැමැත්ත වන්නේ මෝස්තර නිර්මාණය, භාණ්ඩ සංවර්ධනය සහ සේවා සැපයීම ඇතුළු පූර්ණ විසඳුම් සැපයීමට හැකියාවක් ඇති සමාගම් වෙතට ඇණවුම්

ලබාදීමටය. නමුත් ඒ සඳහා ඉහල ආයෝජන පිරිවැයක් දැරිය යුතු බැවින් බොහෝ කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තශාලාවලට එවැනි සමාගම් තත්ත්වයට පත්වීමට හැකියාවක් නොමැත. එහෙයින් ඇඟළුම් මැසීමේ හෝ එකලස් කිරීමේ හෝ ඇඟළුම්වල ගුණත්වය හෝ ලක්ෂණ හෝ අපනයනය කරන ඇඟළුම්වල වටිනාකම වැඩිදියුණු කිරීමේ කාර්යයන්හි උප කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ කටයුතු කරන ලියාපදිංචි ඇඟළුම් නිෂ්පාදිතයන්ගේ ආදායම්, අවසාන නිමවුම අපනයනය කරමින් සිටින සමාගම අපනයනය කිරීමෙන් උපයාගත් විදේශ විනිමය ආදායමක් ලෙස සලකනු ලැබේ.

57. තීරු බදු

කර්මාන්ත සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමට මූලික අමුද්‍රව්‍ය පහළම තීරුබදු අනුපාත යටතේ පවත්වා ගෙන යමින් අතරමැදි හා නිමි භාණ්ඩ සඳහා මැදි හා ඉහළ තීරු බදු අනුපාත පවත්වා ගෙන යාමට රජය කැප වී සිටී. ඒ අනුව සමහර අන්තර් භාණ්ඩ හා මූලික අමුද්‍රව්‍ය අඩුම තීරු බදු අනුපාත යටතේ වර්ග කර ඇත. පහත සඳහන් වෙනස්කම් ද සිදු කරනු ඇත.

(අ) ඇසුරුම් හා මුද්‍රිත ද්‍රව්‍යයන් වැනි දෑ සඳහා වන තීරු බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම එම කාර්මාන්තයේ සීඝ්‍ර වර්ධනය උදෙසා සිදු කරනු ඇත.

(ආ) සංගීත කලාව පිළිබඳ අධ්‍යාපනය නංවාලීමේ අදහසින් සංගීත භාණ්ඩ සඳහා වන සියයට 28 ක්වූ ආනයන බද්ද සියයට 15 දක්වා අඩු කරනු ඇත.

(ඇ) එසේම ලක්ෂ 2 ක් පමණ වන ත්‍රී රෝද රථ හිමියන්ට සහනයක් සැලසීම සඳහා ත්‍රී රෝද රථ ටයර් සඳහා සියයට 28 ක් වූ ආනයන තීරු බදු සියයට 15 දක්වා අඩු කර ඇත.

(ඈ) අගය තක්සේරු කිරීමේදී සැලකිය යුතු සංකීර්ණතා මතුවන පාම් තෙල්, විදුලි පංකා සහ එහි අමතර කොටස් වැනි භාණ්ඩ නිශ්චිත තීරු බදුවලට යටත් කර ඇත

(ඉ) තත්ත්වයෙන් පහත් වාහන ආනයනය අධෛර්යමත් කිරීම සඳහා පාවිච්චි කරන ලද වාහන ආනයනය කිරීමේදී අපනයන පරීක්ෂණ සහතිකයක් අවශ්‍ය වනු ඇත.

(ඊ) අපනයන කර්මාන්ත දිරිගැන්වීම සඳහා සමහර වෙළෙඳ භාණ්ඩ සඳහා අය කරනු ලබන සෙස් බදු අනුපාත සංශෝධනය කර ඇති අතර, එම භාණ්ඩ සඳහා අදාළ ගැසට් නිවේදනය ද නිකුත් කර ඇත.

(උ) දැනට පවත්නා සියයට 10 ක අධිභාරය තවදුරටත් ක්‍රියාත්මක වනු ඇත.

මෙම වෙනස්කම්වලට අදාළ නව ආදායම් ආරක්ෂණ නියෝගය දැනටමත් ක්‍රියාත්මක කර ඇත. තීරු බදු හා සෙස් බදු වෙනස් කිරීම තුළින් අපේක්ෂිත ශුද්ධ ආදායම රුපියල් මිලියන 3,500 ක් වේ.

58. වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද (PAL)

අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ආනයනයන් හැරුණු කොට අනෙකුත් ආනයන සඳහා දැනට පවතින සියයට 1.5 ක් වූ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ලබන වසරේ ජනවාරි මස සිට සියයට 2.5 දක්වා ඉහළ නංවනු ඇත. අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ආනයනයන් සඳහා දැනට පවතින සියයට 0.25 වූ මෙම

බද්ද, අපනයන දිරි ගැන්වීම සඳහා මුළුමනින්ම ඉවත් කරනු ලැබේ. මෙම සංශෝධනය මගින් රුපියල් මිලියන 2,500 ක ආදායමක් අපේක්ෂා කෙරේ.

59. **නිෂ්පාදන බදු**

සිගරැට් සහ මත්පැන් භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ඒ සඳහා අදාළ නිෂ්පාදන බදු නිරතුරුව ඉහළ දැමිය යුතු වේ. එසේම නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය සහ නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය තුරන් කිරීම සඳහා වැටලීමේ මෙහෙයුම් වැඩි කිරීම ද අවශ්‍ය වේ. මේ අනුව පොලිස් දෙපාර්තමේන්තුව විසින් බස්නාහිර පළාත තුළ මෙවැනි මෙහෙයුම් දැනටමත් දැඩි කර ඇත. ඒ අතරම රජය විසින් නව මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇත. මෙම පසුබිම යටතේ පහත සඳහන් ක්‍රියාමාර්ග ද ගනු ඇත.

(අ) මෑතකදී සිදු කරන ලද වෙනස්කම්වලට අමතරව, දුම්වැටි මත නිෂ්පාදන බදු දුම්වැටියකට ශත 50 බැගින් මෙන්ම සැර මත්පැන් සඳහා වන නිෂ්පාදන බදු සම්මත ලීටරයකට රුපියල් 15 බැගින් ද, බීර සඳහා වන නිෂ්පාදන බදු ලීටරයකට රුපියල් 5 බැගින්ද තවදුරටත් වැඩි කිරීම ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත. මින් රුපියල් මිලියන 4,300 ක අමතර ආදායමක් බලාපොරොත්තු වේ.

(ආ) සිල්ලරට මත්පැන් විකුණන සියළුම ස්ථාන සඳහා අදාළ බලපත්‍ර ගාස්තුව සියයට 50 කින් ඉහළ නංවනු ඇත. මෙමගින් අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 400 කි.

60. **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු**

(අ) තත්ත්වයෙන් බාල ජංගම දුරකථන නීති විරෝධීව ආනයනය කිරීම වැළැක්වීමට සහ ප්‍රමිතියකින් යුත් ජංගම දුරකථනවල පිරිවැය අඩු කිරීම සඳහා ජංගම දුරකථන සඳහා අය කළ සියයට 10 ක නිෂ්පාදන බද්ද ඉවත් කර ඇත.

(ආ) ක්ෂේත්‍ර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, ව්‍යාප්ති සේවා නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ මාධ්‍යවේදීන් වෙනුවෙන් සහන සැලසීම පිණිස යතුරු පැදිවල මිල අඩු කිරීමට යතුරු පැදි සඳහා වූ සියයට 5 සහ සියයට 15 ක්වූ නිෂ්පාදන බද්ද ඉවත් කර ඇත.

(ඇ) දේශීය අගය එකතු කිරීම ඉහළ නැංවීම සඳහා නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ සුදුසුකම් ලබන සහ සියයට 30 ක් දේශීය වශයෙන් අගය එකතු කිරීම සහතික කරන මෙරටදී එකලස් කරනු ලබන අළුත් මෝටර් රථ, නිෂ්පාදන බද්දෙන් නිදහස් කරනු ලැබේ.

61. **රාජ්‍ය සේවක වැටුප්**

2005 අයවැය තුළින් අවමය මසකට රුපියල් 3,250 ක්ද උපරිමය මසකට රුපියල් 9,000 ක් දක්වා සියයට 40 කින් රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමට යෝජනා කරන ලද අතර, රජය විසින් රුපියල් 2,500 ක් හෝ සියයට 50 ක් යන දෙකින් වැඩි ප්‍රමාණය ලබා දීමට කටයුතු කරන ලදී. ඉතිරිය 2006 වර්ෂයේදී ගෙවීමට නියමිතව තිබුණි. පරිපාලනය සඳහා වූ ජාතික සභාව විසින් දැනට රාජ්‍ය සේවකයින් ලබන අන්තර් දීමනාවන්ද, ජීවන වියදම් දීමනාවන් ද

ඇතුළත්ව රාජ්‍ය සේවක අවම මාසික වැටුප රුපියල් 11,630 ක් වන පරිදි වන වැටුප් ව්‍යුහයක් දැන් සකස් කර තිබේ. මෙම නව වැටුප් ව්‍යුහය තුළින් පසුගිය වර්ෂයේ අනුමත කරන ලද වැටුප් වැඩිවීමට වඩා ඉහළ වැටුප් වැඩිවීමක් ප්‍රදානය කරන අතර පවත්නා වැටුප් විෂමතාවයන් ද නිවැරදි කෙරේ. එසේ නමුදු, මෙම නව වැටුප් ව්‍යුහයට පරිවර්තනය වීම එක අවුරුද්දකින් කිරීමේදී ඇති වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් නිර්දේශිත වැටුප් යෝජනාව පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

(අ) පොලීසිය සහ සන්නද්ධ සේනාවල සාමාජිකයින් ඇතුළු සියළුම රාජ්‍ය සේවකයින් සඳහා රුපියල් 1,000 ක ජීවන වියදම් දීමනාවක් ගෙවනු ඇත. මෙම ජීවන වියදම් දීමනාව සෑම වර්ෂයකම ජුනි සහ දෙසැම්බර් මාසවල අවසානයේදී පවතින ජීවන වියදම් දර්ශකයට අනුරූපව වෙනස් වන ඒකකයකට රුපියල් 2.50 බැගින් සංශෝධනය කරනු ඇත.

(ආ) දැනට ලබන වැටුප් සහ යෝජිත වැටුප අතර වෙනසින් සියයට 50 ක් 2006 වර්ෂයේදී ද, 2007 වර්ෂයේදී ඉතිරි සියයට 50 ද ලබා දෙනු ඇත. මෙම සංශෝධනයන් මගින් 2006 වර්ෂයේදී මසකට අවම වශයෙන් රුපියල් 1,300 ක (ජීවන වියදම් දීමනාවද ඇතුළත්ව) වැටුප් වර්ධනයක් ලැබෙනු ඇත.

(ඇ) භාවිතා නොකරන නිවාඩු දින 30 ක උපරිමයකට යටත්ව අදාළ වසරේ දෙසැම්බර් මස වැටුප පදනම් කොට ගෙන ලබා නොගත් නිවාඩු දින සඳහා මුදල් ලබා ගැනීමට පොලීසිය සහ හමුදාවල සාමාජිකයින්ද ඇතුළත්ව රාජ්‍ය සේවකයින්ට ඉඩ සලසා දෙනු ඇත. කෙසේ වුවද, සියලු රාජ්‍ය සේවකයින් සෑම වසරකදීම දින 7 ක් අඛණ්ඩව නිවාඩුවක් ලබා ගත යුතුවේ.

(ඈ) සියළුම පිරිමි රාජ්‍ය සේවකයින්ට දින 3 ක විශේෂ නිවාඩුවක් තම දරු උපතකදී ලබා දෙනු ඇත.

(ඉ) සෞඛ්‍ය, වන සංරක්ෂණය, වනජීවී සංරක්ෂණය හා දුම්රිය වැනි හඳුනාගත් විශේෂිත අංශයන්ගේ සේවකයින් වෙනුවෙන් ඔවුන්ගේ වෘත්තීයමය අවදානම අවම කිරීම පිණිස අවදානම සඳහා වන රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත.

(ඊ) රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහය තවදුරටත් ක්‍රමවත් කිරීමට සහ වෘත්තීය වර්ධනයන් සඳහා යෝජනා ක්‍රමයක් ඇති කිරීමට පරිපාලනය පිළිබඳ ජාතික සභාව මගින් රාජ්‍ය අංශයේ වෘත්තීය වර්ගීකරණයක් සකස් කෙරෙනු ඇත.

(උ) අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ, රාජ්‍ය සේවකයින් සහ විශ්‍රාමිකයින්ට වෛද්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රජයේ රෝහල්වල විශේෂිත වාට්ටු ඇති කරනු ඇත.

(ඌ) දැනට බැංකු ක්‍රමය හරහා රාජ්‍ය සේවකයින්ට නිවාස ණය ලබාදීමේ ක්‍රමය, 2006 වර්ෂයේ සිට පොලීසියේ සහ හමුදාවල සේවයේ නියුතු අයට ද ලබා දෙනු ඇත. ණය ප්‍රමාණය රුපියල් මිලියන 3 ක උපරිමයකට යටත්ව අවුරුදු 7 ක වැටුපට සමාන අගයක් දක්වා ඉහළ දමනු ඇත.

(එ) රාජ්‍ය සේවකයින්ට වාහන සඳහා ණය ලබාදීමේ ක්‍රමයද බැංකු පද්ධතිය හරහා ලබාදීම තුළින් එහි කළමනාකරණය කාර්යක්ෂම කරනු ඇත.

(ඒ) සුදුසුකම් ලබන රජයේ සේවකයින් සඳහා ධාරිතාවය 1,500 ක් දක්වා වූ වාහන මිලදී ගැනීමට සියයට 25 ක සහනදායි බදු අනුපාතයක් (ඩීසල් වාහන සඳහා සියයට 40) ලබන වසරේ සිට හඳුන්වා දෙනු ඇත. සුදුසුකම් ලබන නිර්නායකයන් සහ ක්‍රියාත්මක වන ආකාරය ජනවාරි මසදී තීරණය කර අවසන් කරනු ලබන අතර අදාළ චක්‍ර ලේඛනය මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ඇත.

දැනටමත් අයවැය ඇස්තමේන්තුවල පසුගිය වසරේ යෝජනාවලට අනුරූප ඉතිරි වැඩි කිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, තවත් රුපියල් මිලියන 9,600 ක් නව වැටුප් වැඩි කිරීම වෙනුවෙන් වෙන් කෙරෙනු ඇත.

## 62. විශ්‍රාම වැටුප්

රාජ්‍ය සේවකයන් හට යෝජිත වැටුප් සංශෝධනවලට අනුරූපව පහත සඳහන් වෙනස්කම් විශ්‍රාමිකයන් හට ලබාදීම සිදු කරනු ඇත.

(අ) විශ්‍රාමිකයන්ට ජීවන වියදම් දීමනාව වශයෙන් මසකට රුපියල් 500 ක් ලබා දෙනු ඇත. මෙම දීමනාව සෑම මාස 6 කටම වරක් පවතින ජීවන වියදම් දර්ශකයට අනුරූපව වෙනස් වන ඒකකයට රුපියල් 2.50 බැගින් සංශෝධනය කරනු ඇත.

(ආ) විශ්‍රාමිකයින්ට දෙනු ලබන අන්තර් දීමනා විශ්‍රාම වැටුපට ඒකාබද්ධ කරන අතර අඩු නොකළ විශ්‍රාම වැටුපෙන් සියයට 10 ක දීමනාවක් මසකට අවමය රුපියල් 500 කට සහ උපරිමය රුපියල් 1250 කට යටත්ව 2006.01.01 දින සිට ලබා දෙනු ඇත. කෙසේ වුවද 2004.12. 01 දින සිට 2005.12.31 දින දක්වා එම දින දෙකද ඇතුළු වකවානුව තුළ විශ්‍රාම ගත් අය මෙම වැඩිවීමට හිමිකම් නොකියයි. මෙම වෙනස්කම් තුළින් විශ්‍රාමිකයින්ට අවම වශයෙන් රුපියල් 1000 ක වැඩිවීමක් හිමිවනු ඇත (ඉහත (අ) සහ (ආ) මගින්).

(ඇ) රාජ්‍ය පරිපාලන 06/2004 චක්‍රලේඛය, 1997.01.01 ට පෙර විශ්‍රාම ගිය අය සඳහාත් වලංගු කිරීම තුළින් රාජ්‍ය පරිපාලන 2/97 චක්‍රලේඛය මගින් ලබා දෙන ලද වැටුප් වැඩිවීම තුළින් ලැබුණු ප්‍රතිලාභ භුක්ති විඳීමට අවස්ථාව ලැබේ. මෙය 2006.01.01 දිනට පෙර කාලය වෙනුවෙන් හිඟ මුදල් හිමිකමකින් තොරව මෙම වැඩිවීමෙන් සියයට 50 ක් 2006 ජනවාරි 01 දා සිට ද 2007 ජනවාරි 01 වනදා සිට ඉතිරි සියයට 50 ද ලබා දීමට කටයුතු කරනු ඇත.

(ඈ) විවාහවීමට කැමති වැන්දඹුවන්ට, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් පෑමට හැකිවන පරිදි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතට අවශ්‍ය සංශෝධන පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත.

රුපියල් මිලියන 4,500 ක් අමතර ප්‍රතිපාදන මෙම විශ්‍රාම වැටුප් සංශෝධන යෝජනාව සඳහා වෙන් කෙරෙනු ඇත.

## 63. අපරාධ මර්ධනය

පසුගිය මාස 18 ක කාලය තුළදී සාහසික අපරාධ අඩුවීමේ සැලකිය යුතු ප්‍රවණතාවයක් දක්නට ඇත. බස්නාහිර පළාතේ නීති විරෝධී මත්පැන් මැඩලීම සඳහා පොලිසිය විසින් අනුගමනය කළ තියුණු වැටලීම් මගින් රජයේ ආදායම් ඉහළ නැංවීමට ද දායකත්වය සපයන ලදී. රජයේ අපරාධ වැළැක්වීමේ වැඩ සටහනේ ඉලක්කය වන්නේ අපගේ නගර, වීදි සහ අප අවට ප්‍රදේශ අපට ජීවත්විය හැකි සුරක්ෂිත ප්‍රදේශ බවට පත් කිරීමයි. මේ තුළින් ආයෝජන හිතකාමී පරිසරයක් ද වර්ධනය වනු ඇත. අළුතෙන් රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට මෙම වැඩ සටහන යටතේ වගකීම් පැවරීමෙන් මහජන සම්බන්ධතා පොලිස් සේවය ප්‍රවර්ධනය කරනු ලැබේ. වාණිජ මධ්‍යස්ථාන ආශ්‍රිතව නවීන සන්නිවේදන උපකරණ සහ ජංගම නිරීක්ෂණ පහසුකම්වලින් සමන්විත නව පොලිස් ස්ථාන පිහිටුවනු ලැබේ. පුත්තලම, කොළඹ මුහුදු තීරයේ සිදුවන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා සමුද්‍ර ආවේක්ෂණ යාන්ත්‍රණයක් යොදවනු ලබන අතර, විද්‍යුත් ආවේක්ෂණ පද්ධතියක් කොළඹ පිහිටුවනු ලැබේ. එසේම වාණිජ සයිබර් ආපරාධ මැඩලීමට ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු පරීක්ෂා කිරීමේ පද්ධතියක් සවිකිරීමට ද යෝජනා කෙරේ. එම නිසා මෙම ව්‍යාපෘති සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට 2006 වර්ෂයේදී රුපියල් මිලියන 900 ක විශේෂ වෙන් කිරීමක් සිදුකරනු ඇත.

## 64. ඒකාබද්ධ ආපදා අවදානම් කළමනාකරණ වැඩ සටහන

සුනාමි ව්‍යවසනයත් සමඟ මෑතකදී ලබාගත් අත්දැකීම් අනුව ඒකාබද්ධ ආපදා කළමනාකරණ උපාය ක්‍රමයක් අත්‍යාවශ්‍ය වී තිබේ. පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ද මෙවැනි වැඩ සටහනක ඇති වැදගත්කම පෙන්වා දී ඇත. එම නිසා, අනෙකුත් අදාළ ආයතනවල සහයෝගය ඇතුව ඒකාබද්ධ ආපදා කළමනාකරණ වැඩ සටහනක් සංවිධානය කිරීම සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවට රුපියල් මිලියන 200 ක් වෙන් කරනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සැලකිය යුතු අරමුදලක් අවශ්‍ය හෙයින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන හරහා මේ සඳහා ආධාර ඉල්ලා තිබේ. ගංවතුර, නියඟ, නායයාම් සහ අකුණු සැර වැනි කාලගුණය හා සම්බන්ධිත ස්වාභාවික විපත් ශ්‍රී ලංකාවේ ඉහළ යමින් තිබේ. වර්තමානයේ කාලගුණ විද්‍යා නිරීක්ෂණ රේඩාර් පද්ධතියක් අප සතුව නොමැත. මේ කාර්යය වෙනුවෙන් රුපියල් මිලියන 400 ක් වෙන් කිරීමට යෝජනා කෙරේ.

## 65. රාජ්‍ය අරමුදල් කළමනාකරණය

අමාත්‍යාංශ සහ රජයේ ආයතන බොහොමයක් සමෘද්ධි සහන ආරක්ෂණ අරමුදල, විදේශ රැකියා අරමුදල වැනි විශේෂිත වූ අරමුදල් පවත්වා ගෙන යනු ලැබේ. මෙම අරමුදල් පිහිටුවීමේදී ඒවා විසින් කළ යුතු ලෙස දක්වා ඇති විශේෂිත වූ සංවර්ධන කාර්යයන් සඳහා පමණක් යෙදවීමටත් එම කටයුතු කාර්යක්ෂම අධීක්ෂණය කිරීමටත්, අදාල රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරයා අදාළ ආයතන ප්‍රධානියා, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ නියෝජිතයින්, අනිකුත් වෘත්තිකයන් සහ සිවිල් සමාජයේ නියෝජිතයින් ඇතුළත් කමිටු පත් කරනු ඇත. මෙම අරමුදල්වල මුදල් නිදහස් කිරීම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් අනුමත කරන මාර්ග උපදේශවලට අනුව එකී කමිටුවල අධීක්ෂණය යටතේ පමණක් සිදු කෙරෙනු ඇත.

## 66. අග්‍රහාර රක්ෂණ භාරය (AIT)

රාජ්‍ය සේවකයින් සහ විශ්‍රාමිකයින් සඳහා වූ සෞඛ්‍යමය රක්ෂණ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම සඳහා රක්ෂණ භාරයක් පිහිටුවනු ඇත. මෙම අරමුදල වාහන සහ වාණිජ රක්ෂණ ක්‍රමවල නොයොදනු ඇත.

... ...

වගුව 1

<u>රජයේ සේවකයින් සඳහා 2006 අය වැය මගින් යෝජිත වැටුප් ව්‍යුහය</u>

රජයේ සේවකයෙකු සඳහා දැනට මසකට ගෙවනු ලබන අවම මූලික වැටුප රුපියල් 7,150 ක් වන අතර, රුපියල් 2,200 ක අන්තර් දීමනාව ද ඇතුළුව එය රුපියල් 9,350 ක් වේ

2005 අය වැය යෝජනා සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2004 අනුව යෝජිත වැටුප් වැඩිවීම සමඟ 2006.01.01 දිනට ලැබීමට යෝජිත වැටුප් වැඩිවීම ද ඇතුළත්ව රාජ්‍ය සේවයේ අවම වැටුප රුපියල් 7,900 ක් වනු ඇත. (අන්තර් දීමනා ද ඇතුළුව රුපියල් 10,100 ක් වීමට නියමිත විය.

මෙම අය වැයෙහි ඇතුළත් කර ඇති පරිපාලනය සඳහ වූ ජාතික සභාවේ යෝජනා අනුව අන්තර් දීමනා ද ඇතුළත් රාජ්‍ය සේවකයින්ගේ අවම මූලික මාසික වැටුප රුපියල් 11,630 ක් දක්වා වැඩි කරනු ඇත. ඒ අනුව අවම මාසික වැටුප රුපියල් 2,280 කින් වැඩි වන අතර, එයින් සියයට 50 ක් 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවන අතර, 2007.01.01 දින සිට ඉතිරි සියයට 50 ගෙවෙනු ලැබේ. එනම් රාජ්‍ය සේවකයෙකුගේ අවම මාසික වැටුප 2006.01.01 දින සිට රුපියල් 10,490 ක් වන අතර, 2007.01.01 දින සිට එය රුපියල් 11,630 ක් වනු ඇත.

| රාජ්‍ය අංශයේ වැටුප් මට්ටම් | | 2005 අයවැය අනුව 2005.12.01 දිනට ආරම්භක වැටුප හා දීමනා | | | 2005 අයවැය අනුව 2006.01.01 දිනට නියමිත වැටුප හා දීමනා | | | 2006 අයවැය අනුව 2006.01.01 ට වැටුප් පරිමාණයන් | 2007.01.01 දිනට යෝජිත වැටුප් පරිමාණයන් | දෙවර්ෂය තුළ මාසික වැඩිවීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැටුප | දීමනා | එකතුව | වැටුප | දීමනා | එකතුව | | | |
| මූලික | | | | | | | | | | |
| (උදා.කම්කරු ශ්‍රේණි) | III | 7150 | 2200 | 9350 | 7900 | 2200 | 10100 | 10490 | 11630 | 2280 |
| | II | 7390 | 2200 | 9590 | 8140 | 2200 | 10340 | 11165 | 12740 | 4600 |
| | I | 7515 | 2200 | 9715 | 8265 | 2200 | 10465 | 11783 | 13850 | 4135 |
| ද්විතීය (උදා.කළමනාකරණ සහකාර සේවය) | III | 8290 | 2200 | 10490 | 9040 | 2200 | 11240 | 12005 | 13520 | 3030 |
| | II | 9060 | 2200 | 11260 | 9810 | 2200 | 12010 | 13060 | 14860 | 3600 |
| | I | 9775 | 2200 | 11975 | 10525 | 2253 | 12778 | 13348 | 16470 | 4475 |
| අධි ශ්‍රේණිය | | 11260 | 2326 | 13586 | 12265 | 2427 | 14692 | 16088 | 18590 | 5004 |
| විධායක මට්ටම | II/II | 11875 | 2388 | 14263 | 13125 | 2513 | 15638 | 17471 | 20680 | 6418 |
| (දීප ව්‍යාප්ත සේවා) | II/I | 15354 | 2735 | 18089 | 17915 | 2992 | 20187 | 22080 | 26070 | 7981 |
| | I | 19752 | 3175 | 22927 | 23045 | 3505 | 26550 | 27787 | 32650 | 9723 |
| ජ්‍යෙෂ්ඨ විධායක (උදා.අතිරේක ලේකම්) | | 24684 | 3668 | 28352 | 28800 | 4080 | 32880 | 33706 | 39060 | 10708 |

වගුව 02

## ආදායම් යෝජනා

| | රුපියල් මිලියන |
|---|---|
| සාමූහික බදු | 2,700 |
| සමාජ වගකීම් බද්ද | 1,000 |
| පැවරුම් මිලකරණය සහ පටු ප්‍රාග්ධනය | 550 |
| ඇතැම් නිර්වාසිකයන්ගේ බදුකරණය | 150 |
| පුද්ගල අංශයේ බදු | 450 |
| මුද්දර බදු | 3,700 |
| ආර්ථික සේවා ගාස්තුව | 1,000 |
| ඔට්ටු හා සූදු බදු | 300 |
| මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද | 2,700 |
| එකතු කල අගය මත වු බදු අනුපාතවල වෙනස්කම් | 2,000 |
| එකතු කල අගය මත බද්ද ගෙවීමේ දිනය ඉදිරියට ගැනීම | 1,500 |
| පොළී ආදායම මත බදු | - |
| රේගු බදු සහ සෙස් බදු | 3,500 |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද | 2,500 |
| නිෂ්පාදන බදු | 4,700 |
| බදු පරිපාලනය | 1,750 |

වගුව 03

## වැය යෝජනා

| | රු. මිලියන |
|---|---|
| ආගමික සංවර්ධනය | 200 |
| කලාව සහ සංස්කෘතිය | 50 |
| මාධ්‍යවේදීන් සඳහා දිරි ගැන්වීම් | 75 |
| මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන | 1,500 |
| ළමා,ආබාධිත හා වැඩිහිටි නිවාස සඳහා සහන | 200 |
| ගුණාත්මක සෞඛ්‍ය සේවාව | 300 |
| සමෘද්ධිය හරහා ජීවන තත්ත්වය සංවර්ධනය | 6,000 |
| යොවුන් දිරිය | 1,000 |
| වතු යටිතල පහසුකම් සංවර්ධනය | 2,000 |
| නාගරික නිවාස සංවර්ධනය | 500 |
| කෘෂිකර්මය | |
| • පොහොර | 2,300 |
| • බීජ | 300 |
| • වී අලෙවි මණ්ඩලය (චක්‍රීය අරමුදල ) | 2,000 |
| • විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදන කලාප | 160 |
| • කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම | 415 |
| වැවිලි කෘෂිකර්මාන්තය | |
| • ස්ථායිකරණ අරමුදල | 1,600 |
| • වෙනත් | 700 |
| මහවැලි ආර්ථිකය | 200 |
| ධීවර අංශයේ සංවර්ධනය | 1,350 |
| රෙදිපිළි සැකසුම් කර්මාන්තය | 350 |
| රෙදිපිළි හා ඇඟළුම් විද්‍යායතනය | 250 |
| කාන්තා දිරිය - තෑගි භාණ්ඩ සහ අත්යන්ත්‍ර රෙදිපිළි | 75 |
| ඉහළ ආදායම් තලයේ සංචාරක කටයුතු | 100 |
| පෞද්ගලික බස් ව්‍යාපාරය | 75 |
| ගම නැග්ම | 1,000 |
| ඉදිකිරීම් කර්මාන්තය නවීකරණය | 200 |
| නව සොයා ගැනීම් සහ පර්යේෂණ | 300 |
| අන්තර් ජාතික සම්බන්ධතා සහ ක්‍රමෝපාය සඳහා වූ ආයතනය | 75 |
| කම්කරු සබඳතා ඇකඩමිය | 50 |
| බදු ඇකඩමිය | 50 |
| රාජ්‍ය අංශයේ වැටුප් | 9,600 |
| විශ්‍රාම වැටුප් ගැලපීම් | 4,500 |
| අපරාධ වැළැක්වීම-පොලිස් දෙපාර්තමේන්තුව | 900 |
| ආපදා අවදානම් කළමනාකරණය වැඩ සටහන | 600 |

ඇමුණුම II

2006 අයවැය සාරාංශය

| | 2004 | 2005 අයවැය ඇස්තමේන්තුව | 2005 සංශෝධිත | 2006 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|---|
| මුළු ආදායම | 311,473 | 389,492 | 385,722 | 483,876 |
| බදු ආදායම | 281,552 | 351,119 | 345,387 | 435,292 |

| | | | | |
|---|---|---|---|---|
| ආදායම් බදු | 41,372 | 55,361 | 55,911 | 75,260 |
| භාණ්ඩ හා සේවා මත බදු | 191,525 | 229,515 | 224,692 | 279,494 |
| විදේශ වෙළදාම මත බදු | 48,655 | 66,243 | 64,784 | 80,238 |
| බදු නොවන ආදායම් | 29,921 | 38,373 | 40,335 | 49,084 |
| | | | | |
| මුළු වියදම (පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව) | **476,905** | **560,638** | **554,269** | **681,642** |
| පුනරාවර්තන | 389,679 | 418,988 | 437,280 | 506,856 |
| වැටුප් හා වේතන | 106,187 | 140,517 | 140,517 | 168,570 |
| පොලී | 119,782 | 128,001 | 119,409 | 151,259 |
| සහනාධාර හා පැවරුම් | 105,367 | 91,534 | 115,379 | 117,238 |
| අනෙකුත් භාණ්ඩ හා සේවා | 58,343 | 58,936 | 61,975 | 69,789 |
| රාජ්‍ය ආයෝජන | 97,630 | 144,440 | 118,879 | 178,295 |
| වෙනත් | (10,404) | (2,790) | (1,890) | (3,510) |
| - | - | - | - | - |
| ආදායම් අතිරික්තය/හිගය (-) | (78,206) | (29,496) | (51,558) | (22,980) |
| අයවැය හිගය | (165,432) | (171,146) | (168,547) | (197,266) |
| - | - | - | - | - |
| මුළු මුල්‍ය සම්පාදනය | 165,432 | 171,145 | 168,547 | 197,266 |
| මුළු විදේශ මුල්‍ය සම්පාදනය | 45,752 | 58,884 | 52,463 | 76,784 |
| ශුද්ධ විදේශ ණයට ගැණුම් | 37,071 | 48,684 | 45,063 | 66,384 |
| විදේශ ණය ගැනීම් | 70,112 | 91,000 | 66,379 | 118,574 |
| ණය ආපසු ගෙවීම් | 33,041 | 42,316 | 21,316 | 52,190 |
| විදේශ ප්‍රදාන | 8,681 | 10,200 | 7,400 | 10,400 |
| මුළු දේශීය මුල්‍ය සම්පාදනය | 117,243 | 104,761 | 115,259 | 120,483 |
| බැංකු නොවන ණය ගැනීම් | 69,274 | 104,761 | 108,584 | 120,483 |
| බැංකු වලින් ණය ගැනීම් | 43,289 | | | |
| වෙනත් | 4,680 | | | |
| | | | | |
| ප්‍රාග්ධන ආදායම් | 2,437 | 7,500 | 825 | |
| ආදායම්/ද.දේ.නි. (%) | 15.3 | 17.1 | 16.4 | 17.8 |
| බදු/ද.දේ.නි. (%) | 13.9 | 15.4 | 14.7 | 16.0 |
| බදු නොවන /ද.දේ.නි. (%) | 1.5 | 1.7 | 1.7 | 1.8 |
| වියදම /ද.දේ.නි. (%) | 23.5 | 24.6 | 23.5 | 25.1 |
| ප්‍රනරාවර්තන වියදම් /ද.දේ.නි. (%) | 19.2 | 18.4 | 18.5 | 18.6 |
| රාජ්‍ය ආයෝජන /ද.දේ.නි. (%) | 4.8 | 6.3 | 5.0 | 6.6 |
| ආදායම් ගිණුම (ද.දේ.නි. (%) | (3.9) | (1.3) | (2.2) | (0.8) |
| අයවැය හිගය /ද.දේ.නි. (%) | (8.2) | (7.5) | (7.1) | (7.3) |
| විදේශ ආධාර /ද.දේ.නි. (%) | 2.3 | 2.6 | 2.2 | 2.8 |
| දේශීය මුල්‍ය සම්පාදනය /ද.දේ.නි. (%) | 5.8 | 4.6 | 4.9 | 4.4 |
| බැංකු නොවන මුල්‍ය සම්පාදනය /ද.දේ.නි. (%) | 3.4 | 4.6 | 4.6 | 4.4 |
| බැංකු වලින් මුල්‍ය සම්පාදනය /ද.දේ.නි. (%) | 2.1 | - | - | - |
| | | | | |
| **සටහන : සුනාමිය සම්බන්ධ වියදම්** | | | **32,418** | **50,000** |
| ප්‍රනරාවර්තන වියදම් | | | 16,692 | 3,000 |
| ප්‍රාග්ධන වියදම් | | | 15,726 | 47,000 |
| | | | | |
| **මුල්‍ය සම්පාදනය** | | | **32,418** | **50,000** |
| විදේශ ප්‍රදාන | | | 21,592 | 31,840 |
| විදේශ ණය ගැණුම් | | | 3,826 | 15,600 |
| දේශීය මුල්‍ය සම්පාදනය | | | 7,000 | 2,560 |
| | | | | |
| **සුනාමි වැය/ද.දේ.නි. (%)** | | | 1.4 | 1.8 |
| **පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ වියදම් සමඟ රාජ්‍ය ආයෝජන ප්‍රතිසංස්කරණ වියදම් / ද.දේ.නි. (%)** | | | 5.7 | 8.3 |
| **පශ්චාත් සුනාමි වියදම් සමඟ අයවැය හිගය/ද.දේ.නි.(%)** | | | 8.5 | 9.1 |

ඇමුණුම III

## අපේක්ෂිත මුළු විදේශ ආධාර-2006
## ප්‍රදානකරුවන් සහ අංශයන්

ඇ.ඩො.මි.

| ප්‍රදානකරුවන් සහ අංශයන් | නිවාස හා නගර ඉදිකිරීම් | මාර්ග සහ පාලම් | ජලය හා සනීපාරක්ෂණය | වරාය සංවර්ධනය | ග්‍රාමීය සංවර්ධනය | අධ්‍යාපනය | සෞඛ්‍ය | කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග | ධීවර | පෞද්ගලික අංශය සංවර්ධනය | විදුලිබල හා බලශක්ති | සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායක හා ජීවන ආධාර | ප්‍රවාහන | පාරිසරික | ආපදා කළමනාකරණය | වැවිලි කාර්මාන්ත | තොරතුරු තාක්ෂණය | ආයතනික සහයෝගය | සංචාරක | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 6.5 | 65.4 | 29 | 3 | 46.1 | 23 | | 4 | 39 | | 16 | 48 | | 11 | | 7 | | 5.3 | | 2 | 305 |
| ලෝක බැංකුව | 53.6 | 32 | 9 | | 10.2 | 6 | 12 | | | | 25 | 14.8 | | | | | 14 | 5.9 | | 7.2 | 190 |
| ජපානය | 9 | 93.5 | 68.5 | 14 | | 11 | 8 | 19.5 | 6.8 | | 81.5 | 24.5 | | 9 | | 1 | 2.9 | | 1 | 2.8 | 354 |
| චීනය | | | | | | | | | 12 | | 12 | | | | | | | | | | 24 |
| කොරියාව | 4.5 | 12 | 8 | | | 1 | | | | | | | | | | | | | | | 25.5 |
| ඩෙන්මාර්කය | | | 39 | 17 | | | | | | | | | | | | | | | | | 56 |
| පින්ලන්තය | | | | | | | | | | | 30 | | | | | | | | | | 30 |
| ජර්මනිය | 7 | | 27 | | | | | | | 30 | 11 | 4 | | | | | | | | 5 | 84 |
| ඉන්දියාව | | 1 | | | | | 3 | | | | | | 35 | | | | | | | 23.8 | 62.8 |
| ඔස්ට්‍රියාව | | 10 | | | | | | | | | | | | | | | | | | | 10 |
| ඕස්ට්‍රේලියාව | | | 24 | | | | | | | | | | | | | | | | | | 24 |
| සෞදි අරමුදල | | 9.9 | | | | | 10 | | | | | | | | | | | | | | 19.9 |
| කුවේටය | 5 | 3 | | | | 8 | | 0.7 | | | | | | | | | | | | | 16.7 |
| නෝර්වේ | | | 4.9 | | | | | | 4 | | | 9 | | | | | | | | 0.3 | 18.2 |
| යුරෝපා ආයෝජන බැංකුව | | | | | | | | | | | | 20 | | | | | | | | | 20 |
| ප්‍රංශය | 6 | 11 | 2 | | | | | | | | 1.5 | 0.6 | | | 1 | | | | | | 22.1 |
| නෙදර්ලන්තය | | | | | | | | | 4 | | | | | | | | | | | | 4 |
| අයිස්ලන්තය | | | | | | | | | 1 | | | | | | | | | | | 1 | 2 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 0.2 | 5 | 1 | | | 3 | | | 2 | | | 3 | | 0.1 | | | | | | 5 | 19.3 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය | | | | | 1 | | | | | | 1 | | | 1 | 1 | | | | | | 4 |

| ප්‍රදානකරුවන් සහ අංශයන් | නිවාස හා නගර ඉදිකිරීම් | මාර්ග සහ පාලම් | ජලය හා සනීපාරක්ෂණය | වරාය සංවර්ධනය | ග්‍රාමීය සංවර්ධනය | අධ්‍යාපනය | සෞඛ්‍ය | කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග | ධීවර | පෞද්ගලික අංශය සංවර්ධනය | විදුලිබල හා බලශක්ති | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක හා ජීවන ආධාර | ප්‍රවාහන | පාරිසරික | ආපදා කළමනාකරණය | වැවිලි කාර්මාන්ත | තොරතුරු තාක්ෂණය | ආයතනික සහයෝගය | සංචාරක | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එක්සත් රාජධානිය | | 6 | | | | | | | | | | | | | | | | | | | 6 |
| ලෝක ආහාර වැඩපිළිවෙල | | | | | | | | 23.2 | | | | | | | | | | | | | 23.2 |
| ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | | | | | | | | 1 | 7 | | | | | | | | | | | | 8 |
| ස්වීට්ස්සර්ලන්තය | 3 | | | | | 1 | | | | | | | | | | | | | | | 4 |
| ස්පාඤ්ඤය | | 5 | 2 | | | | 2 | | | | | | | | | | | | | | 9 |
| ස්වීඩනය | | 6 | 12 | | | | | | | | 7 | 1 | | | | 2 | | | | | 28 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | | | | | 4 | | | | | | | 3.8 | | | | | | | | | 7.8 |
| යුනිසෙෆ් | | | 11 | | | 9 | 12.5 | | | | | | | | | | | | | 6.1 | 38.6 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | | | | | | 0.1 | 4.1 | | | | | | | | | | | | | 0.11 | 4.31 |
| යුනෙස්කෝ | | | | | | | | | | | | | | | 1 | | | | | | 1 |
| යුරෝපීය සංගමය | | 10 | | | | | | | | | | 6.5 | | | | | | | | | 16.5 |
| **අපේක්ෂිත මුළු ආධාර ලැබීම්** | 94.8 | 269.8 | 237 | 34 | 61.3 | 62.1 | 51.6 | 48.4 | 76 | 30 | 185 | 135.2 | 35 | 21 | 3 | 10 | 16.9 | 11.2 | 1 | 53.31 | 1438 |
| **මුළු දායකත්වය** | **410** | **1253** | **864** | **328** | **349** | **353** | **166** | **219** | **190** | **26** | **1061.4** | **535.5** | **100** | **119** | **3** | **87** | **115** | **84.4** | **22** | **186.8** | **6472** |

උතුරු-නැගෙනහිර සංවර්ධන ව්‍යාපෘති

## උතුරු නැගෙනහිර සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අපේක්ෂිත ආධාර ලැබීම් (පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ හැර) ප්‍රදානකරුවන් සහ අංශයන්-2006

ඇ.ඩො. මිලියන.

| ප්‍රදානකරු | නිවාස හා නගර ඉදිකිරීම් | මාර්ග සහ පාලම් | ජල සම්පාදන හා සනීපාරක්ෂණය | සෞඛ්‍ය | පුනරුත්ථාපනය සහ ග්‍රාමීය සංවර්ධනය | අධ්‍යාපනය | ධීවර | කෘෂිකර්මාන්තය | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ජීවන ආධාර | විදුලිබල හා බලශක්ති | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | | | 3.5 | | 42.1 | | 12.7 | | 6.5 | | 64.8 |
| ලෝක බැංකුව | 23.6 | | 5.0 | | | | | | 14.0 | | 42.6 |
| ජපානය | | 15.5 | | 3.0 | | | | 3.0 | 0.5 | 3.3 | 25.3 |
| ඕස්ට්‍රේලියාව | | | 5.0 | | | | | | | | 5.0 |
| ලෝක ආහාර වැඩපිළිවෙල | | | | | 25.0 | | | | | | 25.0 |
| සෞදි අරමුදල | | 5.4 | | | | | | | | | 5.4 |
| කොරියාව | | | | | | 1.0 | | | | | 1.0 |
| ආහාර හා කෘෂිකාර්මික සංවිධානය | | | | | | | | 0.7 | | | 0.7 |
| නෝර්වේ | | | 4.9 | | | | | | 9.0 | | 13.9 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය | | | | | 2.0 | | | | | | 2.0 |
| එක්සත් රාජධානිය | | 6 | | | | | | | | | 6.0 |
| **අපේක්ෂිත මුළු ආධාර ලැබීම්** | 23.6 | 11.4 | 18.4 | 3.0 | 69.1 | 1.0 | 12.7 | 0.7 | 30.0 | 3.3 | 191.7 |
| **මුළු දායකත්වය ( 2004-2008)** | 75 | 36 | 103.9 | 3 | 252 | 2.3 | 29 | 66.4 | 40 | 11.9 | 619.5 |

# සුනාමි සම්බන්ධ ආධාර දීමනා

## සුනාමි සම්බන්ධ විදේශාධාර වලින් මූල්‍යනය වන ව්‍යාපෘති-මූල්‍ය ගෙවීම්-2006
## ප්‍රදානකරුවන් සහ අංශයන්

ඇ.ඩො. මිලියන

| ප්‍රදානකරු | නිවාස හා නාගරික | මාර්ග හා පාලම් | ජලය හා සනීපාරක්ෂක | අධ්‍යාපනය | සෞඛ්‍ය | කෘෂිකර්මාන්තය | ධීවර | විදුලි බල හා බලශක්ති | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ජීවනාධාර | පාරිසරික | ආපදා කළමනාකරණය | අනෙකුත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 2.5 | 20 | 2.5 | | | | 4 | | 10 | | | 2 | 41.0 |
| ලෝක බැංකුව | 30 | 15 | | | 4 | | | | | | | | 49.0 |
| ජපානය | 9 | 28 | 13.5 | 11 | | 1.5 | 6.8 | 18.2 | 10 | | | 3.8 | 101.8 |
| චීනය | | | | | | | 12 | | | | | | 12.0 |
| ඉන්දියාව | | 1 | | | 3 | | | | | | | 2 | 6.0 |
| කොරියාව | 4 | 6 | | | | | | | | | | | 10.0 |
| ඩෙන්මාර්කය | | | 3 | | | | | | | | | | 3.0 |
| ප්‍රංශය | 6 | 12 | 2 | | | | | 1.5 | 0.6 | | 1 | | 23.1 |
| ජර්මනිය | 7 | | 10 | | | | | | | | | 5 | 22.0 |
| ස්විස්ටර්ලන්තය | 3 | | | 1 | | | | | | | | | 4.0 |
| ස්පාඤ්ඤය | | 5 | 2 | | 2 | | | | | | | | 9.0 |
| කුවේටය | 5 | | | 8 | | | | | | | | | 13.0 |
| නෙදර්ලන්තය | | | | | | | 4 | | | | | | 4.0 |
| ස්වීඩනය | | 6 | | | | | | | | | | | 6.0 |
| අයිස්ලන්තය | | | | | | | 1 | | | | | 1 | 2.0 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 0.2 | 5 | 1 | 3 | | | 2 | | 3 | 0.1 | | 5 | 19.3 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය | | | | | | | | 1 | | 1 | 1 | | 3.0 |
| ලෝක ආහාර සංවිධානය | | | | | | 1 | 7 | | | | | | 8.0 |
| යුනිසෙෆ් | | | 11 | 9 | 7.5 | | | | | | | 5.3 | 32.8 |
| එක්සත් ජාතීන්ගේ ජනගමන අරමුදල | | | | | 3 | | | | | | | | 3.0 |
| යුනෙස්කෝ | | | | | | | | | | | 1 | | 1.0 |
| යුරෝපා සංගමය | | 10 | | | | | | | | | | | 10.0 |
| යුරෝපා ආයෝජන බැංකුව | | | | | | | | | 20 | | | | 20.0 |
| **එකතුව** | **66.7** | **108** | **45** | **32** | **19.5** | **2.5** | **36.8** | **20.7** | **43.6** | **1.1** | **3** | **23.1** | **403.0** |
| මුළු දායකත්වය (2005-2008) | 209.3 | 261.2 | 91.4 | 123.2 | 60.1 | 3.1 | 97.0 | 325.5 | 166.6 | 1.1 | 3.0 | 162.8 | **1504** |
| මුළු පොරොන්දු වටිනාකම(2005- 2008) | 217.6 | 284.5 | 154.4 | 123.2 | 157.2 | 3.1 | 97 | 325.9 | 256.6 | 1.1 | 3 | 180 | **2218.3** |

## උතුරු-නැගෙනහිර සහ පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණය හැරුනුකොට, විදේශ ආධාර මගින් මුල්‍යනය වන අනෙකුත් ව්‍යාපෘති සලකා වාර්ෂික ආධාර ලැබීම්, ප්‍රදානකරුවන් සහ අංශයන්- 2006

| ප්‍රදානකරු | නිවාස හා නගර ඉදිකිරීම් | මාර්ග සහ පාලම් | ජලය හා සනීපාරක්ෂණය | වරාය සංවර්ධනය | ග්‍රාමීය සංවර්ධනය | අධ්‍යාපනය | සෞඛ්‍ය | කෘෂිකර්මාන්තය හා වාරිමාර්ග | ධීවර | පෞද්ගලික අංශය සංවර්ධනය | විදුලිබල හා බලශක්ති | වර්ධන ව්‍යවසායක හා ජීවන ආධාර | ප්‍රවාහන | පාරිසරික | ආපදා කළමනාකරණය | වැවිලි කාර්මාන්ත | තොරතුරු තාක්ෂණය | ආයතනික සහයෝගය | සංචාරක | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 4 | 45.4 | 23 | 3 | 4 | 23 | | 4 | 22 | | 16 | 31.5 | | 11 | | 7 | | | 5.3 | | 198.9 |
| ලෝක බැංකුව | | 17 | 4 | | 10 | 6 | 8 | | | | 25 | 0.8 | | | | | | 14 | 5.9 | 7 | 98.1 |
| ජපානය | | 50 | 55 | 14 | | | 5 | 15 | | | 60 | 14 | | 9 | | 1 | 1 | 2.9 | | | 226.9 |
| චීනය | | | | | | | | | | | 12 | | | | | | | | | | 12 |
| කොරියාව | 0.5 | 6 | 8 | | | | | | | | | | | | | | | | | | 14.5 |
| ඩෙන්මාර්කය | | | 36 | 17 | | | | | | | | | | | | | | | | | 53 |
| පින්ලන්තය | | | | | | | | | | | 30 | | | | | | | | | | 30 |
| ජර්මනිය | | | 17 | | | | | | | 30 | 11 | 4 | | | | | | | | | 62 |
| ඉන්දියාව | | | | | | | | | | | | | 35 | | | | | | | 22 | 56.8 |
| ඔස්ට්‍රියාව | | 10 | | | | | | | | | | | | | | | | | | | 10 |
| ඕස්ට්‍රේලියාව | | | 19 | | | | | | | | | | | | | | | | | | 19 |
| සෞදි අරමුදල | | 4.5 | | | | | 10 | | | | | | | | | | | | | | 14.5 |
| කුවේටය | | 3 | | | | | | 0.7 | | | | | | | | | | | | | 3.7 |
| නෝර්වේ | | | | | | | | | 4 | | | | | | | | | | | 0 | 4.3 |
| ස්වීඩනය | | | 12 | | | | | | | | 7 | 1 | | | | 2 | | | | | 22 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල | | | | | 2 | | | | | | | 3.8 | | | | | | | | | 5.6 |
| යුනිසෙෆ් | | | | | | | 5 | | | | | | | | | | | | | | 5 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | | | | | | 0.1 | 1.1 | | | | | | | | | | | | | 0 | 1.26 |
| යුරෝපා සංගමය | | | | | | | | | | | | 6.5 | | | | | | | | | 6.5 |
| **2006 වසරේ විදේශ ආධාර ව්‍යාපෘති සඳහා අපේක්ෂිත වැය වෙන් කිරීම (උතුරු-නැගෙනහිර හැර)** | 4.5 | 136 | 174 | 34 | 16 | 29 | 29 | 20 | 26 | 30 | 161 | 61.6 | 35 | 20 | 3 | 10 | 1 | 17 | 11.2 | 27 | 844.1 |
| **මුළු දායකත්වය (2004-2008)** | 126 | 956 | 669 | 328 | 97 | 227 | 103 | 149 | 64 | 26 | 724 | 328.9 | 100 | 118 | 3 | 87 | 22 | 115 | 84.4 | 21 | **4348** |

ඇමුණුම IV

## දළ ණය ගැනීමේ අවශ්‍යතාවය - 2006

| | රු. බිලියන |
|---|---|
| රජයේ ණය ගැනීම් හැර මුළු ලැබීම් | 519 |
| පොළී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම් ඇතුළත් මුළු ගෙවීම් | 1065 |
| රජයේ ගිණුමේ සඳහන් මුළු දළ ණය ගැනීම් | 546 |
| මුළු ණය ආපසු ගෙවීම් | 308 |